# දහම්ගුරු ප්‍රථම විභාගය අත්පොත



ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

# පළමුවන පාඩම

## 1. ශුද්ධ වූ දේශයේ භූගෝලීය පිහිටීම සහ ඉතිහාසය:-

### 1.1. ශුද්ධ වූ දේශයට භාවිතා කරන නම්:

කානාන්; පලස්තීනය; ඊශ්‍රායෙල් දේශය; පොරොන්දු දේශය; ශුද්ධ වූ දේශය

**(අ) කානාන්**

දම්පාට ලොම් රෙදි නිපදවන රට යන්න එහි අරුත ය. මෙය පුරාණතම නාමයයි. මුල් කාලයේ දී මෙම නම පිනිශියාවේ මුහුදුකරයට පමණක් භාවිතා කළ නමුත් පසුව ජෝර්දාන ගඟෙන් බටහිර ප්‍රදේශයට භාවිතා කළහ. මෙම ප්‍රදේශ නම්, සිරියාවටත් ඊජිප්තුවටත් අතර ඊශ්‍රායෙල්වරු වාසය කළ ප්‍රදේශයය. සිදොන් තොටුපළ අසල මුහුදේ වාසය කළ බෙල්ලන් වර්ගයක් විය. ඔවුන්ගේ බෙලි කටුවලින් දම්පාට සායම් වර්ගයක් නිපදවන ලදී. එරට බැටළුවන්ගේ ලොම් මේ සායම් වලින් පාට කර දම්පාට රෙදි නිපදවීම නිසා මේ නම ලැබුණි. මෝසෙස් ඔත්තුකාරයන් යැව්වේ ද මේ රටට ය.

නෝවාගේ පුතුන් තිදෙනාගෙන් පැවතෙන කාන් නමැත්තා පදිංචිව සිටි ප්‍රදේශය නිසා කානාන් යනුවෙන් නම් කළ බව ජන ප්‍රවාදයේ පවතී. මෙසපොතේමියාවේ සිට ඊජිප්තුවට ගිය ආදි පිතෘ ආබ්‍රහම් තුමා පදිංචි වූයේ මේ ප්‍රදේශයේ ය.

**(ආ) පලස්තීනය**

පලස්තීනය යනු පිලිස්තිවරුන්ගේ රට යන අර්ථයයි. මේ නම භාවිතා කළේ රෝමවරුන් ය. ජුදෙව්වරුන් කිසි දින මෙම නම භාවිතා කළේ නැත. පිලිස්තිවරු හා ජුදෙව්වරු පරම සතුරන් බැවින් මෙම නම භාවිතා නොකළහ. නමුත් දාවිත් ගොලායත් කථාව බයිබලයේ නිතර සඳහන් වේ. (උත්. 21/34; නික්. 13/17; 1 සාමුවෙල් 6/1, 27/7; 2 රාජා. 8/2)

**(ඇ) ඊශ්‍රායෙල් දේශය**

මෙහි අර්ථය ***දෙවියන් වහන්සේ සමඟ ශක්ති සම්පන්න*** යනුයි. නැතහොත් ***දෙවියන් වහන්සේ ශක්ති සම්පන්න*** යනුයි. ඊශ්‍රායෙල් යනු දෙවියන් වහන්සේ විසින් ජාකොබ්ට දෙන ලද නම් වලින් එකකි. (උත්.32/28) වර්තමානයේදී මේ නම නැවත භාවිතා කළේ පලස්තීනයෙන් ජෝර්දානය වෙන් කර නිදහස ලැබීමෙන් පසු ය. (1948 මැයි 4 වෙනි දිනට පසුය.) ඊශ්‍රායෙල් යන නාමය (1 සාමු.13/19; 2 රාජා.5/2; එසකි. 7/2, 21/17; මතෙව් 2/20-22) සඳහන් වේ.

**(ඈ) පොරොන්දු දේශය**

දෙවියන් වහන්සේ ආබ්‍රහම්ගේ පරම්පරාවට දීමට පොරොන්දු වූ දේශය මෙය බැවින් ඊට "*පොරොන්දු දේශය*" යැයි කියනු ලැබේ.

**(ඉ) ශුද්ධ වූ දේශය**

ක්‍රිස්තුන් වහන්සේගේ උපත, දූත සේවාව, දුක් විඳීම. මරණය සහ උත්ථානය සිදුවූයේ මෙහි නිසා කිතුනුවෝ ඊට "*ශුද්ධ වූ දේශය*" යැයි කියති.

### 1.2. ශුද්ධ වූ දේශයේ භූගෝලීය පිහිටීම සහ ඊශ්‍රායෙල් ජනතාව

**(අ) භූගෝලීය පිහිටීම**

දාන් සිට බෙර්ෂිබා දක්වා විහිදෙන මේ රටේ දිග සැතපුම් 150කි. පළල සැතපුම් 50 සිට 60 දක්වා ය. වර්ග ප්‍රමාණය වර්ග සැතපුම් 10,000කි. ජෝර්දාන් ගඟින් නැගෙනහිරට 4,000ක් වන අතර බටහිරට වර්ග සැතපුම් 6,000කි. වර්තමාන ඊශ්‍රායෙල් රාජ්‍යයේ වර්ග ප්‍රමාණය වර්ග සැතපුම් 8,000කි. ගලීල මුහුදේ දිග සැතපුම් 13ක් ද, පළල සැතපුම් 84ක් ද වේ. එය මධ්‍යධරණී මුහුදේ සිට සැතපුම් 28ක දුරින් පිහිටා ඇත. ඊශ්‍රායෙලය පිහිටා ඇත්තේ අප්‍රිකාවත් ආසියාවත් අතර ය. උතුරින් ලෙබනන් හා සිරියාවෙන් ද නැගෙනහිරින් ජෝර්දානයෙන් ද නිරිත දිගින් ඊජිප්තුවේ සීනයි අර්ධද්වීපයෙන් ද මායිම් වී ඇත. ඊශ්‍රායෙල්වරු තම අසල්වැසි ජාතීන් සතුරන් ලෙස සැලකූ ඊශ්‍රායෙල්වරු මුලින් ම මෙහි පැමිණියේ සංචාරක එඬේරුන් ලෙස ය. ස්ථිර පදිංචියෙන් පසු ඔවුහු ගොවිතැනට හුරු වූහ. ඊශ්‍රායෙලය සාමාන්‍යයෙන් වියළි රටකි. වසරකට දෙවරක් වැසි ලැබේ. නමුත් දෙවියන් වහන්සේ ඊශ්‍රායෙලය හැඳින්වූයේ කිරියෙන් පැණියෙන් උතුරන රට ලෙසටයි.

**(ආ) ඊශ්‍රායෙල් ජනතාව**

මොවුන් හඳුන්වන්නේ ඊශ්‍රායෙල් වරු නමිනි. පිටරටියන් මොවුන්ව හැඳින්වූයේ හේබ්‍රෙව්වරුන් මෙනි. හේතුව මොවුන් හීබෲ භාෂාව කථා කිරීමයි. හීබෲ යන්නේ අර්ථය ***මෙයින් එහා*** යන්නයි. ආබ්‍රහම් වරක් හීබෲවරයකු ලෙස හඳුන්වා ඇත. (උත්.14/13) හීබෲ යන වචනය ඊශ්‍රායෙල් යන වචනයට වඩා පුළුල් අර්ථයක් ඇත. මුලින් මේ නම භාවිතා කළේ මංකොල්ලකරුවන්ට බැවින් පුරාණ ගිවිසුමේ මේ නම භාවිතා නොකරයි. පසුව මේ නම සමහර අර්මේනියානු ගෝත්‍රවලට ද භාවිතා කළහ. මේ ජනතාව මුලින් ම පැමිණියේ මෙසපොතේමියාවට ය. මොවුහු සෙමිතවරු නම් වූහ. භාෂාව ඇරමයික් හා හීබෲ ය. කෙසේ වෙතත් ඊශ්‍රායෙල්වරු ඒකදේව වාදී ජනතාවකි. ඒ නිසා ඔවුන් සෙසු ජාතීන්ට වඩා විශේෂිත විය.

### 1.3. ප්‍රධාන බෙදීම්:

ගලීලය; ජුදයාව; සමාරිය

උතුරේ සිට දකුණු දෙසට දිවෙන පටු බිම් තීරුවක් වන පලස්තීනයේ මධ්‍යධරණී මුහුදත් ජෝර්දාන් නදියත් අතර පිහිටි ප්‍රදේශය පළාත් තුනකට බෙදා ඇත. උතුරු පළාත ගලීලය යනුවෙන් ද මධ්‍යම පළාත සමරියාව යනුවෙන් ද දකුණු පළාත ජුදයාව යනුවෙන් ද හැඳින්වේ. ජෝර්දාන් නදියට නැගෙනහිරෙන් පිහිටි ප්‍රදේශයට "පෙරේයා" යන නම භාවිතා කරයි.

(අ) ගලීලය

කාර්මෙල් කඳුවැටිය හා එසඩ්‍රෙලොන් තැනිතලාව දකුණු මායිම් වශයෙන් ද, ලෙබනන් කඳුවැටිය උතුරු මායිම වශයෙන් ද ඇති ගලීලය මුළු පලස්තීනයෙන් ම ඉතා සාරවත් ප්‍රදේශය වූයේ ය. තිරිඟු, බාර්ලි, මිදි, ඔලිව්, අත්තික්කා සහ වෙනත්
ප්‍රයෝජනවත් වැවිලි වර්ග ඉතා සරු ලෙස මෙම ප්‍රදේශයෙහි වැඩිණි.

ජේසු සමිඳාණන්ගේ ප්‍රසිද්ධ ජීවිතයේ මුල් කොටසෙහි උන්වහන්සේ දේශනා කළ ස්ථානය වූ ගලීලයේ මුහුද හෙවත් ජෙනසරෙත් විල ගිනිකොනෙහි පිහිටා ඇත. මුහුදු මට්ටමෙන් අඩි 700ක් පමණ දිගින් පහත් ය. දිගින් සැතපුම් 13ක් පමණ ය. ගැඹුර අඩි 165 සිට 230 අතර වේ. පුරාණ ගිවිසුමෙහි ගලීල මුහුදට **කීනසෙරත් මුහුද** යන නම ද භාවිතා කළහ (ගණන් කථාව 34/11; 1 මකබි 11/64). නව ගිවිසුමේ ගලීලයේ මුහුදට **ජෙනසරෙත් වැව** කියා ද (මතෙව් 14/34; මාක් 6/53; ලූක් 5/1) **තිබේරියස් මුහුද** කියා ද (ජොහන් 6/1, 21/1) භාවිතා විය. ගලීල මුහුද හා අවට ප්‍රදේශය ජේසුස් වහන්සේගේ ජීවිතය හා බැඳී පවතී.

උදාහරණ;

* පළමු ශ්‍රාවකයන් සතර දෙනා කැඳවීම (මතෙව් 4/18)
* ලාදුරු රෝගියාට සුවය (මතෙව් 8/1)
* මාරුත දමනය (මතෙව් 8/27)
* ශ්‍රාවකයන් දොළොස්දෙනා පත් කිරීම (මාක් 3/13)

සුවිශේෂ සතර තුළ ගලීල මුහුද ගැන 45 වතාවක් සඳහන් වී ඇත.

ජෙනසරෙත් විල් තෙරෙහි පිහිටා තිබුණු ප්‍රධාන නගර නම් තිබේරියස්, බෙත්සයිදාව, මග්දලාව හා කපර්ණාවුම ය. නාසරෙත්, නායිම් හා කානා යනු අභ්‍යන්තරයෙහි පිහිටා තිබූ නගර විය.

පලස්තීනයේ ජනාකීර්ණ ප්‍රදේශය වූයේ ගලීලය ය. ගොවිතැන හෝ මසුන් මැරීම එහි වැසියන්ගේ ප්‍රධාන රැකියාවන් වූයේ ය. මේ නිසා ගලීලයාතු වැසියන් ජුදා නීතිය පිළිබඳ ව වැඩිදුර විස්තර නොදනිති යි කියමින් ජුදයාවේ වැසියෝ ඔවුන් උපහාසයට ලක් කළෝ ය.

පලස්තීනයේ පිහිටි ප්‍රදේශයන් අතුරෙන් ජුදෙව් ජාතියට අයත් නො වූවත් ජීවත් වූ රටවලට ඉතා කිට්ටුවෙන් ම පිහිටි ප්‍රදේශය වූයේ ගලීලය ය. මේ හේතුකොට ගෙන නිතර විදේශීන් හා උරෙතුර ගැටී කටයුතු කිරීමේ අවස්ථාවක් ගලීල වැසියන්ට ලැබිණි. ආගන්තුකයන් විෂයෙහි මිත්‍ර ලීලාවෙන් කටයුතු කිරීමේ හැකියාව මොවුන් සතු වූයේ මේ නිසා යයි කිව හැක. අප සමිඳාණන් තම දූත මෙහෙය හාපුරා කියා ඇරඹීමට අදහස් කළේ ද මෙම ශක්ති සම්පන්න, ත්‍යාගවන්ත ජනතාව මධ්‍යයේ ය.

(ආ) සමාරිය

ගලීලයට දකුණින් ද, ජුදයාවට උතුරින් ද පිහිටි ප්‍රදේශය සමරියාව නම් විය. කඳුකර ප්‍රදේශයක් වුව ද එහි සාරවත් මිටියාවත් කිහිපයක් ම තිබිණි. මෙහි ජීවත් වූ ජනයා චූකලි සුළු ආසියාවෙන් පැමිණි විදේශීන් හා සම්මිශ්‍රණය වූ ජුදා ජාතිකයන්ගෙන් පැවැතෙන්නෝ වූහ. එහෙයින් ඔවුන්ට සමරිතානුවරු යන නම දෙනු ලැබීය. ආගමික කටයුතු වලදී ඔවුන් ජුදා නීතිය පිළිපැදි නමුත්, සමාජ කටයුතු වලදී අනෙක් ජුදෙව්වන් විසින් ඔවුහු කොන් කරනු ලැබූහ. මීට හේතුව ඔවුන් විදේශිකයන්ගෙන් පැවතෙන්නන් වීම ය. නියම ජුදෙව් ජාතිකයෝ සමරිතානුවරුන් පිළිකුල් කළහ. ඔවුන් අපිරිසිදු යයි සිතූහ. ඔවුන් සමඟ ආශ්‍රය නො කළහ. අප සමිඳාණන් සමරිතානුවරුන් කෙරෙහි විශේෂ ලැදියාවක් දැක් වූ බව උන්වහන්සේ ඔවුන්ට කළ ප්‍රශංසාවන්ගෙන් ද උපකාරයන්ගෙන් ද ප්‍රත්‍යක්ෂ වේ.

(ඇ) ජුදෙයාව

පලස්තීනයේ දකුණු භාගයෙහි පිහිටි ජුදෙයාව සුළු කඳුවලින් ගහන ප්‍රදේශයකි. ජුදෙව්වරුන්ගේ ආගමික හා සමාජීය ජීවිතයේ මධ්‍යස්ථානය වූ ජෙරුසලෙම පිහිටියේ මෙම පෙදෙසෙහි ය. මුහුදු මට්ටමෙන් අඩි 2,400ක් පමණ උස් වූ කඳු ගැටයක් මත ගොඩ නඟන ලද දේව මන්දිරයක් ජෙරුසලමේ විය. ජෙරුසලෙම් දේව මන්දිරය යනුවෙන් හැඳින්වුණ මෙම සිද්ධස්ථානය ජුදෙව්වන්ගේ ප්‍රධාන වන්දනා ස්ථානය වූයේ ය. රෝම ආණ්ඩුකාරයාගේ මූලස්ථානය ද මෙම නගරයෙහි ම පිහිටා තිබිණි.

නගරයෙහි වයඹ දිග කොටසෙහි පිහිටා තිබූ මෙම දේව මන්දිරයට විශිෂ්ට ස්ථානයක් හිමිව තිබිණි. පූජනීය ස්ථානය හා ශුද්ධාති ශුද්ධස්ථානය තෙක් දිවෙන පියගැට පෙළින් සැදුම් ලත් අංගනයන්ගෙන් යුත් දේව මන්දිරය තේජස් සම්පන්න පතාක යෝධයකු සේ කැපී පෙනිණි. ආගමික පුද පූජා පවත්වන සමයන්හි දී විශේෂයෙන් පාස්කු මංගලෝත්සවය කාලයේ දී පලස්තීනයේ සැම පෙදෙසෙකින් ම පැමිණි ජුදෙව්වන් ජෙරුසලමේ දේව මන්දිරයට ඒක රාශිගත වූහ.

ජුදෙයාවේ වැසියන් අතරෙන් වැඩි දෙනෙක් බැබිලෝනියාවේ විදේශගතව සිට ආපසු පැමිණියවුන්ගෙන් පැවතෙන්නෝ වූහ. දෙවියන් වහන්සේ විසින් තෝරා ගනු ලැබූ ජනතාවත්, දේව නීතිය පිළිපදින සෙනඟත් තමන් පමණකැයි ඔවුහු කීහ. තම අසල්වැසි විදේශිකයන් සමඟ ආශ්‍රය කිරීමට අකමැති වූ මොවුන්ගේ හැසිරීම ගරුසරු බවින් තොරවිය. කථා කරන විලාශයෙන් පවා තමන්ගේ ප්‍රෞඪත්වය රුවා දැක්වීමට උත්සාහ කළහ. ගලීලයන් මෙන් ඉවසන සුළු නොවූහ. ජුදයාවේ
දී ජේසු සමිඳුන්ට එතරම් සැලකිල්ලක් නොදක්වන ලද්දේ මේ නිසා ය.

1.4. සමාජයීය පංති:

(අ) සද්දුසිවරු, පූජකයන් හා ධනවතුන්

ජනතාවගේ ආගමික නායකයන් හා දේශපාලන නායකයන් ලෙස කටයුතු කළේ මේ අයයි. මොවුන් නීතිය අකුරට ම පිළිපදින අතර පිළිගන්නා ලද්දේ පංච පුස්තකය පමණය. විශ්වාස කළේ එකම දෙවියන් වහන්සේව ය. මරණින්

මතු ජීවිතය, දේව දූතයන් හා උත්ථානය විශ්වාස නොකළහ. සාදොක්ගේ පූජක පවුලෙන් පැවතෙන්නෝ ය. ඉහළ පැලැන්තියේ, වංශවත්, ධනවත් අය ය.

(ආ) **ලේකම්වරු**
විප්‍රවාස කාලයේ බැබිලෝනියාවේ දී බිහි වූ පිරිසයි. ඔවුන් පරිසිවරුන්ගේ ද නායකයෝ ය. බැබිලෝනියාවේ දී දේව මාලිගාව නොතිබූ නිසා දේව වාක්‍ය පිටපත් කිරීම මොවුන් අතින් සිදුවිය. මොවුන් තෝරාගත් ජුදා පිරිසකි. ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ දී ද ව්‍යවස්ථා ආචාර්යවරු වූයේ මොවුන් ය. ජනතාව මොවුන් ඇමතුවේ රබ්බෝනි හෙවත් ගුරු දේවයනි යනුවෙනි. එමනිසා අපෝස්තුළුවරු ජේසුස් වහන්සේට ද මෙසේ ආමන්ත්‍රණය කළහ.

(ඇ) **පරිසිවරු**
පරිසියානු යනු අන් අයගෙන් වෙන් වූ තැනැත්තා ය. මොවුන් බාහිර වත් පිළිවෙත් කෙරෙහි පමණක් විශේෂ උනන්දුවක් දැක්වූහ. අමරණීය ආත්මය හා දේව දූතයෝ ගැන විශ්වාස කළහ. ඔවුහු ජුදෙව් නොවන අයගෙන් හැකි තරම් වෙන්වී සිටීමට උත්සාහ දැරූහ. ජුදෙව් සමාජයේ සිටි විශාල තම බල සම්පන්න ආගමික කණ්ඩායම මොවුන් ය. ජුදා දහම සහ නීතිය සෙසු ජුදෙව්වරුන්ට වඩා ඉහළින් පිළිපැදීම සඳහා ඔවුහු කණ්ඩායමක් සේ වෙන් වී සිටියහ.

(ඈ) **සමරිතානුවරු**
ජාතිය අනුව එකම වුව ද, ආගමික කොන් කිරීම නිසා වෙන්ව ජීවත් වූහ. මෙයට හේතුව ඔවුන් අසිරියාවේ වහලුන්ව සිටි කාලයේ තමන් ඇදහූ ජුදා ආගම අන් මිත්‍යා ඇදහිලි සමඟ මිශ්‍ර කිරීමයි. මොවුන් පිළිගත්තේ පංච පුස්තකය පමණ ය. වන්දනා කළේ ගෙරිසිම් කන්දේ තනාගත් දේව මන්දිරයේ ය. අනෙකුත් ජුදා ජනතාව සමරියාව මැදින් ගමන් බිමන් නො ගියහ. එයට හේතුව එසේ යන අයවලුන්ට සමරිතානුවන් හිරිහැර කළ බැවිනි. ජුදෙව්වන් ඔවුන්ට සැලකුවේ විජාතිකයන්ටත් වඩා ඉතා පහළ මට්ටමකිනි. ඔවුහු සමරියාවේ පදිංචිකරුවන් ය.

(ඉ) **එසේනිවරු**
ක්‍රි.ව. 64 දක්වා එසේනිවරුන් නමින් හැඳින් වූ පිරිසක් ද මළ මුහුද ආශ්‍රිතව කුම්රාන් නුවර විසූ බව ඓතිහාසික කුම්රාන් ලියවිලිවලින් පෙනී යයි. මෑතකදී කළ කැණීම් අනුව ඔවුන් පූජක පරපුරකින් පැවත එන තාපස පිරිසක් බවට සාක්ෂි ලැබී ඇත.

### 1.5. ජන ජීවිතය
මේ කාලය වන විට ඊශ්‍රායෙල් ජන ජීවිතයේ එතරම් වෙනසක් වූ බව දක්නට නැත. සාමාන්‍ය ජනතාවගෙන් දේව මාලිගා බද්ද අය කරමින් රදළ පංතිය සැප විහරණයේ ජීවිතයක් ගත කළහ. විශේෂයෙන් ජෙරුසලෙම ආශ්‍රිතව විසූ පූජක පෙළපතේ අය, පොදු ජනයා තලාපෙලා තමන්ට සකස් කරගත් නීති හා සම්ප්‍රදායන් අනුව උසස් ජීවන ක්‍රමයක් ගත කළහ. පොදු ජනතාවගේ ආර්ථිකය බැඳී තිබුණේ එඬේරික ජීවිතය හා කෘෂි රටාව මත ය. ගලීලයේ වැසියෝ බොහෝ දෙනෙක් ධීවරයන් වූහ. (ලූක් 5/1-11; මතෙව් 4/18-22; මාක් 1/16-20) කෘෂිකර්මය පිළිබඳ සංකල්ප ද නව ගිවිසුමෙන් දැකිය හැක. (මතෙව් 13/1-9, 13/24-30, ජුවාම් 15/1-11) පිටස්තර ලෝකයා සැලකුවේ ගලීලයන් දුර්වල, බුද්ධි මට්ටමින් හීන අය වශයෙනි. සමරිතානුවෝ තම ප්‍රදේශය තුළ පමණක් ජීවත් වූහ. ඔවුන් දරුණු අදහස් ඇති ජන කොටසකි. ජුදයාවේ විසූ බොහෝ දෙනා ග්‍රීක් බස උගත් බුද්ධිමත් අය වූහ. මාන්නයෙන් හිස උදුම්මාගත් රදළ පිරිසක් ජෙරුසලෙම ආශ්‍රිතව විසූහ. මොව්හු දෙබිඩි ජීවිත ගත කළ පිරිසකි. මෝසෙස්ගේ නීතිය අකුරටම පිළිපදින බව කියමින් ජනතාවගෙන් දේව මාලිගා බද්ද අය කරමින්, සැප විහරණයේ ජීවිතයක් මොවුහු ගත කළහ. භාෂාව අනුව ග්‍රීක් උගත්තු හා ඇරමයික් කථාකරන්නන් වශයෙන් සමාජය බෙදිණි.

### 1.6. දේශපාලනමය පසුබිම.
මේ කාලය වන විට පලස්තීනය පුරා පැවති දේශපාලන ආගමික පසුතලය ගැන සෙවිය යුතු ය. එකල පලස්තීනය පුරා ග්‍රීක සංස්කෘතිය ඉතා හොඳින් පැතිර තිබුණි. පලස්තීනය පාලනය කළේ රෝම අධිරාජයා විසිනි. රෝම අධිරාජයා විසින් පත් කළ ආණ්ඩුකාරවරු විසින් ජුදයාව, සමරියාව, ගලීලය පාලනය කරන ලදී. ඔවුන් යුව රජවරු වශයෙන් ද නම් කළහ. දේශපාලන පසුතලය ගොඩනැඟී තිබුණේ ග්‍රීක දේශපාලන පසුබිම මත ය. ඊජිප්තුවේ හා ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිටි ජුදා ජනතාව ග්‍රීක බස තම මව් බස බවට පරිවර්තනය කර ගත්හ. ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය වූ මන්ත්‍රණ සභාව සැන්හෙඩ්‍රින් නමින් හැඳින්විය. මේ සභාව පහත සඳහන් අයගෙන් සමන්විත ය.

- පූජක පේරුව හෙවත් පවුල් 24ට අයත් මූලික පූජකවරු (1 වංශා. 2)
- වයසින් මුහුකුරා ගිය අත්දැකීම් ඇති ප්‍රජා මූලිකයන් (මාක් 11/27)
- විනයධරයින් හෙවත් ජුදෙව් ව්‍යවස්ථාව පිළිබඳ අටුවාචාරීන්

ජුදෙව් ජනතාවගේ සියළුම අධිකරණ බලතල සැන්හෙඩ්‍රින් සභාවට පවරා තිබුණි. රැස්වීම් පැවැත්වූයේ දේව මාලිගාවේදී ය. දේශපාලනික වශයෙන් රෝම අධිරාජ්‍යයට බදු ගෙවන ලදී. ඒවා රැස්කළේ අයකැමියන් යයි නම් ලත් පිරිසකි.

පවත්නා දේශපාලන ක්‍රමයට ලැදි පිරිසක් ද, ඊට විරුද්ධ පිරිසක් ද ජුදා සමාජයේ බිහි විය. සෙලොට්වරු හා සිකාරිවරු විප්ලවය තුළින් නිදහස පැතූහ. පරිසිවරු ග්‍රීක-රෝම සංස්කෘතික බලපෑම් පිළිකෙව් කළහ. සද්දුසිවරු ග්‍රීක-රෝම සංස්කෘතිය පිළිගනිමින් කාලානුරූපී වූහ.

### 1.7. ආගමික පසුබිම.
ජෙරුසලෙම් දේව මාලිගාවේ ආගමික තේවාවන් කළේ ආරොන්ගේ පෙළපතින් පැවත එන පූජක පිරිසකි. දිනපතා පූජා ඔප්පු කිරීම, පූජාසනයේ ගිනි දැල්වීම, පහන් රුක දැල්වීම, පිදුම් රොටි පිළියෙල කිරීම හා ව්‍යවස්ථාව ඇන්වීම ඔවුන්ගේ කාර්යයන් ය. ශුද්ධාති ශුද්ධස්ථානයෙකි. ප්‍රධාන පූජකයා ද එක් අයෙකි. ධර්ම ශාලා හෙවත් සිනගෝග රාශියක් පලස්තීනය පුරා තිබුණි. සබත් දින යාච්ඤා සඳහා මේවා භාවිතා කළහ. සෑම ධර්මශාලාවකම ව්‍යවස්ථාවලිය හා දිවැසාවලිය තැන්පත් කර තිබුණි. යාච්ඤා කිරීම, ශුද්ධ ලියවිල්ල පහදා දීම එහිදී සිදුවිය. ආගමානුකූල පවිත්‍රවීමේ පිළිවෙත් කෙරෙහි විශේෂ අවධානයක් දැක් වූ බලසම්පන්න ආගමික කණ්ඩායම සදුසිවරුය. දන්දීම හා උපවාසය විශේෂ ආගමික සම්ප්‍රදායන් විය. සබත විශේෂ ආගමික පිළිවෙතකි. ඔවුහු එය අකුරට ම පිළිපැද්දාහ. ප්‍රධාන මංගල්‍ය

කීපයක් විය. ඒ හැමවිටකම ජනතාව දේව මාලිගාවට රැස්වූහ. විශේෂ යාච්ඤා පොත ගීතාවලියයි. ප්‍රධාන වන්දනා ස්ථානය ජෙරුසලමේ දේව මාලිගාවයි. ප්‍රධාන මංගල්‍යයන් හතරකි. පාස්කු මංගල්‍යය විශේෂතම උත්සවයකි.

එසේ ම ජන වර්ගය හා නීතිය, පිළිවෙත් පිළිපැදීම අනුව ශුද්ධ සෙනග හා අශුද්ධ සෙනග යැයි ජනතාව ද්වි ඛණ්ඩනය විය. ආගමික නීතිය වූයේ පංච පුස්තකයේ නීතිය සහ පැරැන්නන්ගේ සම්ප්‍රදායන් ය. ආගමික සිද්ධස්ථාන වූයේ ජෙරුසලමේ දේව මන්දිරය, ධර්ම සභා මණ්ඩපය සහ එකල පැවති ශුද්ධස්ථානයි. යාග පූජා වූයේ දවන යාග පූජා, සහභාගිකමේ පූජා, පාප පූජා, ධාන්‍ය පූජා, සුවඳ දුම් පූජා සහ රොටි පිදීම වේ.

**1.8. ආර්ථික පසුබිම.**

ශෙකල් ඔවුන්ගේ මුදල් වලට භාවිතා කරන පොදු නාමයයි. රදළවරු, ආගමික නායකයෝ මුදලින් පොහොසත් අය වුවත් පලස්තීනයේ පොදු ජනතාව දිළිඳු අය වෙති. කෘෂිකර්මය, එඬේරික ජීවිතය, ධීවර කර්මාන්තය, වඩු කර්මාන්තය ප්‍රධාන රැකියාවන් ය. රැකියාව අනුව රටේ පාලකයන්, කම්කරුවන්, ගොවීන්, කුලීකරුවන්, වහලුන් යැයි සමාජය බෙදිණි. එදා ජුදා සමාජයේ බදු ක්‍රම දෙකක් විය. එනම්, දේව මාලිගාවට ගෙවිය යුතු බද්ද හා රෝම රජයට ගෙවිය යුතු බද්ද වශයෙනි. විදේශගතව සිටින සෑම ජුදෙව්වෙක් ම මේ බද්ද ගෙවීම සඳහා, වාර්ෂිකව දේව මාලිගාවට පැමිණිය යුතු විය. පූජක පිරිස බදු මුදල් වලින් සැප විහරණ ජීවිත ගත කළහ. තමන්ගේ එකම නායකයා දෙවියන් වහන්සේ නිසා ඇග බද්ද හා ඉඩම් බද්ද රෝම රජයට ගෙවීමට අකමැති විය. එම කාසිවල සීසර්ගේ රූපය ඇති බැවින් (මතෙව් 22/17) එය ජුදා ජනතාවට අප්‍රසන්න දෙයක් විය. ඔවුන් එය රූප වන්දනාවක් ලෙස සැලකූහ. ඔවුන් භාවිතා කළ තවත් කාසි වර්ගයක් නම් රෝම දිනාරියයි. තවත් කාසි වර්ගයකි, ග්‍රීක ඩ්‍රැක්මාව (දැක්මාව). එය රිදී කාසියකි. දේව මාලිගාවේ බද්ද ගෙවන ලද්දේ රිදී කාසියකිනි.

**1.9. ප්‍රධාන මංගල්‍යයන්**

**හැඳින්වීම**

ඊශ්‍රායෙල් ජනතාව වසරකට කීපවරක් ප්‍රධාන මංගල්‍යය සඳහා පවුල් පිටින් ජෙරුසලෙමට පැමිණියහ. ඒ මංගල්‍යයන් නම්;

- නුමුහුන් රොටි අනුභව කරන පාස්කු මංගල්‍යය (ලෙවී 23/5-8; නික්මයාම 23/9-21)
- නාඹුල් ඵල හෙවත් පෙන්තකොස්ත මංගල්‍යය (නික්මයාම 23/26)
- කුඩාරම් මංගල්‍යය හෙවත් අස්වැන්න මංගල්‍යය (නික්මයාම 23/16)
- කැප කිරීමේ මංගල්‍යය (ජුවාම් 10/22)

මීට අමතරව තවත් ආගමික උත්සව අවස්ථා තිබිණි.

**(අ) සබත් දවස**

**(ආ) පශ්චත්තාපයේ දවස**

**(ඇ) පස ඇට මංගල්‍යය**

**(ඈ) පාස්කු මංගල්‍යය**

මේ මංගල්‍යයට, මංගල්‍ය දෙකක් සම්බන්ධ වේ. එනම්;

- පැරණි එඬේරුන්ගේ මංගල්‍යය
- කානානිදී පැවැත් වූ අස්වැන්න මංගල්‍යය

පැරණී එඬේරු තම ගව, බැටළු පට්ටි නව තණබිම් කරා ගෙන යාමට පෙර ආගමික පිළිවෙතක් සිදු කළහ. බැටළුවෙකු හෝ එළුවෙකු මරා, ලෙය කුඩාරමේ ඉදිරිපිට කණුවල තැවරූහ. එයින් අදහස් කළේ සතුන්ට දේව ආරක්ෂාවයි. ඊශ්‍රායෙල්වරු මේ මංගල්‍යයට, "ඔවුන්ගේ එතෙරවීම හෙවත් මිසරයේ වහල්බැම් වලින් නිදහස ලබා එතෙරවීම" ලෙස නව අර්ථකතනයක් දෙමින්, එය පැවැත්වූහ. කනානිවරු තිරිඟු අස්වැන්න නෙලීමෙන් පසු පළමුව නුමුහුන් පූප සාදා, අනුභව කළහ. (පැරණි මුහුන් මිශ්‍ර නොකර අළුත් මුහුන් සාදන තුරු) එදා රැ ඊජිප්තු දේශයෙන් පිටත්වීමේ දී තමන්ගේ පිටි පිපී තිබුණේ නැත. පළමු දිනයේ අනුභව කළේ නුමුහුන් පූපයි. එමනිසා මෙම සිද්ධිය නික්මයාමට සම්බන්ධ කර ගෙන මංගල්‍යයක් පැවැත්වූහ. මේ මංගල්‍යය පැවැත්වූයේ නිසාන් මස 14 වන දිනය (මාර්තු හෝ අප්‍රේල්). මෙම ජනතාව කානාන් දේශයේ පදිංචි වූ පසු මේ මංගල්‍ය දෙකම එකට සම්බන්ධ කර මිසරයේ වහල් බවින් එතෙරවීමත් නුමුහුන් පූප අනුභව කිරීමත් මුල්කර ගෙන පාස්කු මංගල්‍යය පැවැත්වූහ.

**(ඉ) පෙන්තකොස්ත මංගල්‍යය**

පෙන්තකෝස්ත යනු ග්‍රීක වචනයකි (පෙන්ටකොස්ටරිස්). එයින් හඟවනු ලබන්නේ දින 50 යන අර්ථයයි. තිරිඟු අස්වැන්න කපා සති හතක් ගිය පසු 50 වන දින මංගල්‍යයක් සිදු කරයි. මෙය සති මංගල්‍යය යනුවෙන් ද නම් කරයි. (නික්මයාම 34/22; ලෙවී 23/15) පළමු අස්වැන්න කැපූ දින, කරල් පූජාසනය ඉදිරිපිට තබයි. සති හතකට පසු මංගල්‍යය 50 වන දින සිදු කරයි. එහිදී මුහුන් පූප දෙකක් පූජා කරයි. මෙය කානානිවරුන්ගේ මංගල්‍යය වල බලපෑමකි. මුහුන් පූජා කළ පසු බැටළුවකු හෝ ගොන්වස්සකු පූජා කරයි. පසුකලෙක මේ මංගල්‍යය සීනයි ගිවිසුම හා සම්බන්ධ කරයි. එය ද අස්වැන්න මංගල්‍යයක් ලෙසටය, පැවතුනේ. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ දෙවන පරිච්ඡේදයේ ඇති පෙන්තකොස්ත මංගල්‍යය මෙයයි. එදා ජෙරුසලෙම් දේව මාලිගාවට ජනතාව රැස්වූයේ පැරණි පෙන්තකොස්ත මංගල්‍යය පැවැත්වීමටයි. අපෝස්තුළුවරුන්ට ශුද්ධාත්මයාණන් පහළ වුණේත් ක්‍රිස්තුන් වහන්සේ උත්ථාන වී දින 50කට පසු ය. මෙම අදහස් එකතුවී අද පෙන්තකොස්ත මංගල්‍යය පවත්වයි.


**(ඊ) කුඩාරම් මංගල්‍යය**

මේ මංගල්‍යය සරත් සෘතුවේ එනම් හත් වන හෙවත් ටිෂ්රී මාසයේ 15 වන දින පවත්වනු ලැබුවේ, ගෙවතුවල ඵලදාව (පලතුරු) එක් කළාට පසු ය (ලෙවී 23/33-43). මෙය මොවුන්ගේ ඉතා ප්‍රීතිමත් මංගල්‍යයක් වන අතර දින හතක් පුරා පවත්වනු ලැබේ. හැම දිනකම උදේ හා සවස යාග පූජාවක් ඔප්පු කරයි. අවසාන දිනය විශාල යාග පූජාවකි (ලෙවී 23 පරිච්ඡේදය). මෙහි ඇත්තේ අන්‍යාගමික කානානිය වත් පිළිවෙත් ය. ඊශ්‍රායෙල් ජනතාව කාන්තාරයේ දී ගත කළ කුඩාරම් ජීවිතය ද මෙහිදී සිහි ගන්වයි.

**(උ) දේව මාලිගාව කැප කිරීමේ මංගල්‍යය**

හතරවන ඇන්ටියොක්ස් රජ ජුදාවරුන්ට බලහත්කාරයෙන් ග්‍රීක සංස්කෘතියත් ග්‍රීක ආගම උගන්වන්නට උත්සාහ කලේ ය. ඔහු ශුද්ධ ලියවිලි පුළුස්සා දමා ජුදා නීතිය පිළිපැදීම තහනම් කළහ. ඔහු ක්‍රි.පූ. 167 දෙසැම්බර් 25 වන දින දේව මාලිගාවේ සියුස් දෙවියාගේ රූපය ස්ථාපිත කලේ ය. ඊට පසු පූජාසනය මත ඌරන් පූජා කලේ ය. ඊට වසර තුනකට පසු ජුදස් ඇටියොක් මකබියස් රජ පරාජය කිරීමෙන් පසු දේව මාලිගාව නැවත කැප කලේ ය. දෙසැම්බර් මස 25 වන දින සිට දින දහයක් මංගල්‍ය උත්සව පැවැත්වූහ. මේ මංගල්‍ය කාලයේ ජනතාව ඔලිව් අතු රැගෙන ගී ගයමින් (ගීතාවලිය 30) දේව මාලිගාවට පෙරහැරින් ගියහ (2 මකබි 10/6-8). පෙරහැරේදී ගීතාවලිය 113 සිට 118 දක්වා වූ ගී ගැයූහ. පෙරහැර දේව මාලිගාවට පැමිණි පසු යාග පූජාව විය. සෑම ගෙදරකම පහන් දැල්වූහ. පළමු දවස පහන් එකක් ද, අවසාන වනවිට දහයක් දක්වා ද පහන් වැඩි කළහ. පසුකලෙක මේ මංගල්‍යය ආලෝකයේ මංගල්‍යය නමින් ද හැඳින්විය. .

1.10. **ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ ශු. දේශයේ සිතියම.**



## දෙවන පාඩම

### 2. ශුද්ධ වූ බයිබලය ගැන පොදු හැඳින්වීම

**2.1. හැඳින්වීම.**

බයිබලය නමැති වචනය බිඳී එනුයේ "බිබ්ලෝස්" නමැති ග්‍රීක වචනයෙනි. එහි අර්ථය පොත යනුයි. එසේම "බිබ්ලියා" යන ග්‍රීක වචනයේ තේරුම "පොත්" යන්නයි. කිතුනුවන්ගේ පූජනීය ග්‍රන්ථයට "බයිබලය" යැයි කියන්නට පටන් ගත්තේ සාන්ත ක්ලෙමන්ට් තුමා ය.

ඇත්තෙන් ම බයිබලය තනි පොතක් මෙන්ම පුස්තකාලයක් ද වේ. එහි අඩංගු පොත් 73කි. අවුරුදු 1500ක කාලයක් තුළදී ලියැවුණු ඒවා ය.

ශු. බයිබලය හු විද්‍යාත්මක, ජීව විද්‍යාත්මක හා ඉතිහාසගත කරුණු අඩංගු පොතක් නොව දෙවියන් වහන්සේ හා මිනිසා අතර ඇතිවූ ආදර කාතන්දරයකි. දේව අභිමතයත්, මිනිස් ස්වභාවයත්, ගැලවීමේ මාර්ගයත් පිළිබඳ කරුණු එහි සඳහන් වේ.

මිනිසාගේ ප්‍රධාන ඇවෙන ප්‍රශ්න තුනට නියි පිළිතුරු සඳහන් එකම පුස්තකය ශු. බයිබලය යි.

ඒ ප්‍රශ්න නම් (i) මා කවුද? (ii) මා මෙලොව ජීවත්වන්නේ කුමට ද?
(iii) ලොවේ මට ඇති තැන කුමක් ද?

ශු. බයිබලය තුළින් දේව අභිමතය තුන් ආකාරයකින් ප්‍රත්‍යක්ෂ වේ. එනම්;
(i) මිනස් ජීවිතයේ සිද්ධීන් තුළින් (ii) කවි, සංගීත, කතාන්දර මගින්
(iii) සංකේත, සලකුණු මගින්

දේවානුභාවයෙන් යුතුව දෙවියන් වහන්සේ පිළිබඳවත්, උන්වහන්සේ තෝරාගත් ශුද්ධ සෙනඟ පිළිබඳවත් ලියැවී ඇති නිසා එය "**ශුද්ධ බයිබලය**" වේ. ශුද්ධ ලියවිල්ල, දේව වචනය, ව්‍යවස්ථාව ඊට පටබැඳි වෙනත් නම් ය.

ශුද්ධ බයිබලය කතෝලික - ක්‍රිස්තියානි හා ජුදා යන ආගම් වලට පොදු වූ, සමයාන්තර ආගමික වටිනාකමින් යුත් ග්‍රන්ථයකි. එසේම ලෝකයේ වැඩිම භාෂාවන් ගණනකට පරිවර්තනය වී ඇති, ලොව වැඩියෙන් ම මුද්‍රණය වන, අලෙවි වන හා කියවන සර්වකාලීන වටිනාකමකින් යුත් විශ්වීය කෘතියකි.

ශු. බයිබලයේ ප්‍රධාන කොටස් දෙකකි.

(i) **පුරාණ ගිවිසුම -**
දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල්වරුන් සමඟ ඇති කරගත් සබඳතාවය පිළිබඳව ය.

(ii) **නව ගිවිසුම -**
දෙවියන් වහන්සේ සකල මානව පවුල සමඟම ඇති කරගත් සබඳතාවය පිළිබඳව ය. (හෙබ්‍රෙව් 1/1-3)

**2.2. අරමුණ සහ තේමාව.**

**2.2.1. අරමුණ**

ශු. බයිබලය විවිධ කතුවරුන් විසින්, විවිධ කාල වකවානු වලදී, විවිධ ස්ථානවලදී, විවිධ පරමාර්ථ ඇතිව ලියැවිණි. නමුත් මුළු ශු. බයිබලයේම ප්‍රධාන අරමුණ දේව රාජ්‍යයයි. දේව රාජ්‍යය පිළිබඳ දේව පොරොන්දු පුරාණ ගිවිසුමේත්, දේව රාජ්‍යයේ උදාව නව ගිවිසුමේත් සඳහන්ව ඇත.


ආදි අනාදියේ සිට දෙවියන් වහන්සේ සැමට ම දේව රාජ්‍යය උරුම කරදීම සඳහා කෙසේ ක්‍රියා කළ සේක් ද යන්න ශු. බයිබලය අනාවරණය කරයි. එසේම දේව රාජ්‍යය දිනා ගන්නට නම් මිනිසා දෙවියන් වහන්සේ සමඟ ගිවිසුමකට ඇතුළත්ව එය පැවැත්විය යුත්තේ කෙලෙස ද යන්න අනාවරණය කරයි.

**2.2.2. තේමාව**

ශු. බයිබලයේ ප්‍රධාන තේමාව නම් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය. පුරාණ ගිවිසුමේ තෝරාගත් විශේෂ ජනතාවක් මගින් දෙවියන් වහන්සේ විසින් පැමිණීම සූදානම් කරනු ලැබුවාවූ ද; නව ගිවිසුමේ ස්වකීය ජනතාව අතරට පැමිණියා වූ ද; අනාදියේ සිටම දෙවියන් වහන්සේ සමඟ වැඩ විසූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය.
ලූක් 24/27; එපීස 1/9-10; 1 පේදුරු 1/20.

**2.3. පොත් වර්ග කිරීම.**

| බයිබලය | පුරාණ ගිවිසුම | නව ගිවිසුම | පොත් සංඛ්‍යාව |
|---|---|---|---|
| හෙබ්‍රෙව් | 39 | - | 39 |
| ක්‍රිස්තියානි | 39 | 27 | 66 |
| කතෝලික | 46 | 27 | 73 |




පොත්

- **කතෝලික බෙදීමට අනුව පුරාණ ගිවිසුමේ පොත් වර්ග සතරකි.**
  (i) **නීති පොත් -**
  උත්පත්ති, නික්මයාම, ලෙවී ව්‍යවස්ථාව, ගණන් කථාව, ද්විතීය නීති සංග්‍රහය (පොත් පහකි.)

(ii) **ඉතිහාස පොත් -**
ජෝශුවා, විනිශ්චයකාරයෝ, රූත් කථාව, 1 සාමුවෙල්, 2 සාමුවෙල්, 1 රාජාවලිය, 2 රාජාවලිය, 1 වංශාවලිය, 2 වංශාවලිය, එස්රා, නෙහෙමියා, තෝබිත්, ජූදිත්, එස්තර්, 1 මකබී, 2 මකබී (පොත් දහසයකි)

(iii) **ප්‍රඥා පොත් -**
ජෝබ්, ගීතාවලිය, හිතෝපදේශ, ධර්ම දේශකයා, සලමොන්ගේ ගී (ප්‍රේම ගී), සලොමන්ගේ ප්‍රඥාව, උපදේශකයා (සිරාක්) (පොත් හතක)

(iv) **දිවැසාවලිය -**
යෙසායා, ජෙරමියා, එසකියෙල්, විලාප ගී, බාරුක්, හොසෙයා, ජෝ වෙල්, ආමොස්, ඔබදියා, ජෝනා, මීකා, හබකුක්, ශෙපනියා, හග්ගයි, සෙකරියා, නාහුම්, මලාකි (පොත් දාහතකි).
දානියෙල් පොත එළිදරව් වාදී සාහිත්‍යයට අයත් ය.

- **පංච පුස්තකය**
බයිබලයේ පළමු පොත් 5 යි. නීති පොත් ගණයට අයත්වේ. මේ පොත් පහේම ඇති පොදු තේමාව වනුයේ ඊශ්‍රායෙල්වරු දේව ජනතාවක් බවට පත්වීමයි. එනම් ඊජිප්තුවේ වහල් කමින් මිදී විමුක්තිය ලබා ගැනීමේ සිද්ධියයි. මේ මුළු පංච පුස්තකයෙහිම කැපී පෙනෙන පුද්ගලයා මෝසෙස්ය. සීනයි ගිවිසුම, විශේෂිත වූ කේන්ද්‍රීය සිද්ධියයි. ඊශ්‍රායෙල් නීතිය සැකෙවින් මෙහි අඩංගුවේ. දෙවියන් වහන්සේ හා මිනිසා අතර ඇති සම්බන්ධතාවය පිළිබඳ මූලික සත්‍යතාවයන් පංච පුස්තකයේ උත්පත්ති කථාවේ සඳහන් වන අතර, දෙවියන් වහන්සේ මුළු මැවිල්ලේ මැවුම්කරුවා ලෙස අපට කථා කරන සේක. නික්මයාමෙන් ඊශ්‍රායෙල් ජනතාවගේ විමුක්ති කථාවත්, ලෙවී කථාවෙන් පූජක පරපුරක බිහිවීමේ ඉතිහාසයත්, ගණන් කථාවේ ඊජිප්තුවෙන් පිටත් වූ ජනතාවගේ ගණන සඳහන් වන අතර, පූජක වත්පිළිවෙත් පෙන්වා දී තිබේ. ද්විතිය කථාව මගින් සීනයි ගිවිසුම හා මොසෙස්ගේ ව්‍යවස්ථා පිළිබඳ ගැඹුරු ධර්මයක් පෙන්වා දෙයි.

- **ඉතිහාස පොත්**
අතීත සිද්ධීන් පිළිබඳ වාර්තා ඇතුළත්ව ඇත. අනාගතය කෙරෙහි මඟ පෙන්වයි. ඊශ්‍රායෙල් රාජකීයත්වය පෙන්වා දී තිබේ. එමෙන්ම මෝසෙස්ගෙන් පසු ජෝසුවාගේ නායකත්වය ගැන කථා කරයි. විනිශ්චයකාරයන් නොහොත් නායකයන්ගේ කථා පිළිබඳ ඓතිහාසික තොරතුරු ඇත. දාවිත් හා සලමොන් රජවරුන්ගේ රාජ්‍ය කාලය වර්ණනා කරයි. බැබිලෝනියේ විප්‍රවාසය හා එස්රා හා නෙහෙමියා දේව මාළිගාව ගොඩනැංවීමේ ඉතිහාසය ලියා ඇත. වගකීම් සහිත පුත්‍රයකු පිළිබඳ කථාවයි, තෝබියස්ගේ පොතෙන් ඉදිරිපත් කරන්නේ. ජූදිත්, එස්තර්, වීර කථා පුවත් ය. විශ්වාසය උදෙසා ප්‍රාණ පරිත්‍යාගී වූ පුරාණ ගිවිසුමේ ප්‍රථමයා මකබියෙස් බව මකබියෙස්ගේ පොතෙන් පෙන්වා දෙයි.

- **ප්‍රඥා පොත්**
ප්‍රඥාව දෙවියන් වහන්සේට සම්බන්ධ දෙයක් ලෙසට ප්‍රඥා පොත්වලින් හඳුන්වා දී තිබේ. ප්‍රඥාවේ ආරම්භකයා ද දෙවියන් වහන්සේ බව පෙන්වා දී තිබේ. ජෝබ්ගේ පොත ශ්‍රේෂ්ඨතම ප්‍රඥා සාහිත්‍යයකි. එය, දීර්ඝ සංවාදයක ආකාරයෙන් ගොඩ නඟා ඇත. දෙවියන් වහන්සේට යාච්ඤා කිරීමට මඟ පෙන්වන සංගීත ඇතුළත් පොතකි, ගීතාවලිය. දෙවියන් වහන්සේගෙන් පසු මේ පොත සභාවේ විශේෂ යාච්ඤා බවට පත්වී ඇත. දෙවියන් වහන්සේගේ ප්‍රඥාව ඇති තැනැත්තාට සතුට ලැබෙන බව හිතෝපදේශයේ සඳහන් වේ.

- **දිවැසිවර ග්‍රන්ථ**
දිවැසිවරයා යනු දෙවියන් වහන්සේගේ නාමයෙන් කථා කරන තැනැත්තා ය. ඊශ්‍රායෙල් දිවැසිවරු දෙවියන් වහන්සේ හා සම්බන්ධ දිව්‍ය ශ්‍රාව්‍යය ලැබූ පුද්ගලයෝ වූහ. ඔවුන්ගේ ප්‍රධානත ම කාර්යය වූයේ දෙවියන් වහන්සේගේ වචනය කාලයට, දේශයට ඔබින ලෙස ජනතාවට ප්‍රකාශ කිරීමයි. ඊශ්‍රායෙල් ඉතිහාසයේ වැදගත් තැනක් ගත් මොවුන් පුද්ගලිකව හෝ කණ්ඩායම් වශයෙන් හෝ ජීවත් වූහ. දිවැසිවර පොත් ලියන ලද්දේ දිවැසිවරුන්ම විසින් නොවේ. එය ඔවුන්ගේ මරණින් පසු එක් රැස් කර සංස්කරණය කරන ලද ඒවාය. සමහරවිට ඔවුන්ගේ ගෝලයන් විසින් ලියූ කොටස් ද ඇතුළත් ය. පොත්වල විශාලත්වය අනුව දිවැසි ග්‍රන්ථ දෙවර්ගයකි.

(i) ප්‍රධාන දිවැසි ග්‍රන්ථ
(ii) සුළු දිවැසි ග්‍රන්ථ

**ප්‍රධාන දිවැසිවරු තිදෙනෙකි.**
යෙසායා, ජෙරමියා, එසකියෙල්

**සුළු දිවැසිවර ග්‍රන්ථ**
හොසියා, ජෝවෙල්, ආමොස්, ඔබදියා, ජෝනා, මීකා, නාහුම්, හබක්කුක්, ශෙපනියා, හග්ගයි, සෙකරියා, මලාකි, විලාප ගී, බාරුක් (ජෙරමියාගේ ලිපි)

<u>මේ අය කථා කළ ප්‍රධාන තේමා</u>

✶ සමාජ සාධාරණත්වය
✶ ඒකදේව වාදය
✶ ස්වාමින් වහන්සේගේ දවස
✶ දුක්විඳින සේවකයා
✶ යුක්ති ගරුක බව
✶ මෙසියානු සංකල්පය
✶ ගිවිසුම් සංකල්පය

<u>දේව පණිවුඩය දිවැසිවරුන් ලැබූ මාර්ග</u>

- දර්ශණ තුළින්
- සවන් දීමෙන්
- ඇතුලාන්ත ආනුභාවය තුළින්


★ **යෙසායාගේ පොත ක්‍රි.පූ.** 765-687
මොහුගේ පොතේ ඇත්තේ ඊශ්‍රායෙලයේ හා ජුදයාවේ වැටීම ගැනත් දේව අවිශ්වාසය නිසා මුළු ජාතියටම ලැබෙන දඬුවම ගැනත් ය. මෙසියස් තුමා ගැන පළමු දිවැස් වැකිය ඇත්තේ මොහුගේ පොතේ ය (2/1-5; 7/10-11). දෙවියන් වහන්සේගේ ශුද්ධවන්තකම, බලසම්පන්නකම, ශක්තිසම්පන්නකම මෙහි දැකිය හැක. විශ්වාසයේ දිවැසිවරයා ලෙස බයිබලයේ හඳුන්වයි.

★ **ජෙරමියාගේ පොත ක්‍රි.පූ.** 646
මොහුගේ පොතේ තේමාව විනාශයයි (1-10; 20/8). මෙම සාමකාමී පුද්ගලයා ජනතාව සමඟ ද, රජවරුන් සමඟ ද, පූජකයන් සමඟ ද, බොරු දිවැසිවරුන් සමඟ ද, මුළු රාජ්‍යය සමඟ ද සටන් කරමින් ජීවත්වූ ආකාරය ඔහුගේ ග්‍රන්ථයේ සඳහන්වේ. එකිනෙකාට ඵල විපාක ලැබෙන්නේ තම තමන්ගේ ක්‍රියා අනුව බවත්, මිනිසාගේ දූෂිත වූ සිතෙහි ප්‍රතිඵලය වූ පාපය නිසා දෙවියන් වහන්සේ සමඟ ඇති මිත්‍රත්වය බිඳෙන බවත් ඔහු කියයි.

★ **එසකියෙල් - ක්‍රි.පූ.** 586
ඔහු පූජකයෙක් බැවින් එහි දැක්ම හා හැසිරවීම බොහෝ දුරට ශුද්ධවන්තකමේ නීතියට සමාන ය. සංකේතාත්මකව පණිවුඩ ඉදිරිපත් කරයි. ජෙරුසලමේ විනාශය අභිමානවත් ලෙස ලියා ඇත. විප්‍රවාසය ගැන අගනා උපමා තුනක් ලියා ඇත.

- වියළි ඇටකටු ඇති මිටියාවත ගැන ඇති උපමාව. 37/1-14
- සම්දාණෝ යහපත් එඬේරාණෝ ය. 34/11
- ලී දෙක සම්බන්ධ උපමාව. 37/15-28

මෙසියස් මහිමාන්විත රජකෙනෙක් නොව දාවිත් පෙළපතින් එන ජනතාවගේ එඬේරා ලෙස ලියා ඇත.




(i) **ඉතිහාස පොත්**
මාක්, මතෙව්, ලූක්, ජොහාන්, ක්‍රියා පොත (පොත් පහකි)

(ii) **ලිපි**
**(අ) පාවුළු ලිපි:**
1 තෙසලෝනික, 2 තෙසලෝනික, 1 කොරින්ති, 2 කොරින්ති, පිලිප්පි, ගලාති, රෝම, කොලොස්සි, එපේසි, 1 තිමෝති, 2 තිමෝති, තිතස්, පිලෙමොන් (පොත් දහතුනකි).

**(ආ) පොදු ලිපි:**
ජාකොබ්, 1 පේදුරු, 2 පේදුරු, ජූද්, 1 ජොහන්, 2 ජොහන්, 3 ජොහන්, හෙබ්‍රෙව් (පොත් අටකි).

(iii) **දිවැසි ග්‍රන්ථ**
එළිදරව්ව (පොත් එකකි).

★ **මාර්ක් සුවිශේෂය**
ක්‍රි.ව. 65-70 අතර ලියන ලද්දකි. සංකේතය සිංහයා ය. රෝමයේ සිටි අන්‍ය ජාතීන් සඳහා ලියනු ලැබූ බව කියැවේ. කෙටි පරිච්ඡේද දහසයකි. කෙටිම සුවිශේෂය මෙයයි. මාර්ක්තුමා ශුද්ධ වූ පේදුරුතුමාගේ ගෝලයෙකි. නාසරෙත්හි ජේසුතුමා, සැබෑ දෙවියන් හා සැබෑ මනුෂ්‍යයා බව මේ සුවිශේෂයෙන් සඳහන් කරයි. මේ සුවිශේෂයේ ප්‍රාතිහාර්ය දහඅටක් සඳහන්වේ. සුවිශේෂයේ වැඩි කොටසක් වෙන්කර ඇත්තේ ගලිලයේ ධර්මදූත සේවය සඳහා ය. මෙයට දුක් ප්‍රාප්තියේ සුවිශේෂය යැයි ද කියනු ලැබේ. එයට හේතුව පරිච්ඡේද හයක්ම වෙන්කර ඇත්තේ උන්වහන්සේගේ දුක් ප්‍රාප්තිය හා මරණය සඳහා ය.

★ **මතෙව් සුවිශේෂය**
ක්‍රි.ව. 80-90 අතර ලියන ලද්දකි. මෙහි සංකේතය ස්වර්ගයෙන් පැමිණි මිනිසෙක් ය. පලස්තිනයේ සිටි ජුදෙව්වන්ට ලියන ලද්දකි. පරිච්ඡේද 28කි. දීර්ඝතම සුවිශේෂයයි. මතෙව්තුමාට පමණක් විශේෂ වූ කරුණු 42% ක් මෙහි අඩංගු ය. මෙතුමා ජේසුස් වහන්සේගේ ගෝලයෙකි. අයබදු අයකරන්නෙකි. පුරාණ ගිවිසුමේ පොරොන්දු වූ ගැලවුම්කරුවාණන් ජේසුස් වහන්සේ බව මෙහි තේමාවයි. ක්‍රිස්තියානි ධර්මය ජුදා ආගමේ සම්පූර්ණත්වය බව ද, ශුද්ධ වූ සභාව නව ඊශ්‍රායෙලය බව ද පෙන්වන්නට යත්න දරා ඇත. මෙහි පුරාණ ගිවිසුමෙන් උපුටා ගත් පාඨ 70 ක් ඇත. ක්‍රිස්තියානිය වැළඳ ගන්නා ලෙස ජුදෙව්වරුන්ට ආරාධනා කරයි. දේව රාජ්‍යයේ සුවිශේෂය ලෙස නම් කර ඇත. වැඩි කොටසක් දේව රාජ්‍යය ගැන ලියූ ඒවා ය.

★ **ලූක් සුවිශේෂය**

මෙය ලියන ලද්දේ ක්‍රි.ව. 80-90 න් පසුව ය. ගවයාගේ ලකුණ මෙහි සංකේතයයි. අන්‍ය ජාතීන් සඳහා ලියන ලද්දකි. පරිච්ඡේද 24 කි. ලූක්තුමාට විශේෂ වූ කරුණු 55% අඩංගුය. මෙහි තේමාව ජේසුස් වහන්සේගේ දයා කරුණාව හා ගැලවීම සකල ලෝකයාටම පොදු බවයි. ජේසුස් වහන්සේගේ ජීවිත කථාව දෙස ලූක්තුමා බලන්නේ, අන්‍ය ජාතික ඉතිහාසඥයෙකු, වෛද්‍යවරයෙකු හා දක්ෂ ලේඛකයෙකු හැටියට ය. විශේෂ ජුදා සිරිත් විරිත් අන්‍ය ජාතීන්ට මේ සුවිශේෂය මගින් විග්‍රහ කර පෙන්වා දී තිබේ.

★ **ජුවාම්තුමාගේ සුවිශේෂය**

මෙහි එකම උපමාවක්වත් සඳහන් නැත. ඉතිහාසයේ මෙය ලියා ඇත්තේ ක්‍රි.ව. 90-100 අතර කාලයේ දී විසූ ක්‍රිස්තියානි සභාවටයි. සංකේතය රාජාලියා ය. පරිච්ඡේද 21 කි. ධර්මය අතින් ගැඹුරු සුවිශේෂයකි. වැදගත් ම සුවිශේෂයයි. මේ සුවිශේෂයේ පරමාර්ථය වනුයේ ක්‍රිස්තියානිකාරයන් තුළ ඇති විශ්වාසය තහවුරු කිරීමයි. ජේසුස් වහන්සේ ගැලවුම්කරුවා පමණක් නොව දේව පුත්‍රයා බව ද තහවුරු කරයි. ජුවාම්තුමා ජේසුස් වහන්සේව ඉදිරිපත් කරන්නේ මුල සිටම මළවුන්ගෙන් ජයගත් නැනැත්තා ලෙසට ය. මෙහි තේමාව නම් දෙවියන් වහන්සේ තම එකම පුත්‍රයා ලොවට එවූ බවයි.

★ **අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත**

මෙය ලූක් සුවිශේෂයේ දෙවන කාණ්ඩයයි. මේ පොත ලිවීමේ පරමාර්ථය ගැලවීමේ සුබාරංචිය සකල මනුෂ්‍යයන්ට ප්‍රකාශ කිරීම, ඉතිහාසගත සිද්ධීන් පමණක් නොව, දේව ධර්මය පිළිබඳ සත්‍යයක් බව ප්‍රකාශ කිරීමයි.

| | | |
|---|---|---|
| පරිච්ඡේද 1-5 දක්වා | - | ක්‍රිස්තුන් වහන්සේ තම සභාව සමග සදහටම වැඩ කිරීම සඳහා ශුද්ධාත්මයාණන්ගේ වැඩම සිටීම සඳහන් කරයි. |
| පරිච්ඡේද 6-12 දක්වා | - | ස්තේපන්, පිලිප්, පේදුරු හා බර්ණබස්ගේ දේශනා, විස්තර කර දක්වයි. |
| පරිච්ඡේද 13-28 දක්වා | - | පාවුළුතුමාගේ මහා දූත ගමන් තුන සහ රෝමයට ගිය ගමන් මාර්ගයෙන් ස්ප්‍රීතු සාන්තු ආනුභාවයෙන් මුළු ලෝකයටම සුබාරංචිය දේශනා කිරීම ගැන පැහැදිලි කරයි. |

★ **පාවුළු ලිපි**

සංදේශ 13කම කර්තෘත්වය පාවුළුතුමා දරයි. තමා විසින් පිහිටෙවූ සංඝවලට, අවවාදාත්මක කරුණු මේ ලිපිවල ලියැවී ඇත. එදිනෙදා ජීවිත පැවැත්මට අවශ්‍ය කරුණු බොහෝමයක් මේ ලිපිවල අඩංගු වී තිබේ. විශේෂයෙන් කොරෙන්ති ලිපි ලියන ලද්දේ කොරෙන්ති සංඝයේ තරුණයන් හා වැඩිහිටියන් අතර ඇතිවූ ප්‍රශ්න නිරාකරණය කිරීමටයි. රෝම සභාව ආරම්භ කලේ පාවුළුතුමා නොවේ. එය මිශ්‍ර සංඝයකි. ජුදෙව් හා අන්‍යජාතික ක්‍රිස්තියානීන් අතර ප්‍රශ්න පැන නැගුන නිසා ජුදෙව් ආගම ක්‍රිස්තියානි ආගමට සම්බන්ධ බව පෙන්වීමට රෝම ලිපිය ලියා ඇත. නව ගිවිසුමේ ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත යාගය පිළිබඳව ඉතා උතුම් ධර්මය සඳහන් වන්නේ පිලිප්පි ලිපියේ ය. පාවුළුගේ ලිපි වලින් ඉතාම සම්පූර්ණ, නිසි පිළිවෙලට දේව ධර්මය ඉදිරිපත් කරන්නේ එපේසි ලිපියේය. ජේසුස් යන මනුෂ්‍යයා තුළ දෙවියන් වහන්සේ සම්පූර්ණයෙන්ම ප්‍රකාශවී ඇති බව කොලොස්සිවරුන්ට ලියූ ලිපිය මගින් පෙන්වා දී තිබේ. මිනිසාව දේව සබඳතාවයට පත් කෙරෙන්නේ මෝසෙස්ගේ ව්‍යවස්ථාව පිළිපැදීමෙන් නොව ඇදහිල්ලෙන් පමණක් බව, පාවුළු තර්ජනාත්මක ස්වරයෙන් ගලාති ලිපියෙහි සඳහන් කරයි.

කිතුනු පැවැත්ම ගැන අනුශාසනා කරමින් ක්‍රිස්තුන් වහන්සේගේ පුනරාගමනය ගැන බලාපොරොත්තුවෙන් හා ඉවසීමෙන් යුතුව දිවි ගෙවන්නට 1, 2 තෙසලෝනික ලිපිවලින් පෙන්නුම් කර දෙයි. තීතස් ලිපිය ඉතාම කෙටිය. සභාව තුළ සිටින නායකත්වය දරන්නන්, ස්ත්‍රීන්, පුරුෂයන්, දරුවන්, දාසදාසීන් මේ හැම කෙනෙකුටම ධර්මදානය කෙසේ දිය යුතු දැයි එම ලිපියෙන් අවවාද කර දක්වයි. පිලමොන් ලිපියෙන් පාවුළුතුමා ආයාචනා කරන්නේ තමාගේ වහල් දාසයා සමඟ සුහදත්වයෙන් විසීමටයි. තිමෝති ලිපියෙන් ඔහුට අවවාද කරන පාවුළුතුමා, අපෝස්තලික ධර්මය අනුව ජීවත්වීමටත්, එම ධර්මය යෝග්‍ය අය අතට පත් කරන ලෙසටත් ඉල්ලා සිටියි.

**ලිපි දෙවර්ගයකි:**

(අ) **සංඝ වලට යැවූ ලිපි -**

රෝම, 1 කොරින්ති, 2 කොරින්ති, ගලාති, එපීස, පිලිප්පි, කොලොස්සි, 1 තෙසලෝනික, 2 තෙසලෝනික

(ආ) **පෞද්ගලික ලිපි -**

1 තිමෝති, 2 තිමෝති, තීතස්, පිලමොන්

★ **පොදු ලිපි**

සංදේශ 8ක් මීට අයත් ය. පුරාණ ගිවිසුම මැනවින් දත් කිතු දහම වැළඳගත් ජුදෙව්වන්ට මෙම ලිපි ලියා ඇත.

- ජාකොබ්තුමා විසින් ජාකොබ් හසුන ලියමින් යහපත් ක්‍රියා හා සදාචාර ප්‍රතිපත්තිවලට වැදගත් තැනක් දෙයි.
- ජූද් හසුන ලියවී ඇත්තේ බොරු ගුරුවරුන් හෙළා දකිමින් ජූදා සම්ප්‍රදායට අනුව ඔවුන්ට දඬුවම් පැමිණිය යුතු බව පෙන්වා දීමටයි.
- 1 පේදුරු, 2 පේදුරු හසුන් ලියන පේදුරුතුමා තම ප්‍රසාද ස්නාපනය මතක් කර දෙමින් කවදා හෝ ක්‍රිස්තුන් වහන්සේ මෙන් ලෝකයෙන් ඉවත්විය යුතු බවත් මෝක්ෂය කරා ගමන් කළ යුතු බවත් පෙන්වා දෙයි.
- 1, 2, 3 ජුවාම් ලිපිවලින් වේද භේදකාරයන්ට පහර ගසයි. මෙහිදී ජුවාම්තුමා ක්‍රිස්තුන් වහන්සේගේ සම්පූර්ණ දේවත්වය පිළිබඳ අපෝස්තලික ඉගැන්වීම් ගැනත් ශුද්ධවන්තකම නොමැතිව විශ්වාසයෙන් ඵලක් නැති බවත් අවධාරණයෙන් කියා සිටියි.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ, දෙවියන් වහන්සේගේ සත්‍යයත්, අවසාන ප්‍රකාශනයත් බව පෙන්වන හෙබ්‍රෙව් ලිපියේ ලේඛකයා, බලවත් පීඩා මැද කිතුනු විශ්වාසය අත්හැර දැමීමේ අන්තරායට ලක්ව සිටි කිතුනුවන් දිරි ගන්වයි. ජේසුස් වහන්සේ දිවැසිවරුන්ට, මෝසෙස්ට හා පුරාණ ගිවිසුමේ පූජකයන්ට වඩා උත්කෘෂ්ඨ තැනැත්තාණන් බවත්, ශ්‍රේෂ්ඨතම පූජකයා වශයෙන් උන්වහන්සේ පැරණි ගිවිසුමේ යාග පූජා සම්පූර්ණත්වයට පත් කරන, විමුක්තිය ලබා දෙන තැනැත්තාණන් ලෙසත් පැහැදිලි කර දෙයි.

★ දිවැසිවර ග්‍රන්ථ

එළිදරව් පොත, ඩොමිෂියන් අධිරාජ්‍යයාගේ පාලන කාලයේ පැවති ආගම් පීඩන හේතුවෙන් ලියවුණු ග්‍රන්ථයක් ලෙස විද්වත්හු පිළිගනිති. ක්‍රි.ව. 77-90 පමණ ලියා ඇතත් ක්‍රි.ව. 70 දී ලියූ කොටස් ඇතුළත් ය.

මෙය ලියන ලද්දේ සුළු ආසියාවේ විසූ කිතුනුවන්ට ය. ජුවාම්තමා ලියූ බවට අඩමාන කරයි. ක්‍රිස්තුන් වහන්සේගේ මරණය හා උත්ථානය මගින් දෙවියන් වහන්සේගේ ගැලවීමේ ක්‍රියාව සම්පූර්ණ කළ බව
හෙළිදරව් කරයි. පීඩා විඳිනු ලැබූ කිතුනුවන්ට මෙය බලාපොරොත්තුවේ පණිවුඩයක් විය. තම
එදිනෙදා ජීවිතයේ සිද්ධීන් මගින් ක්‍රිස්තුන් වහන්සේගේ මරණයට ද, උත්ථානයට ද සහභාගිවීමට කරන ආරාධනයකි. එළිදරව් ග්‍රන්ථයේ විශේෂත්වය සංකේත මගින් ඉදිරිපත් කිරීමයි. සත්ත්ව සංකේත හා වර්ණ සංකේත යොදා ගෙන ඇත.

එනම් බැටළුවා, මකරා, මෘගයා සහ සුදු රතු වශයෙනි. මෙම ග්‍රන්ථයේ ජනවන්දනාව, ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ ධර්මය, ක්‍රිස්තු ශාසන ධර්මය, යුගාන්ත ධර්මය ආශ්‍රිතව වැදගත් කරුණු ඉදිරිපත් කර තිබේ. පීඩනයට මැදි වූ බැතිමතුන්ට පෞද්ගලිකව කියවීමට ලියූ බව ද කියැවේ.

**2.4. පැරණි ගිවිසුම හා නව ගිවිසුම අතර සම්බන්ධතාවය:**

**(අ) ගිවිසුම:**

"පුරාණ ගිවිසුම" යන පදය උපත ලැබුවේ ශු. පාවුළුතුමන්ගෙනි. - 2 කොරින්ති 3/14; හෙබ්‍රෙව් ලිපියෙහි "පළමු ගිවිසුම" (8/7) හා "දෙවන ගිවිසුම" (8/7; 9/15-20) යන පදයන් ඇත. "ගිවිසුම" (හෙබ්‍රෙව් : බරියිත්; ග්‍රීක් : ඩියාතේකේ) ශු. බයිබලයට කේන්ද්‍රීය සංකල්පයකි: උත්පත්ති 6/18, 17/1-14; නික්මයාම 19-24; ගණන් කථාව 25/6-15; ජෙරමියා 31/31-34; 1 කොරින්ති 11/23-25.

**(ආ) පැරණි ගිවිසුම හා නව ගිවිසුම අතර සම්බන්ධතාවය**

**"නව ගිවිසුම, පුරාණ ගිවිසුම තුළ සැඟවී ඇත. නව ගිවිසුම, පුරාණ ගිවිසුම එළිදරව් කරයි." (ශු. අගුස්තීනු තුමා)**

පැරණි ගිවිසුම දේව අනාවරණයේ පළමු අදියරයි. එය නව ගිවිසුම තුළින් සම්පූර්ණත්වයට පත්වේ. (හෙබ්‍රෙව් 1/1-3). මෙයින් පෙන්නුම් කෙරෙන තවත් කරුණක් නම් පැරණි ගිවිසුම හා නව ගිවිසුම කිසිසේත් වෙන් නොකළ හැකි ලෙස සම්බන්ධ වී තිබීම ය. මේ සම්බන්ධීකරණය ක්‍රිස්තුන් වහන්සේ තුළිනි. එය ක්‍රියාවට නැංවෙන්නේ එක් අතකින් ගිවිසුම් දෙක අතර ඇති සමානතාවයන් මෙන්ම වෙනස්කම් ද පැහැදිලිව ඉදිරිපත් කිරීමෙනි. මේ ලෙසින් බලන කල, පැරණි ගිවිසුම තුළ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පෙර ලකුණු දිස්වේ. ඒවායින් සමහරක් අපගේ අවධානයට යොමු කරමු.

<u>පැරණි ගිවිසුමේ ක්‍රිස්තුන් වහන්සේගේ පෙර ලකුණු</u>

පළමුවෙන් දේව වචනය හා දේව ප්‍රඥාව නිදසුනක් ලෙස ගත හැකි ය. පැරණි ගිවිසුමේ දේව වචනය හා ප්‍රඥාව යන සංකල්ප දෙවියන් වහන්සේගේ මැවීම හා සම්බන්ධය. පළමුවෙන් දේව වචනය සිද්ධීන් ඇති කරන එල දරණ බලවේගයකි. එය දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරිත්වයයි. එය ඔවුන්වහන්සේගේ ස්වභාවය හා අනිවාර්යයෙන්ම සම්බන්ධ ය (උත්පත්ති 1/1-2/4). මෙම වචනය දිවැසිවරයා තුළින් ගැලවීමදායක සිද්ධියක් ලෙසට පරිවර්තනය වේ. එය මනුෂ්‍ය හදවතට අභියෝගයක් එල්ල කරයි (යෙසායා 1). සිත් හැරීමකට මිනිසා පොළඹවයි. එය නීතිය ලෙසින් දේව කැමැත්ත ප්‍රකාශ කරයි (නික්මයාම 20/1-17). ප්‍රඥාව ද දෙවියන් වහන්සේ හා සම්බන්ධ ය. මැවීමේ කාර්යය තුළදී දෙවියන් වහන්සේ සමඟ සිටියි (උපදේශකයා 1). මේ සංකල්ප ගැබ්කර නව ගිවිසුම, ක්‍රිස්තුන් වහන්සේව දේව වචනය ලෙසත්, ප්‍රඥාව ලෙසත් ඉදිරිපත් කරයි (ජොහන් 1/1-14; එපීසි 1/3-23; කොලෝසි 1/15-20). මේ පාඨවලින් පැහැදිලි වන්නේ පැරණි ගිවිසුමේ වචනය හා ප්‍රඥාව යන සංකල්ප කස්තුන් වහන්සේ තුළ මාංශගතවී පූර්ණත්වයට පත්වීමයි.

පැරණි ගිවිසුමේ මෙසියස්තුමා පිළිබඳ දිවැසිවැකි ක්‍රිස්තුන් වහන්සේ තුළ සම්පූර්ණ වන බව සුවිශේෂයන්හි සඳහන් වේ. (මතෙව් 1/23=යෙසායා 7/14; මතෙව් 2/6=මීකා 5/2). මෙසියස් සංකල්පය පැරණි ගිවිසුම තුළ ලෞකික

රාජ්‍යයක් හා සම්බන්ධව ය. ක්‍රිස්තුන් වහන්සේ මෙසියස්තුමා ලෙස ඉදිරිපත් කෙරෙන්නේ අභ්‍යන්තර හා අධ්‍යාත්මික ගුණාංගවලින් පිරිපුන් රාජ්‍යයක මැදහත්කාරයාණන් ලෙසට ය (ජොහන් 18/33-38). නමුත් ක්‍රිස්තුන් වහන්සේ දාවිත් පරපුරින් පැමිණීමෙන් (මතෙව් 1) හා සාමයේ කුමාරයාණන් වීමෙන් (ලූක් 2/8-14) මෙසියානු සංකල්පය තහවුරු කරන සේක.

මෙලෙස යෙසායා දිවැසිවරයාගේ පොතේ සඳහන් ස්වාමීන් වහන්සේගේ දුක්විඳින සේවකයා යන අදහසත් ජේසුස් වහන්සේ තුළ සම්පූර්ණ වේ. දුක්ප්‍රාප්ති කථාව සුවිශේෂකවරුන් ඉදිරිපත් කරන්නේ යෙසායා 52/13 - 53/12 ආශ්‍රයෙන් බව තව පැහැදිලි කරුණකි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ මරණය හා උත්ථානය යන කේන්ද්‍රීය සිද්ධීන් ද පැරණි ගිවිසුම සම්පූර්ණ වීමක් ලෙස ක්‍රියා පොතේ හා පාවුළුතුමාගේ ලිපිවල ද දැකගත හැකිය. (උදා: ක්‍රියා 2/14-36; 1 කොරින්ති 1/18 - 2/16).

ක්‍රිස්තුන් වහන්සේ හා පැරණි ගිවිසුම සම්බන්ධයෙන් ඉදිරිපත් කළහැකි බොහෝ අදහස් අතර නව ප්‍රධාන සංකල්ප දෙකක් පමණක් නිදසුන් වශයෙන් ගැනීම සෑහේය, යන්න අපගේ මතයයි. ඒවා නම් ගිවිසුම හා පූජකවරයයි. නැවත නැවත ඊශ්‍රායෙල්වරුන් කඩ කළ සීනායි ගිවිසුම වෙනුවට දෙවියන් වහන්සේ නව ගිවිසුමක් ඇති කරන බවට ජෙරමියා දිවැසිවරයා මගින් ප්‍රතිඥා දෙන සේක (ජෙරමියා 31/31-34). හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද ලිපියේ කතුවරයා පවසන පරිදි ජේසුස් වහන්සේ තම ජීවිත පරිත්‍යාගය තුළින් ජෙරමියා දිවැසිවරයා සඳහන් කළ ගිවිසුම ක්‍රියාත්මක කළ බව ප්‍රබලව ප්‍රකාශ වෙයි (හෙබ්‍රෙව් 8-9). එම ජීවිත පූජාව පැරණි ගිවිසුමේ සැමදා පිදුණු පව් නසන පූජාවක් අහෝසි කර සදාතන යාගයක් ස්ථාපිත කළ බව ද උගන්වයි. නව ගිවිසුම තුළින් නව දේව ජනතාවක් ද, බිහිවී ඇති බව නව ගිවිසුම විවිධාකාරයෙන් අපට පැහැදිලි කරයි (1 පේදුරු 2/4-5; එළිදරව්ව 1/6). මෙයින් පෙනියන්නේ අසම්පූර්ණ ගිවිසුමක් සම්පූර්ණත්වයට පත්වීම ය.

ක්‍රිස්තුන් වහන්සේගේ අති උත්තම පූජකවරය ගැන ද මෙහිදී යමක් පැවසිය යුතුම ය. උන්වහන්සේගේ පූජකවරය පැරණි ගිවිසුමේ ආරොන්ගේ පූජකවරයට වඩා හාත්පසින් වෙනස් ලෙස අපට ඉදිරිපත් කෙරේ. පළමුවෙන්ම උන්වහන්සේ පැමිණෙන්නේ ජූදා ගෝත්‍රයෙන් මිස ලෙවීගේ ගෝත්‍රයෙන් නොවේ. එකල පූජකවරයන් මෙන් නොව **එක් වරක් පමණක් තමන්වහන්සේව** අන්‍යයන් සඳහා පාප පූජාවක් ලෙස ඔප්පු කළ බව හෙබ්‍රෙව් සංදේශයේ කතුවරයා පවසන්නේ පරම්පරාවෙන් එන ඊශ්‍රායෙල් පූජකවරයට උන්වහනසේ සම්බන්ධ නැති බව පෙන්වීමට ය (හෙබ්‍රෙව් 10). එසේ නම් උන්වහන්සේගේ පූජකවරයේ පදනම කුමක් ද? දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර මධ්‍යස්ථවීම ය. දේවත්වයට හා මනුෂ්‍යත්වයට පංගුකාර වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තම ජීවිත පූජාව තුළින් වෙන කිසිවෙකුට කළ නොහැකි සේ මධ්‍යස්ථ කාර්යයක් ඉටු කරමින් උත්තම පූජකවරයට පත්වීම තේරුම් ගැනීම එතරම් අපහසු නැත.

ඉහත සඳහන් කරුණුවලින් පැහැදිලි වන්නේ පැරණි ගිවිසුම හා නව ගවිසුම අතර ඇති වෙන් කළ නොහැකි සම්බන්ධතාවයයි. දේව අනාවරණයේ ඉදිරි ගමනයි.

**(ඇ) ක්‍රිස්තුන් වහන්සේ හා ශු. බයිබලය:**

ජූදා ජනතාව හෙබ්‍රෙව් බයිබලය දේව වචනය ලෙසත්, එය තම ජීවිතයටත් වඩා උතුම් ලෙසත් සැලකූහ. ජූදා ජාතිකයෙකු වූ ජේසුස් වහන්සේගේ ශු. බයිබලය වූයේ පැරණි ගිවිසුම අඩංගු හෙබ්‍රෙව් බයිබලයයි. උන්වහන්සේ දේව වචනය කෙරෙහි දැක් වූ ආකල්ප පහත පාඨයෙන් මොනවට දිස්වේ:

> ***"සැබැවින් ම මම ඔබට කියමි, අහස හා පොළොව පහව ගියත්, සියල්ල පරිපූර්ණ වනතුරු, ව්‍යවස්ථාවලියෙන් ඉස්පිල්ලක්වත් පාපිල්ලක්වත් පහවී නොයන්නේම ය. එබැවින් මේ ආඥා වලින් ඉතා සුළු එකක්වත් කඩ කරන හෝ කඩ කරන ලෙස මිනිසුන්ට උගන්වන හෝ කවරකු වුව ද, ඔහු ස්වර්ග රාජ්‍යයෙහි ඉතා සුළු යැයි කියනු ලබන්නේ ය. එහෙත් ඒවා පිළිපදින ඒවා උගන්වන කවරෙකු වුවද ඔහු ස්වර්ග රාජ්‍යයෙහි උතුම් යයි කියනු ලබන්නේ ය." (මතෙව් 5/18-19)***

(i) ජේසුස් වහන්සේ ශුද්ධ ලියවිල්ලෙහි ("ව්‍යවස්ථාවෙහි") දේව වචනය ගැබ්ව ඇති බව පිළිගත් සේක.
(ii) ශුද්ධ ලියවිල්ල අධ්‍යයනය කළ සේක. එනිසා ඒ පිළිබඳව උන්වහන්සේට තිබුණේ ගැඹුරු දැනුමකි. (ලූක් 4)
(iii) ජනතාවට ශුද්ධ ලියවිල්ල ඉගැන්වූ සේක; පහදා දුන් සේක. (ලූක් 24)
(iv) එදිනෙදා ජීවිතයේදී එය චතුර ලෙස භාවිතා කළ සේක:

- උන්වහන්සේ පරික්ෂාවන් ජයගත්තේ ද්විතීය නීති සංග්‍රහයේ වදන් ඇසුරින් පිළිතුරු දීමෙනි. 8/3, 6/16, 6/13.
- පරිසිවරුන්ගේත්, විනයධරයන්ගේත්, පූජකයන්ගේත් විවිධ අභියෝග ජය ගත්තේ ශු. ලියවිල්ල භාවිතා කිරීමෙනි.

(v) දේව වචනය අනුවම දිවි ගෙවූ සේක:
නව ගිවිසුමේ දේව වචනය වූයේ ක්‍රිස්තුන් වහන්සේම ය (ජොහන් 1/1). උන්වහන්සේ සිය "දේව වචනය" වැදෑරීමෙන් සහ චර්යාවෙන් මිනිසාව සුව කරති; බලවත් කරති; යහ මග යවති; ගොඩ නංවති; නිදහස් කරති; එකමුතු කරති.

### 2.5. ශු. බයිබලය පිළිබඳ වියත් අදහස්.

**(අ) දෙවිඳුන් මුණ ගැසීමේ, අත්දැකීමේ මාර්ගයකි:**

"ශුද්ධ ලියවිලි තුළ ස්වර්ගික පියාණන් වහන්සේ තම දරුවන් හමුවී ඉමහත් ආදරයෙන් යුක්තව ඔවුන් සමඟ සංවාදයේ යෙදෙන සේක."
(දේව ප්‍රකාශනය පිළිබඳ දෙවැනි වතිකානු ප්‍රකාශනය, අංක 21)

**(ආ) බයිබල් විශාරද රේමන්ඩ් ඊ බ්‍රවුන් පියතුමා:**

- "පශ්චාත් දේව ජනතාවට මහ පෙන්වීමක් වන, දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජනතාව හා මුල් සභාව අතර ඇති කරගත් සබැඳියාවේ මූලික අත්දැකීම ගබඩා කර ඇති ඊශ්‍රායෙලයේ හා මුල් සභාවේ පුස්තකාලය ශු. බයිබලය වේ."
  *("Responses to 101 Questions on the Bible", 29)*
- "ඊශ්‍රායෙල් ජනතාව සහ මුල් සභාව සමග දෙවින් වහන්සේගේ සම්බන්ධතා වල වාර්තාවකි."
  *("Responses to 101 Questions on the Bible", 29)*
- "සුරක්ෂිතව ලිඛිත ස්වරූපයෙන් එන අසමසම මාර්ගෝපදේශකයෙකි."
  *("Responses to 101 Questions on the Bible", 29)*
- "අතිකුත් මිනිස් කෘතින් හා සසඳද්දී, ශු. බයිබලය අසමසම, අද්විතීය හා සුවිශේෂිත ලෙස දේව වචනය වේ."
  *("Responses to 101 Questions on the Bible", 29)*

(ඈ) **ෆිලිප් සී. දිසානායක පියතුමා:**
"ශත වර්ෂ විස්සක් පමණ කාලයක් ඔස්සේ පැතිර යන පරම්පරාගත ධර්මයේ ප්‍රඥාවට අනුව එය තේරුම් කරන්නා වූ ශු. සභාව නමැති අප මෑණියන් විසින් විශ්වාසකයන් අත තබනු ලබන්නා වූ මේ ශුද්ධ ලියවිල්ල ධර්මයේ උල්පතක් මෙන්ම, තමාගේ සදාකාල ඉරණම දෙසට ගමන් කරන්නා වූ මනුෂ්‍යයාට ජීවිතයේත්, ආලෝකයේත් උල්පතක් ද වී ඇත්තේ ය." **- දේව ප්‍රකාශනය**

(ඇ) **කා(ර්)ලොස් මෙස්ට(ර්)ස්:**
"ශු. බයිබලය යනු දෙව අනාවරණය නමැති බීජයෙන් හටගත්, ජනතාවගේ විශ්වාසයේ අත්දැකීම නමැති පසෙහි පැලවුණු, ජන වන්දනාව නමැති පොහොරින් සරුවුණු, සූර්යයාලෝකය සහ වර්ෂාව නමැති ස්වර්ගික ආනුභාවයෙන් වැඩුණු, අතු පතර විහිදුණු (පොත් 73ක) ශාකයෙකි. "
" *(The Bible, A Book Born Through Toil)* "

(ඉ) **කා(ර්)ලොස් එච්. අබේසාමිස්:**
"ඊශ්‍රායෙල්වරුන්ගේ සහ මුල් සභාවේ ජීවිතයේ, අත්දැකීමේ සහ විශ්වාසයේ ලිඛිත නිෂ්පාදනය වේ."
*("Exploring the Core of Biblical Faith")*

## තුන්වන පාඩම

### 3. ශුද්ධ වූ බයිබලයේ දේවානුභාවය, කර්තෘත්වය සහ සම්මත ග්‍රන්ථ:-

#### 3.1. දේවානුභාවය සහ කර්තෘත්වය.

- පුරාණ ගිවිසුමේ සඳහන් අයට දේව අනාවරණය පිළිබඳ අත්දැකීම් ලැබී ඇත. ඒවා ලියා ඇත. මේ අත්දැකීම් ලියද්දී දෙවියන් වහන්සේ විසින් අනාවරණය කරන ලද්දේ, දේව වචනය ලෙස ඉදිරිපත් කරන ලදී. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ මෙහෙයවීමක් ඇතිව විශේෂ ලෙස තෝරා ගත් පුද්ගලයන් මගින් අනාවරණය කරන ලද දේ දේව පණිවිඩය ඉදිරිපත් කිරීම "දේවානුභාවය" ලෙස හඳුන්වා දිය හැක.

  අනාවරණය කරන ලද මේ දේව පණිවිඩය අභිරහස්මක ය .මේ පණිවිඩ ලියන ලද ලේඛකයන් ,ඔවුන්ගේ ව්‍යවහාර භාෂාවෙන් ලේඛනගත කරද්දී දෙවියන් වහන්සේ ඔවුන් සමඟ සිටි සේක. එම සම්බන්ධතාව පැහැදිලි කිරීම අපහසු ය. ඒ ද අභිරහස්මක ය.

- මෙසේ මනුෂ්‍යයන් කෙරේ බලපෑ දෙවියන් වහන්සේ දේවානුභාවය මිනිසා තුළ ක්‍රියාකාරී වේ. විශේෂ වැදගත් අවස්ථා වලදී එය වඩාත් ක්‍රියාකාරී වේ. පැරණි ගිවිසුමේ ඉශ්‍රායෙල් ජන ජීවිතයේ සෑම විශේෂ සිද්ධියක් තුළම, සිද්ධිමාලා තුළම දෙවි සමිඳුන්ගේ දේවානුභාවය මිනිසා තුළ ක්‍රියාත්මක වූ බව පෙනේ. එය "එඩේරික දේවානුභාවය" නමින් හැඳින්වේ.

<u>උදාහරණ</u>

- "එවිට සාමුවෙල් තෙල් කුලාව රැගෙන ඒ තැනැත්තා ඔහුගේ සහෝදරයන් ඉදිරියේ අභිෂේක කළේ ය. එදින පටන් ස්වාමීන් වහන්සේ ගේ ආත්මානුභාවය දාවිත් කෙරේ පිහිටිණි" (1 සාමුවෙල් 16:13).
- "එහෙත් ඔවුහු තමන්ගේ ශුද්ධාත්මානුභාවය ඔහුට දුන් තැනැත්වහන්සේ කොහේද? " මෙසේ ප්‍රශ්න කළහ. (යසායා 63:11).
- දෙවියන් වහන්සේගේ දේවානුභාවය කථනය තුළින් ද නික්මෙන බව උන්වහන්සේ ගේ වචන වලින් ඉදිරිපත් කළ හැක. එය "වාචික දේවානුභාවය" නම් වේ.

<u>උදාහරණ</u>

- "නුඹලා කෙරෙහි පවරා ඇති මාගේ ආත්මානුභාවය ද , නුඹලා ගේ මුඛයෙන්වත් , නුඹලාගේ දරුවන්ගේ මුඛයෙන්වත් , ඔවුන්ගේ දරුවන්ගේ මුඛයෙන් වත් මෙතැන් සිට සදාකාලයටම පහ නොවන්නේ ය." (යෙසායා 59:21).
- " ඔබ කිවයුතු දේ ඒ මොහොතේදී ම ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබට දන්වනු ඇත." (ලූක් 12:11- 12)
- " මන්ද කිසිම දිවැස් වැකියක් කිසි කලෙක මනුෂ්‍ය ප්‍රයත්නයකින් ඇති නොවී ය. මනුෂ්‍යයෝ ශුද්ධාත්ම ආනුභාවයෙන් පොළඹවනු ලැබ දෙවියන් වහන්සේගේ වචනය කථා කළහ."(2 පේදුරු 1:21).

- ස්වාමීන් වහන්සේ සිය වචනය හා යම් යම් සිද්ධීන් ලියා තබන ලෙස නියෝග කිරීමක්, යොමු කිරීමක් දක්නට ඇත. එම ලේඛන ක්‍රියාව "ලේඛන දේවානුභාවය" වේ.

<u>උදාහරණ</u>

- එවිට ස්වාමීන් වහන්සේ මෝසෙස් අමතමින්, මෙය සිහිවන පිණිස මම අමලෙක්වරුන් ගැන මතකක් නැති වනසේ මිහිපිටින් ඔවුන් සම්පූර්ණයෙන් මකා දමමියි පොතක ලියා ජෝෂුවාට ඇසෙන පරිදි කියන්නැයි වදාළ සේක. (නික්මයාම 17:14).
- සෙනගගේ ස්වභාවය සම්බන්ධයෙන් ඔවුන්ට විරුද්ධව ගල් පුවරුවක සටහන් කරන්න. ඔවුන් ගැන විස්තරයක් අනාගතයට සදා සාක්ෂියක් මෙන් පවතින ලෙස පොතක ලියා තබන්නැයි දෙවිඳාණෝ මට වදාළ සේක. (යෙසායා 30:8)
- මා නුඹට කී සියලු වචන පොතට ලියන්න (ජෙරමියා 30:2).

දෙවියන් වහන්සේ ශු. බයිබලය ලියූ අයව විශේෂාකාර පෙළඹවීමකට සහභාගි කර ගත් සේක. ලේඛන කාර්යය සඳහා දායක වූ ඔවුන් කෙරෙහි බල පෑ දේවානුභාවයේ තරම ප්‍රමාණ කිරීම අපහසු ය. දෙවියන් වහන්සේ විසින් මනුෂ්‍යයාට දෙන ලද නිදහස් කැමැත්ත තුළ ඔවුන්ගේ අදහස් වලට, තීරණ වලට බලපෑමක් නොකළ සේක. දෙවියන් වහන්සේ විසින් මනුෂ්‍යයන්ගේ නිදහස හෙවත් ස්වාධීනත්වය බාධාකිරීමකින් තොරව මෙහෙයවන ලදහ.

මැවීමේ දී ඔවුන්ට තිළිණ කරන ලද ඒ උතුම් තත්ත්වය රැකෙන අයුරින් තමන් ජීවත්වන පරිසරය, සමාජ චින්තනය, අදහස් උදහස්, සිතුම් පැතුම් ආශ්‍රයෙන් ඔවුන්ගේ ව්‍යවහාරික භාෂා මාධ්‍යයෙන් ලිවීමට අවස්ථාව සලසා ඇත.

කතෝලික දර්ශනය අනුව මෙම සිද්ධිය අභිරහසකි. පණිවිඩය නම් කුමක්දැයි හඳුන්වා දුන්නොත්, එය මිනිසාට සිය දෛනික ජීවිත කටයුතු වලදී විවිධාකාරයෙන් ලැබෙන්නෙකි. මේ පණිවිඩ වලින් සමහර ඒවා සාවද්‍ය හෝ නිරවද්‍ය හෝ පණිවිඩ විය හැක. ශු. බයිබලයේ පණිවිඩ ගැන කථා කරද්දී දේවානුභාවය පිළිගන්න කිතුනුවාට බයිබලයේ සෑම පණිවිඩයක් ම දේව පණිවිඩයක් වන නිසා අනිවාර්යයෙන් ම එම පණිවිඩය දේව පණිවිඩයක් ම වේ.

යම් කෙනෙක් ශු. බයිබලයේ පණිවිඩයකින් තොමඟ යවන සුලු පණිවිඩයක් ලබා ගනී නම් එයට වගකිව යුත්තේ ශු. බයිබලයේ ප්‍රධාන කර්තෘ වන දෙවියන් වහන්සේ හෝ උප කර්තෘවරුන් හෝ නොව විකෘති අර්ථකථන දෙන පුද්ගලයෝ ය.

මුළු බයිබලය ම සමස්තයක් ලෙස ගත් කල දක්නට ලැබෙන්නේ කථා හා පණිවිඩ වේ. සාමාන්‍යයෙන් අප කථාන්තර ගැන කථා කරන විට ඒවා වර්ග කල හැක්කේ මෙසේ ය.

- සමහර කථා වස්තු ඉතිහාසයට අනුව සිදුවූ සත්‍ය සිද්ධි වේ. උදා : ශු. බයිබලයේ අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ සඳහන් සමහර සිද්ධි.
- තවත් වර්ගයක කථා ඇත. එම කථාවල සමහර සිද්ධීන් පමණක් සත්‍ය වූ අතර, එම සිද්ධීන් ගැන ඉදිරිපත් කරන විස්තර සාවද්‍ය ය විය හැක. කාලයාගේ ඇවෑමෙන් ඒ බොරුවක් බව සනාථ විය හැක.
  උදා: ශු. බයිබලයේ ජේසුස් වහන්සේ ගැන සඳහන් කරන සමහර සිද්ධි.
- ඊළඟ වර්ගයේ කථාන්තර මිථ්‍යා කථා ලෙස හැඳින්වේ. මේ කථා වස්තු වලට කේන්ද්‍රගත වූ සිද්ධිය බොහෝවිට එකල මිනිසුන් තුළ වූ විශ්වාසය අනුව නිර්මාණය වුවකි.
  උදා: ශු. බයිබලයේ ලොත්ගේ භාර්යාව ලුණු කණුවක් වීම. ඊසාක් යාග කිරීම ආදිය.
- මෙම වර්ගවලට අමතරව ස්වභාව සිද්ධීන්ගෙන් වෙනස් වූ, සම්පූර්ණයෙන් ම මනඃකල්පිත වූ වෙනත් කථා ද ඇත. ඒ උපමා නම් වේ. නමුත් ගැඹුරු පණිවිඩයක් එහි ඇතුළත්වේ.
  උදා: ශු. බයිබලයේ නාස්තිකාර පුත්‍රයා, යහපත් සමරිතානුවරයා, ජෝබ්ගේ කථාව.

ශු. බයිබලයේ අඩංගු සමහර කථා පොදුවේ ගත් විට සත්‍ය සිද්ධීන් ලෙසින් ගත හැකි අතර, තවත් කථා අදහාගත නොහැකි සිද්ධිගෙන් යුත් කථා සැටියට ද දැක්විය හැක. එම කථා කාලයාගේ ඇවෑමෙන් සත්‍යයෙන් තොර කථා සැටියට අද පිළිගෙන ඇත. ඒ අනුව දේවානුභාවය, මනුෂ්‍යාගේ බුද්ධිමය චින්තන හැකියාව මොට නොකර තවත් වර්ධනයවීමට සලසා ඇතැයි කිව හැක.

ශු. බයිබලයේ ප්‍රධාන සහ උප කර්තෘවරු ඇත. ප්‍රධාන කර්තෘ දෙවියන් වහන්සේගේ ය. උප කර්තෘවරු මිනිසා ය. ප්‍රධාන කර්තෘ විසින් උප කර්තෘන් මෙහෙයවන ලද්දේ ප්‍රධාන කර්තෘගේ පණිවිඩ දීම පිණිස ය. එම නිසා ශු.බයිබලය මනුෂ්‍ය ලේඛකයින් විසින් ලියන ලද බැවින් එය මානුෂික වේ. එය දේවානුභාවයෙන් ලියන ලද බැවින් දිව්‍යමය වේ.

ශු. බයිබලයේ ඉශ්‍රායෙල් ජනතාව ගේ මුළු ඉතිහාසය පුරාම සඳහන් වන්නේ, දෙවියන් වහන්සේ ගේ වැඩ සිටීමයි. සතුරු ආක්‍රමණ, යුද්ධ වල දී ලත් ජය පරාජය පිළිබඳ මිනිසුන් තුළ පැවති ආකල්පය වූයේ මේ සෑම සිදුවීමකටම දෙවියන් වහන්සේ කේන්ද්‍රියව වැඩ සිටින බව ය.

සතුරු ආක්‍රමණයක දී ලත් පරාජය ගිවිසුම කඩ කිරීම දෙවියන් වහන්සේ දැනුවත්ව, උන්වහන්සේගේ ජනතාව ගිවිසුම කඩ කිරීම නිසා ලත් දඬුවමක් විය. එවිට ඔවුහු සිත් හැරීම සඳහා පසුතැවිලිව කන්නලව් කළහ. එවිට සතුරු උපද්‍රව්‍යයන්ගෙන් ඔවුන් මුදාගැනීම නිදසුනක් ලෙස දැක්විය හැක. එසේම මේ ඓතිහාසික විස්තරයත් සමග එවකට පැවති ජනකථා හා ඔවුන් විසින්ම ප්‍රබන්ධ කරන ලද කථා ද විය.

මේ සියළු කථා පිටුපස යම් පරමාර්ථයක් ද විය. එය ධාර්මික ඉගැන්වීමක් ඉදිරිපත් කිරීම සඳහා ය. ආබ්‍රහම් මිසර දේශයට පැමිණි විට වූ සිද්ධිය (උත්පත්ති 12: 10-20), ලොත්ගේ භාර්යාව ලුණු කණුවක් වීම (උත්පත්ති 19:26) මීට හොඳ නිදසුන් ය. මේ අනුව පෙනී යන්නේ, උප කර්තෘවරු දේවානුභාවයෙන් මෙහෙයවී ඔවුන්ගේ නිදහස සීමා කිරීමකින් හෝ බලපෑම් කිරීමකින් තොරව ප්‍රධාන කර්තෘට අවශ්‍යවූ පණිවිඩය ඉදිරිපත් කිරීමයි. ලේඛනයේදී පරිසරයේ බලපෑම විශේෂ වී ඇත. ස්වභාව ධර්මයේ කර්තෘ දෙවියන් වහන්සේ ය. එහෙයින් උප කර්තෘවරු තමන් කෙරේ බල පෑ පරිසරයේ ආභාසයෙන් දෙවියන් වහන්සේට අවශ්‍ය වූ පණිවිඩය ඉදිරිපත් කළහ.

නිදසුන් පැහැදිලි කළොත්, "ගසක් ඇඳිමට වුවමනා වූ විට පරිසර දෙකක ජීවත්වන දෙදෙනෙක් ඔවුන් දැක පුරුදු ඉන්ද්‍රිය ගෝචර වූ ගසක් අඳිනු ඇත. දෙදෙනාට ම ගස පොදු ය. නිවැරදි ය. එහෙත් ඉදිරිපත් කළ ස්වරූපයේ විවිධත්වයක් ඇත. ඒ ආකාරයෙන් දෙවියන් වහන්සේගේ පණිවිඩය මිනිස් කතුවරයා සිය සංවේන්ද්‍රියන්ගේ උපකාරිත්වය කරණකොට ගෙන ලබාගත් අදහස් වචනයට නගා ලිවී ය. එම අදහස් තත්කාලික ව්‍යවහාරික භාෂා මාධ්‍යය භාවිත කොට, ඔවුන්ගේ සිතුම් පැතුම්, ආකල්ප හා සංස්කෘතික අගයයන්, සිරිත් විරිත්, සම්ප්‍රදායයන් ද යොදා ගෙන ලේඛන ගත කළහ. එහිදී කල්පනා කිරීම, තීරණ ගැනීම, ප්‍රකාශ කිරීම (භාෂාව) ආදී අවස්ථාවලදී ස්වාධීනව සිය අත්දැකීම් තෝරා බේරා ඉදිරිපත් කිරීමට නිදහසක් තිබුණි. ඒ අනුව උප කර්තෘවරු ප්‍රධාන කර්තෘගේ පණිවිඩය සිය හුරු පුරුදු භාෂා මාධ්‍යයට නගා නිදහස් කැමැත්තෙන් ඉදිරිපත් කළ බව පැහැදිලි ය.

දේවානුභාවය පිළිබඳව දෙවන වතිකානු ප්‍රකාශනයේ සඳහන් වන්නේ ශු ලියවිලිවල අඩංගු සියළුම සත්‍යයන් දේවානුභාවයෙන් යුක්ත බව ය. පැරණි හා නව ගිවිසුමේ අඩංගු සියළුම ග්‍රන්ථවල කර්තෘ දෙවියන් වහන්සේ ය. එම ග්‍රන්ථ වල ඇත්තේ දේව වචනයම නිසාත්, ග්‍රන්ථ වශයෙන් සභාවට ලැබී ඇති නිසාත්, එහි ශුද්ධවත් බව අපෝස්තලික විශ්වාසයට එකඟව සභාව පිළිගනියි. ශු. බයිබලය සම්පාදනයේ දී දෙවියන් වහන්සේ ඒ සඳහා ඇතැම් අය තෝරා ගත් සේක. එලෙස තෝරා ගත් අය තම හැකියාවන් ප්‍රයෝජනයට ගත්හ.

මෙම අවස්ථාවලදී දෙවියන් වහන්සේ ඔවුන් තුළ, ඔවුන් මගින් ක්‍රියා කළ සේක. ඔවුහු අවංක කර්තෘවරුන් මෙන් දෙවියන් වහන්සේ අදහස් කළ සියලු දේ ලියූහ. එබැවින් මෙම ලේඛකයන් ප්‍රකාශ කළ සෑම දේ ශුද්ධාත්ම වරමින් ලියවුණු බව සැලකිය යුතුවාක් මෙන්ම එම ලියවිලි වලින් අප ගැලවීම සඳහා දෙවියන් වහන්සේ අදහස් කළ සත්‍යයන්, ස්ථිරවම, විශ්වාසවන්තව, නිවැරදිව ප්‍රකාශ වන බව ද පිළිගත යුතු ය. (දේව ප්‍රකාශන අංක ii ).

දේවානුභාවයෙන් යුත් මුළු ශු. ලියවිල්ල ඉගැන්වීමට ද, දුර්මත දුරුකිරීමට ද හික්මවීමට ද, ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීම පිණිස උපදෙස් දීමට ද ප්‍රයෝජනවත් වෙයි. (2 තිමති 3:16-17) යනුවෙන් ලියා ඇත්තේ එහෙයිනි.

දෙවියන් වහන්සේගේ ප්‍රකාශන ශුද්ධාත්මානුභාවයෙන් ලේඛනගත කිරීමට ලැබුණු මේ ලෝකෝත්තර බලය, ස්ප්‍රිතුව, දේවානුභාවය වේ. එම බලය අස්භාවික හෝ දර්ශනයක් හෝ පරවසම් වීමක් හෝ නොවේ. සැබවින්ම එම ලේඛකයන්ගේ දක්ෂතා ප්‍රයෝජනයට ගනිමින් ඔවුන්ගේ අනන්‍යතාවයට හානියක් නොකර ඔවුන්ට ආවේණික

සිතුවිලි, භාෂාව හා සාහිත්‍යය, ලේඛන ශෛලිය , පදමාලාව යොදාගෙන සිය ලේඛන කුසලතාවය වර්ධනය කර ගැනීමට මේ දේවානුභාවය උදව් වී ඇත.

එමනිසා,

- ශු. බයිබලය වෙන් වෙන් වශයෙන් එකතු කරන ලද පොත් සමූහයක් නොවේ. ඒ ජීව වස්තුවකි.
- දේවානුභාවය ලද ලේඛකයා ලියූ දේ තුළ, දේව අනාවරණය ලැබෙන්නේ කියවන පාඨකයාට ය.
- දෙවියන් වහන්සේගේ සහභාගිත්වය හා ලේඛකයා අතර සම්බන්ධතාවය තේරුම් ගත යුත්තේ ප්‍රධාන හේතු හා උපකාරක හේතු අතර ඇති සම්බන්ධතාවය ඇසුරෙනි. උපකාරක කර්තෘගේ සංනිවේදනයේ අඩු පාඩු ප්‍රධාන කර්තෘගේ උපකාරයෙන් අවම විය.

දිවැසිවරු දේව වචනය තමන්ට ආවේණික භාෂා විලාශයෙන් දේශනා කළහ. තමන්ගේ පරිසරය, භාෂාව, සමාජ රටාව ආදි සාධක මෙහි ලා පාදක වූ අතර දේවාත්මයාණෝ මේ සාධක අතර ගුප්තාකාරයෙන් ද සහාය වූහ.

වර්තමානයේ මෙන් නොව අතීතයේ දී ග්‍රන්ථයක කර්තෘත්වය පැවරුණේ එක් රචකයෙකුට නොවේ. රචක කණ්ඩායමකටය. එබැවින් පුරාණ ලේඛකයා හා එම ලේඛනය යම් කිසි කණ්ඩායමකට අයත් ලෙස සැලකේ. ඒ අනුව,

- ප්‍රථමයෙන් කණ්ඩායමට ලැබුණු දේවානුභාවයෙන් කණ්ඩායමේ කර්තෘවරු දේව වචනය කථා කළහ. ලියූහ.
- කණ්ඩායමට පොදුවේ ද, රචකයාට පෞද්ගලිකව ද දේවානුභාවය ලැබී දේව පණිවිඩය ප්‍රකාශ කළහ. ලියූහ.

දෙවියන් වහන්සේ ශු. ලියවිල්ලේ කර්තෘවරයාණෝ ය. උන්වහන්සේ තම පුත්‍රයාණන් මගන් අපොස්තලික සභාව තුළදී අනාවරණය වන සේක. අපෙස්තලික සභාව තම විශ්වාසය ලියා තැබීය.

ඒ අනුව සමහර විට ඉශ්‍රායෙල් ජනතාව සහ සභාව ශු. බයිබලයේ සැබෑ කර්තෘවරයා ලෙස සැලකිය හැක. එක් එක්කෙනා තම කාර්යය ඉටු කරන ලද්දේ නියෝජිතයන් ලෙසය. මෙම ගණයට පුරාණ ගිවිසුමේ ආදි පියවරු, පූජකවරු, දිවැසිවරු, ප්‍රඥාවන්තයෝ ආදිහු ද, නව ගිවිසුමේ අපෝස්තුළුවරු ද ඇතුළත් වෙති.

<u>**මතක තබා ගත යුතු කරුණු කිහිපයක්:**</u>

- ශු. බයිබලයේ අඩංගු අදහස්, මිනිස් කතුවරයා ඉදිරිපත් කර ඇත්තේ, ඔහු තේරුම් ගත් ආකාරයෙනි. මේවා හරිහැටි අවබෝධ කර ගැනීමට හා සත්‍යය ලෙස පිළිගැනීමට නම් එම කර්තෘවරු කරුණු ඉදිරිපත් කරන විධි ගැන නිවැරදි අවබෝධයක් ලබා ගත යුතු ය.
- වරදින සුලු මිනිස් කර්තෘ, නොවරදින සුලු කර්තෘට වඩා වෙනස් ය. සමහර අවස්ථාවල දි මිනිසා පිළිගත් සාවද්‍ය ඇදහීම් ලියවිලි තුළින් දැකිය හැක.
- බයිබලයේ නොවරදින සුලුභාවය ගැන කථා කිරිමේදී පෙරදිගවාසීන් සිතන ආකාරය හා සෙමිතික් භාෂාවල විශේෂතා ගැන ද සැලකිය යුතු ය. පෙරදිගවාසීහු අධ්‍යාත්ම විද්‍යාව හා හේතු විද්‍යාව අගිබවා නොගියහ.
- සමහරවිට මිනිස් කර්තෘ ලේඛනයට මුල් වූ සිද්ධියේ නියම යථාර්ථවාදි ස්වභාවයට වඩා බාහිර පෙනුමට තැන දෙමින් විස්තර කරයි.
- බයිබලයේ ඒකියභාවය නිතර ආරක්ෂා කළයුතු නිසා බයිබලයේ කිසිම කොටසක අදහස හෝ අර්ථය වෙනත් කොටසක අදහසට හෝ අර්ථයට පරස්පර විරෝධී විය නොහැක.

බයිබලය විද්‍යාත්මක ග්‍රන්ථයක් නොවේ. එහි ජනප්‍රිය භාෂා විලාශය නූතන විද්‍යාවේ මතිමතාන්තර හා කිසිදිනක සැසඳිය නොහැක.

උප කර්තෘ ක්‍රියා කරන්නේ ප්‍රධාන කර්තෘ විසින් සන්නිවේදනය කරනු ලබන බලයෙනි. එම සන්නිවේදනය විවිධාකාරය. දේවානුභාවය ශු. බයිබලයේ සෑම කොටසකම, සෑම පොතකම අඩංගු වේ. වාක්‍යයක පමණක් නොව වාක්‍යාංශයක පවා අන්තර්ගත වේ.

<u>**දේවානුභාවය මෙසේ කැටිකර, වර්ග කර දැක්විය හැක:**</u>

- **එඩේරික දේවානුභාවය (ක්‍රියා)**: ක්‍රියාකාරිවීම සඳහා ලැබෙන දේවානුභාවය වේ. පූජකයින් සහ නායකයින් මෙතුමා මෙහෙයවන ලදී. (යෙසායා 59/21)
- **වාචික දේවානුභාවය** : දේව වචනය ප්‍රකාශ කිරීම සඳහා ලැබෙන දේව අනුග්‍රහය වේ. දිවැසිවරුනට හා අපෝතුළුවරුනට මෙය උරුම විය. (ලූක් 12: 11-12).
- **ලේඛක දේවානුභාවය** : ඉහත සඳහන් කළ දෙවිධිය තවදුරටත් ක්‍රියාකාරි කිරීම. ලේඛනගත කිරීම සඳහා ලැබෙන දේවානුභාවය වේ. ( නික්මයාම 17/14)

<u>**ශු බයිබලය දේවානුභාවයෙන් ලියැවී ඇති බවට ශු. සභාවේ ප්‍රකාශන**</u> :

- හීබෲ, ග්‍රීක වැනි ලිඛිත භාෂා වෙනුවට ප්‍රථම වතාවට ව්‍යවහාර භාෂාවකින් එනම් ජර්මන් භාෂාවෙන් ශු. බයිබලය ලියා ඉදිරිපත් කරන ලද්දේ ක්‍රි.ව. 1527 දී මාටින් ලූතර් විසින් ය. ක්‍රි.ව. 395 දී ප්‍රථම වතාවට බයිබලයේ මුල් භාෂා දෙකෙන් වෙනත් භාෂාවකට එනම් ලතින් භාෂාවට මුළුමනින් පරිවර්තනය කරන ලද්දේ ශු. ජෙරොම් තුමා ය.
- ක්‍රි.ව.1893 ද XIII ලියෝ පාප්වහන්සේ, ප්‍රොවිඩෙන්ටිසිමියුස් ඩේවුස්, නම් විශ්ව ලේඛනය මගින් දේව සංරක්ෂණය ගැනත්, පුරාණ ගිවිසුමේ හා නව ගිවිසුමේ ප්‍රධාන සංස්කාරක දෙවියන් වහන්සේ බවත් ප්‍රකාශ කළහ. (PROVINDENTISSIMUS DEUS )

- ක්‍රි.ව.1920 මාර්තු 15 දින XV බෙනඩික් පාප්තුමාගේ -ස්පරිටුස් පරාක්ලිටුස් SPRITUS PARACLITUS නැමැති ප්‍රකාශයෙන් මුළු බයිබලයම (මුල සිට අග දක්වා ) දේවානුභාවයෙන් යුක්ත බව ප්‍රකාශ විණි.
- ක්‍රි.ව.1943 සැප්තැම්බර් 30 සිට XII පියුස් පාප්තුමාගේ - ඩිවයිනෝ ඇෆ්ලාන්ටේ ස්ප්‍රිතු - DIVINO AFFLANTE SPIRITU නම් ප්‍රකාශනයෙන් ද දේවානුභාවය ගැන සඳහන් වේ.
- ක්‍රි.ව.1965 නොවැම්බර් 18 දින දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ, ඩෙයි වර්බුම් - DEI VERBUM නම් ප්‍රකාශනයෙන් ශු. බයිබලය දේවානුභාවයෙන් ලියැවී ඇති බව සඳහන් කෙරේ.

<u>ප්‍රකාශනවල සාරාංශය</u>

- දැනුම හෝ ඥානය පමණක් නොව මිනිස් කතුවරුන්ගේ සියලුම ක්‍රියා ශුද්ධාත්මානුභාවයෙන් ක්‍රියාත්මකවූ බව.
- මිනිස් කර්තෘන් පමණක් නොව ඔවුන්ට අනුබල දුන් සැම කෙනෙකුගේ ද දැනුම හා ක්‍රියා ශුද්ධාත්මානුභාවයෙන් ක්‍රියාත්මකවූ බව.
- අර්ථකථණය ඇතුළුව මුළු ශු. බයිබලයම ශුද්ධාත්මානුභාවයෙන් ලියැවී ඇති බව.

**3.2. සම්මත හා ද්විතීය සම්මත ග්‍රන්ථ.**

රෝමානු කතෝලික සභාවේ ඉගැන්වීම අනුව පැරණි ගිවිසුම් පොත් 46කි. එහෙත් රෙපරමාදු සභා හා ජුදාවරුන් පිලිගත්තේ එහි පොත් 39ක් පමණක් දේවානුභාවයෙන් ලියැවී ඇති බවයි. මේ අනුව උපදේශකයාගේ පොත, සලමොන්ගේ ප්‍රඥාව, තෝබිත්, ජුඩිත්, බාරුක්, මකබිවරුන්ගේ පොත් දෙක සමඟ දානියෙල් (13, 14, පරිච්ජේද) හා එස්තර් (වගන්ති 101) යන ග්‍රන්ථවල වැඩි කොටස් ද හෙබ්‍රෙව් බයිබලයේ සම්මත පිටපතේ දක්නට නොලැබේ. හෙබ්‍රෙව් බයිබලයේ හෙවත් ජුදා පැරණි ගිවිසුමේ සියළුම පොත් පිළිගන්නා අපි ඒවාට සම්මත පොත් යයි කියමු. මේවාට අමතරව ඉහත නම් කර ඇති පොත් ද්විතීය සම්මත ග්‍රන්ථ ලෙස හඳුන්වමු. හේබ්‍රෙව් බයිබලයේ දක්නට නොලැබෙන මේවා දේවානුභාවයෙන් ලියැවී ඇති බව කතෝලික සභාව පිළිගන්නේ කුමන හේතු නිසා ද කියා සොයා බලමු.

**(අ) පැරණි ගිවිසුමේ ප්‍රධානතම පිටපත**

සම්මත හා ද්විතීය සම්මත ග්‍රන්ථ පිළිබඳ ගැටළුව බයිබලයේ පැරණිත ම මුල් පිටපත් වල ඇති විවිධතාවයන් හා සම්බන්ධව ය. එම නිසා ඒ පිටපත් අධ්‍යයනයට භාජනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. අපගේ ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා සමහර හෙබ්‍රෙව් හා ග්‍රීක් පිටපත් පමණක් අවධානයට යොමු කරමු. හෙබ්‍රෙව් පිටපත්වල විවිධතාවයන් බයිබලීය විශේෂඥයන් තේරුම් කරන්නේ ඒවා ත්‍රිවිධ ලේඛන සම්ප්‍රදායන් අනුව ගොඩ නැගී ඇති බව ඉදිරිපත් කිරීමෙනි. ඔවුහු ඒවා පලස්තීන ලේඛන සම්ප්‍රදාය, අලෙක්සැන්ඩ්‍රියානු ලේඛන සම්ප්‍රදාය හා බබිලෝනියානු ලේඛන සම්ප්‍රදාය අනුව වර්ග කරති.

**I. සම්මත හෙබ්‍රෙව් පිටපත හෙවත් මැසොරෙටික් පිටපත**

ක්‍රි.ව.10 වෙනි ශත වර්ෂයට අයත් මෙය බැබිලෝනියන් ලේඛන සම්ප්‍රදායට අයිති ය. බයිබලයේ හෙබ්‍රෙව් පිටපත් වලට ක්‍රි.ව. 6 වෙනි ශත වර්ෂයේදි පමණ ස්වර ක්‍රමය ඇතුලත් කළ සම්ප්‍රදායලෝලි මැසොරෙටික්වරුන් හෙවත් මසොරිවරුන් සම්බන්ධ කර මෙය මැසොරෙටික් පිටපත නමින් හැඳින්වේ. කලින් සඳහන් කළ පරිදි මෙහි අඩංගු වන්නේ බයිබලීය ග්‍රන්ථ 39ක් පමණි. මෙසේ පොත් 39කට සීමාවීම ජෙරුසලෙමට බටහිරින් පිහිටි මධ්‍යධරණී මුහුද අසබඩ කුඩා නගරයක් වූ ජම්නියා හි (ජබ්නේ) ක්‍රි.ව.90 පමණ පැවැත් වූ රබ්බිවරුන්ගේ මන්ත්‍රණ සභාවේ තීරණ අනුව සිදුවූවක් යැයි සමහර විශේෂඥයෝ පවසති. මේ කරුණ උග්‍ර ලෙස විවාදයට භාජනය වී ඇත. මේ කරුණ සම්බන්ධයෙන් ඇසිය යුතු ප්‍රශ්න කිපයකි.

(අ) ජම්නියාවේ එකල තිබුනේ නීතිය හදාරණ පාසලක් ද නැතහොත් ශුද්ධ ලියවිලි පිළිබඳ රබ්බිවරුන්ගේ සමුළුවක්ද? මෙයට සැහීමට පත් විය හැකි පිළිතුරක් නැත.

(ආ) ජම්නියාවේ සම්මත පොත් පිළිබඳ ලේඛකයන්ට කුමක්වී ද?

(ඇ) කිනම් ග්‍රන්ථ සම්මත ලැයිස්තුවෙන් බැහැර කිරීම සම්බන්ධ සටහන් ගැන සඳහනක් නැත්තේ කුමක් නිසාද?

ඉහත සඳහන් ප්‍රශ්න නිරාකරණය කිරීම ඉතා දුෂ්කර ය. එම නිසා ජම්නියාවේ සම්මත පොත් ගණන තීරණය වූයේ යැයි කීම උගහට ය.

**II. කුම්රාන් පිටපත්**

ක්‍රි.ව.1947-1956 දක්වා කාලයේ මළ මුහුද අසල ගුහාවල තබී සම්භවූන පැරණි ලිපිලේඛන රාශියකි. මේවා අතර සම්මත හෙබ්‍රෙව් බයිබලයේ අනෙකුත් සියළුම පොත් සුළු වශයෙන් හෝ දක්නට ඇත. තව ද ද්විතීය සම්මත ග්‍රන්ථ අතුරෙන් සලමොන්ගේ ප්‍රඥාව, ජුඩිත් හා මකබිවරුන්ගේ පොත් දෙක ද එහි නොතිබුණි. මීට අමතරව ක්‍රි.පූ.135 - ක්‍රි.ව.68 දක්වා පමණ කාලයේ එහි විසූ කුම්රාන්වරුන්ගේ හෙවත් එසීනවරුන්ගේ වෙනත් කෘතීන් ද සොයා ගන්නා ලදී. එසීනවරු ජෙරුසලෙමේ පූජක පෙළපතට නැකම් කියන්නන් ලෙස ඔවුන්ගේ ලියකියවිලි වලින් පෙනීයයි. ජෙරුසලමේ දේවමන්දිරයේ වත්පිළිවෙත්වලට ඔවුන් සහභාගි නොවීම, ඔවුන්ගේ ලේඛන තුළ දැකිය හැකි ජෙරුසලමේ පූජක පැලැන්තියේ දැඩි විවේචන , නැවත දේව මාලිගාවට ගොස් නව ක්‍රමයකට වත්පිලිවෙත් පැවැත්වීම යන මේ දේවල් විශේෂඥයන් තේරුම් කරන්නේ එසීනවරු පූජකවරුන් හා සම්බන්ධ කොටසක් සැටියට ය. ඔවුහු දැඩි මර්ධන ක්‍රියාවලින් යුත් තාපස ජීවිත ගත කළහ.

මෙහි සම්භ වූ පිටපත් අතුරෙන් නික්මයාම ග්‍රන්ථ පිටපතේ කොටසක් ක්‍රි.පූ. 3 වෙනි ශත වර්ෂයේ මුල් භාගයෙන් බව පිළිගැනේ. ඒවා හෙබ්‍රෙව් බයිබල් පිටපත් අතුරෙන් ඉතා පැරණි ඒවා ලෙස සැලකේ. මේ පිටපත් අඩුවශයෙන් මැසරෙටික් පිටපතට වඩා අවුරුදු 1000 පමණ පැරණි ය. ඒවා පලස්තීන ලේඛන සම්ප්‍රදායට අයිති ය. මැසෙරෙටික් පිටපත හා සංසන්දනය කර බලන විට කුම්රාන් පිටපත්වල වෙනස්කම් දක්නට ඇත. එස්තර්ගේ පොත පිළිබඳව එහි හෝඩුවාවක් පමණවත් නැතිවීමෙන් පෙනීයන්නේ මෙය එසීනවරුන් විසින් ප්‍රතික්ෂේප කිරීම ද? එසේ විය හැක. පළමුවෙන් එස්තර්ගේ පොතේ ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවියන් වහන්සේගේ නම (යාවේ) නොතිබීමත්, එහි <u>පුරීම්</u> නමැති පසුකාලීන විනෝදකාමීත්වයෙන් පිරි

මංගල්‍ය ඉස්මතු කිරීමත් මෙසේ ප්‍රතික්ෂේප කරනු ලැබීමට හේතු වූ බව පෙනීයයි. මේ කරුණු වලින් පෙනියන්නේ සම්මත යයි ගැණුනු බයිබලීය පොත් පෙලක් ජුදා ජාතීන් අතර නොතිබුණු බව ය. තව ද සම්මත පොත් හා කිසිසේත් සම්බන්ධ නැති ජුබිලිවරුන්ගේ පොත කුම්රාන් හි අති පූජනීය ලෙස සලකනු ලැබීම මේ කරුණ තව දුරටත් තහවුරු කරයි.

**(ආ) ග්‍රීක පිටපත්**

ද්විතීය සම්මත ග්‍රන්ථ අධ්‍යයනයට කෙලින්ම සම්බන්ධ සෙප්ටුවජින්ත පිටපත වෙත පමණක් අවධානය යොමු කිරීම මෙහිදී අපට ප්‍රමාණවත් බව සඳහන් කරමු.

ක්‍රි.පූ.3 වෙනි ශත වර්ෂයේ ඊජිප්තුවේ ඇලෙක්සැන්ඩ්‍රියා ප්‍රදේශයේ විසූ ජුදාවරු ග්‍රීක සංස්කෘතියේ බලපෑම අනුව ග්‍රීක් භාෂාව තම මව් බස ලෙස සැලකූහ. එමනිසා තම ශුද්ධ ලියවිලි ග්‍රීක් භාශාවට පරිවර්තනය කළහ. ක්‍රි.පූ. 3වෙනිශත වර්ෂයේ දී පමණ පංච පුස්තකය ග්‍රීක් බසින් තිබුණු බවට **"අරිස්තයාස් මිත්‍යාව"** නමැති කෘතියෙන් ඉඟියක් කෙරේ. එම මිත්‍යාව අනුව දිමීත්‍රියස් නම් දෙවන ටොලමි ද පුස්තකාල භාරකරුගේ ඉල්ලීම අනුව පෙරුසලමෙන් පැමිණි පරිවර්තකයන් 72 හා එකිනෙකා ස්වාධීනව කළ පරිවර්තනයන් එකම පරිවර්තනයක් බව හෙළි වීමේ අද්භූත ජනක සිද්ධිය දෙවියන් වහන්සේගේ විශේෂ මැදහත්වීමක් ලෙස ඉදිරිපත් කෙරේ. කරුණු කෙසේ වුවත් මේ මිත්‍යා කථාව තුළින් අපට හැඟෙන්නේ එකී ග්‍රීක පරිවර්තන අති පූජනීය ලෙස සැලකුණු බවයි.

මෙහිදී සඳහන් කළයුතු ප්‍රධාන කරුණක් නම් ද්විතීය සම්මත ග්‍රන්ථ අපට ලැබී ඇත්තේ සෙප්ටුවාජින්ත්ගේ පිටපත අනුසාරයෙනි. මෙය අලෙක්සන්ඩ්‍රියානු ලේඛන සම්පදායට අයිති වේ. සෙප්ටුවජින්ත පිටපත හා මැසොරෙටින් පිටපත අතර බොහෝ වෙනස්කම් ඇති බව සඳහන් කළ යුතු ය. එසේම මැසොරෙටින් පිටපත හා කුම්රාන් බයිබලීය පිටපත අතරත් සැහෙන ප්‍රමාණයක වෙනස්කම් ඇති බවත් සඳහන් කලෙමු . මේවා බොහෝදුරට සෙප්ටුවාජින්ත පිටපතේ ද එලෙසම දක්නට ඇති බව සැලකිය යුතු කරුණකි. එයින් හැඟෙන්නේ සෙප්ටුවාජින්ත පිටපත හා කුම්රාන් පිටපත් අතර මේ සම්බන්ධයෙන් එක්තරා සමානතාවයක් තිබෙන බව ය.
සෙප්ටුවාජින්ත පිටපත සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු සැලකිල්ලට භාජනය කළ යුතු බව කීම යෝග්‍යවේ.

(අ) සෙප්ටුවාජින්ත පිටපතෙහි අඩංගු ද්විතීය සම්මත පොත් තුලින් මරණින් මතු ජීවිතය වැනි නව ගිවිසුම් ඉගැන්වීම් වලට පදනමක් දැකිය හැක. (උදා: ප්‍රඥා පොත 3 වෙනි පරිච්ඡේදය).

(ආ) මෙම ද්විතීය සම්මත පොත් වඩා සම්පූර්ණ දේව ධර්ම ආකල්ප ඉදිරිපත් කරයි. (උදා: උපදේශකයාගේ පොත හා සලමොන්ගේ ප්‍රඥාව, ධර්මදේශකයාගේ පොත ආශ්‍රයෙන් කියවන්න.)

(ඇ) සම්මත හේබ්‍රෙව් පිටපතට වෙනස්කම් ඇති සමහර සෙප්ටුවජින්ත පාඨ අළුත් ගිවිසුම දේව වාක්‍යය ලෙස හඳුන්වයි. (උදා: මතෙව් 1/23)

(ඈ) සෙප්ටුවජින්ත පිටපත තුළ සම්මත හා ද්විතීය සම්මත පොත් එකිනෙකට සම්පව සකස් කර තිබීම. මෙයින් පෙනී යන්නේ මේ පොත් දෙවර්ගයම එකම පූජනීය මට්ටමෙන් ගැණුනු බව ය. එය එසේ නොවූවා නම් ඒවා සම්මත පොත් වලින් බැහැරව තබනු නිසැක ය.

(ඉ) ඇලෙක්සැන්ඩ්‍රියාවේ ජුදාවරුන් අතරත් විශේෂයෙන් මුල් කිතුනු සභාව තුලත් ද්විතීය සම්මත පොත් ජනවන්දනාව තුළ භාවිතා වුණ බවට සාක්ෂි ඇත. ඉහත සඳහන් කරුණු සලකා බැලීමේදී සෙප්ටුවාජින්ත පිටපත පිළිබඳ අධ්‍යයනය කිරීම කෙතරම් වැදගත් ද යන්න තහවුරු විය යුතුයි.

**සැලකිය යුතු කරුණු:**
පලස්තීනයේ ජුදාවරුන්ගේ බයිබලයෙන් (මැසරෙටික් පිටපතේ) ද්විතීය සම්මත පොත බැහැරවීමට හේතු වශයෙන් සමහර විශේෂඥයන් දක්වන හේතුන් අතර පහත සඳහන් ඒවා සැලකිල්ලට ගත හැකිය.

(I) ජුදාවරුන් හා පලමු කිතුනුවන් අතර පැවති ආගමික වාදභේදවල එනම් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය, මෙසියස් කාර්යය, හා වෙනත් ඉගැන්වීම් සනාථ කිරීමට සෙප්ටුවාජින්ත පිටපතත් විශේෂයෙන් ම ද්විතීය සම්මත ග්‍රන්ථ භාවිතා කිරීම.

(II) පරිසිවරුන් හා වෙනත් ආගමික කොටස් (උදා: එලිදරව්වාදිහු) අතර තිබුණු සට්ඨන.

මෙවැනි දේ ජුදාවරුන් අතර සම්මත පොත් පෙළ සකස්වීමට තුඩුදුන් බවට ශු. ජස්ටින් තුමා ක්‍රි.ව.160 පමණ **"ට්‍රීෆෝ සමඟ සංවාදය"** යන පොතේ ඉඟියක් කරයි.

පුරාණ ගිවිසුමේ යුගාන්තයත්, නව ගිවිසුම් යුගයේ ආරම්භයත් අතර වන වසර 400ක පමණ කාලයක් තුළ මෙම ද්විතීය සම්මත ග්‍රන්ථ ලියැවිණි. එම යුගයේ ජුදෙව් ආගමික හා දේශපාලනික ඉතිහාසයේ වැදගත් කරුණු මෙහි අන්තර්ගත බව අමතක කළ යුතු නොවේ.

කතෝලික සභාව විශ්වාසය පිළිබඳ කරුණක් වශයෙන් පැරණි ගිවිසුමේ සම්මත පොත් වශයෙන් ග්‍රන්ථ 39 වෙනුවට 46 පිළිබඳ ප්‍රකාශයක් කර ඇත්තේ ක්‍රි.ව.1546 ට්‍රෙන්ට් මන්ත්‍රණ සභාවේ දී ය. මෙය අත්තනෝමතික තීරණයක් නොවේ.

**රෝමානු කතෝලික සභාව තුළ සම්මත පොත් මාලාව**

ක්‍රි.ව.393 හිප්පො මන්ත්‍රණ සභාවේ ද, ක්‍රි.ව.397 හා ක්‍රි.ව.419 කාර්තේජ්හි මන්ත්‍රණ සභාවෙහි ද, ක්‍රි.ව.401 පළමුවෙනි ඉනොසන්ට් පාප්තුමා තුලූස්හි රදගුරු එක්ස්හුපේරියස් තුමාට යැවූ ලිපියේ ද, ක්‍රි.ව.1441 ප්ලෝරන්ස් හි මන්ත්‍රණ සභාවෙහි ද සඳහන් සම්මත ගාන්ථ මාලාව ට්‍රෙන්ට් මන්ත්‍රණ සභාව නියෝග කළ සම්මත ග්‍රන්ථ මාලාව ම ය.

එහෙත් මීට පෙර ජෙරුසලමේ සිරිල්තුමා, එපිපානියස්, ජෝන් ඩැමසීන්තුමා, ග්‍රෙගරිතුමා හා ජෙරෝම්තුමා ඇතුළු සමහර සභා පියවරුන් ද්විතීය සම්මත පොත් අනුමත නොකළ බව කිව යුතු ය. රෙපරමාදු සභාවෝ, ලූතර්, කැල්වින්, ස්වින්ග්ලි අනුගමනය කරමින් හෙබ්‍රෙව් පිටපත අනුව සම්මත පොත් පමණක් පිළිගත් හ.

3.3. ශු. බයිබලීය භාෂා.

(අ) පුරාණ ගිවිසුම

- පුරාණ ගිවිසුමේ වැඩි කොටසක් ලියැවුණේ කානානීය සෙමිතීය භාෂාවක් වූ හෙබ්‍රෙව් භාෂාවෙනි. එය ලියන්නේ දකුණේ සිට වමට ය.
- පුරාණ ගිවිසුමේ සුළු කොටසක් ලියැවුණේ තවත් සෙමිතීය භාෂාවක් වූ ඇරමෙයික් භාෂාවෙනි. මේ අනුව හෙබ්‍රෙව්, පුරාණ ගිවිසුමෙහි ඇරමයික් පද ඇත.

  උදා: උත්පත්ති 31/47 "ජෙගර්-සාහදුතා".
  ඇරමැයික් කොටස් ද ඇත:
  ජෙරමියා 10/10-11
  දානියෙල් 2/4- 7/28
  එස්රා 4/8- 6/18; 7/12-26

- බැබිලෝනීය විප්‍රවාසයට පෙර ඊශ්‍රයෙල්වරු කථාකළේ හෙබ්‍රෙව් භාෂාවෙනි. විප්‍රවාසයෙන් පසුව කෙමෙන් කෙමෙන් එය මළ භාෂාවක් බවට පත්විය; ලිඛිත භාෂාවකට සීමාවිය; ජනවන්දනාවට සීමාවිය.
- පර්සියානු බලපෑම මත විප්‍රවාසයෙන් පසුව ඊශ්‍රායෙල්වරු අතර ඇරමෙයික් භාෂාව වඩාත් ප්‍රචලිත විය. ක්‍රිස්තුන් වහන්සේ පවා කථා කළේ එම භාෂාවෙනි. නව ගිවිසුමෙහි විශේෂයෙන්ම මුල්ම ශුභාරංචිය වූ මාක් ශුභාරංචියෙහි ඇරමයික් පද බහුල ය.

  "අබ්බා"; "එෆ්පෙතා" (මාක් 7/34); "අකෙල්ඩමා"; "ගබ්බතා"; "ගොල්ගොතා"; "රාකා"; "මැමොන්"; "කේෆස්"; "රබ්බෝනි"; තලිතාකුමි" (මාක් 5/41); "මරනාතා"; "ඒලි, එලි ලාමා සබක්තානි" (මාක් 15/34)

- මීට අමතරව ඉන්දු යුරොපීය භාෂාවන් වූ ග්‍රීක් හා ලතින් භාෂා ද පලස්තීනයේ භාවිතා විණි. ෆිලිප් හා ඇන්ඩෘ යනු ග්‍රීක් නම් ය. ගලීලයේ ජේසුස් වහන්සේගේ ජනතාව ඇරමයික් මෙන්ම ග්‍රීක් භාෂාව ද කථා කළෝ ය.
- ක්‍රිස්තු වර්ෂ හත්වැනි සියවසේ දී අරාබි ආක්‍රමණයෙන් පසුව ඇරමෙයික් කෙමෙන් කෙමෙන් මළ භාෂාවක් බවට පත්විය. නමුත් එලියේසර් බේන් යෙහුඩාන් නිසා හෙබ්‍රෙව් යළි ජීව භාෂාවක් විණි.
- මේ අනුව අද ඊශ්‍රායෙල් හි අරාබි හා ඉංග්‍රිස් භාෂා වෙනත් භාෂා වශයෙන් ද, හෙබ්‍රෙව් මූලික භාෂාව වශයෙන් ද භාවිතාවේ. අද ඇරමෙයික් කථා කරන්නේ ලෙබනනායේ සිරියා පැත්තෙහි කලමුන් කඳුකරයේ මලූලා, ජබාඩින්, බාකා පෙදෙසෙහි පිහිටි ගම්මාන කිහිපයක පමණි. තවමත් 10,000කට පමණ ඇරමෙයික් කථා කළ හැකිය. එහි සා. ජෝර්ජ් රෝමානු කතෝලික දේවස්ථානයේ සහ සා. ටෙක්ලා ග්‍රීක් ඕර්තොඩොක්ස් දේවස්ථානයේ යැදුම් මෙහෙයන්හිදී ග්‍රීක් හා අරාබි භාෂා මෙන්ම ඇරමෙයික් භාෂාව ද භාවිතා වේ.

(ආ) නව ගිවිසුම

නව ගිවිසුම මුලින්ම ලියවුනේ ආර්ය, ඉන්දු යුරෝපීය භාෂාවන් වූ ග්‍රීක් භාෂාවෙනි. එමලික්, අයෝනික්, ඩෝරික් හා ඇටික් වශයෙන් ග්‍රීක භාෂාව පරිනාමය විය.

- ක්‍රි.පූ.323 දී මහා ඇලෙක්සැන්දර් යුගයේ දී "කොයිනේ"නමැති සරල, මිශ්‍රිත ග්‍රීක් භාෂාවක් උපත ලැබිය. නව ගිවිසුම ලියැවෙන්නේ එම භාෂාවෙනි. අධිරාජයාගේ ආක්‍රමණය සමඟ එම භාෂාව බටහිර ආසියාවේ ජාත්‍යන්තර භාෂාව බවට පත්විණි.
- කොයිනේ ග්‍රීක් භාෂාව සරල නිසා නව ගිවිසුම කාටත් වටහා ගත හැකිවිය. එම භාෂාව චින්තනයේ හා අර්ථයන්හි සියුම් වෙනස්කම් පවා ප්‍රකාශ කරයි. එම භාෂාව කාටත් පොදු ජාත්‍යන්තර වීම නිසා ක්‍රිස්තු ධර්මය විගසින් ප්‍රචලිත විණි. **“දේව සැලැස්මෙහි අරුමය! ”**

## හතරවන පාඩම

### 4. දිව්‍ය පූජාව හැඳින්වීම හා එහි අවස්ථා අධ්‍යයනය

**ශුද්ධවූ බයිබලය තුළ පැවති පූජා විධි**

දේව ජනතාව තමන් මවා වදාළ දෙවිඳුන්ට ප්‍රශංසා කිරීමටත් වන්දනා කරන්නටත් පව්වලට සමාව ලබා ගන්නටත් අවශ්‍යතා සපුරා ගැනීමටත්, රැකවරණය ලබා ගන්නටත් පුරාණයේ සිටම දෙවියන් වහන්සේට පුද පූජා පැවැත්වූ බව ශුද්ධවූ බයිබලයේ සඳහන් වේ. කායින් හා ආබෙල්ගේ පූජාව, නෝවාගේ පූජාව - මෙල්කිසදෙක්ගේ පූජාව - ආබ්‍රහම් තම පුත්‍රයාව පූජා කිරීම - මෝසෙස් තුමා පූජක පරපුරක් බිහි කිරීම-සකරියස්ගේ පූජාව හා පාස්කු බැටළුවාව පූජා කිරීම ශුද්ධවූ බයිබලයේ අපට දකිය හැකි විශේෂ සිද්ධීන්ය. එදා යුදා පාස්කුවට නව අර්ථකථනයක් දුන් ක්‍රිස්තුන් වහන්සේ නව ගිවිසුමේ පාස්කුව මගින් පැරණි පූජා විධි නවතාවයකට පත් කළ සේක.

**දිව්‍ය පූජාව හැඳින්වීම**

කිතුනු ජනවන්දනාවේ කේන්ද්‍ර ස්ථානය දිව්‍ය පූජාවයි. පුරාණයේ සිට පැවති පඬුරු පිදීම පූර්ණත්වයට පත් කරමින් නවතාවයකට පත් කළ ක්‍රිස්තුන් වහන්සේ පූජකයා හා පඬුර බවට පත්වෙමින් එදා කල්වාරියේදී තමන් වහන්සේව ම බිලි පඬුරක් කොට පියාණන් වහන්සේට ඔප්පු කළ සේක. අද ද දිව්‍ය පූජාවේදී පූප සහ මිදිරස මගින් ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේව පියාණන් වහන්සේට ඔප්පු කරන සේක. අද දිව්‍ය පූජාවේදී යාගය පිදීමට ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් පෙනී සිටින්නේ පූජක තුමාය. ශුද්ධවූ ලූක්තුමා සඳහන් කරන පරිදි උන්වහන්සේ රොටිගෙන තුති පුදා ඒවා කඩා ඔවුනට දී "ඔබ උදෙසා පවා දෙනු ලබන මාගේ ශරීරය මෙය වේ. මා සිහිවීම පිණිස සිදුකරන්නැ"යි වදාළ සේක. ලූක් 22/19, ක්‍රිස්තුන් වහන්සේගේ අණ පරිදි දිව්‍ය පූජාව නමින් අද පුදනු ලබන්නෙ මේ යාගයයි.

**දිව්‍ය පූජාව යනු කුමක් ද ?**

නව ගිවිසුමේ පිළිවෙත් අනුව පූජාප්‍රසාදිතුමෙකුගේ පූජා සේවා (වත්පිළිවෙත්) මගින් පූප සහ මිදිරස ප්‍රකාරයෙන් ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයත්, ආත්මයත්, වේකයත් යාගයක් කොට දෙව් පියාණන් වහන්සේට පුද කිරීම දිව්‍ය පූජාව වන්නේ ය. (මහෝපදේශය) කුරුසිය මත දී මෙන් මෙහිදී ද ක්‍රිස්තුන් වහන්සේම යාගයක් වී පියාණන් වහන්සේට පුදන සේක. එහෙත් ඒ සඳහා අනුග්‍රහය ලබා ගන්නේ පූජක තුමාගෙන් ය. සමස්ත කතෝලික ජනතාව එකම විශ්වාසයකින් හා එකම අරමුණකින් යුතුව දේව පවුලක් ලෙස එකමුතුව, කිතු සමිඳාණන් තුළින්, ශුද්ධාත්මයාණන්ගේ ඒකත්වයෙන් දෙවියන් වහන්සේට තුති ප්‍රශංසාවත්, වන්දනාවත් හිමි කරමින් තම ජීවිතය යාගයක් කොට පුදමින් සමිඳාණන්ගේ ගැලවීමේ අභිරහස ලෝ තුළ ජීවමාන කිරීම දිව්‍ය පූජා යාගය තුළ සිදුවේ. දිව්‍ය පූජා යාගය තුළ අප සිහි කරන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානයයි. එනම් එතුමාණන්ගේ පාස්කු අභිරහසට ඇතුළු වීමයි. කල්වාරි යාගය අඛණ්ඩව ඉදිරියට ගෙන යෑම සඳහා ජේසුස් වහන්සේ දිව්‍ය පූජා යාගය ස්ථාපනය කළ සේක. එබැවින් දිව්‍ය පූජාව දෙව් මිනිස් සබඳතාවය තහවුරු කරන සේවයේ උත්තරීතර සංකේතයයි. එමෙන්

**දිව්‍ය පූජාව** → **යාගයකි.**
→ **යාගික භෝජනයකි.**
→ **තුති පිදීමේ සමරුවකි.**
**(ලූක් 22/19, 1 කොරි. 11/24)**

**දිව්‍ය පූජා යාගයත් කුරුසේ යාගයත් එකම යාගයක් වන්නේ කෙසේද ?**

යාග දෙකෙහි ම පුදන්නාත්, පුදනු ලබන පඬුරත්, එකම කිතු සමිඳාණෝ ය. දිව්‍ය පූජා යාගයත් කුරුසේ යාගයත් පුදනු ලබන්නේ එකම අරමුණක් සඳහාය. දිව්‍ය පූජා යාගය සිදු කරන පූජකතුමා ක්‍රිස්තුන් වහන්සේගේ පූජකවරයේ හවුල්කරුවෙකි. වෙනසකට ඇත්තේ කල්වාරි හෙල්මත දී ලේ හෙළා එම යාගය පිදූ සේක. අන්තිම රාත්‍රි භෝජනයේ දී පූප මිදිරස ගෙන තමන්ගේ ශ්‍රී ශරීරයටත් රුධිරයටත් හැරවූ සේක. අද දිව්‍ය පූජා යාගය අල්තාරය මත එම පූප හා මිදිරස වන් එ සළකුණු මගින් සිදු කරයි. දෘශ්‍යමාන ලේ වැගිරීමක් නැත. කුරුසේ යාගය මගින් මිනිස් සංහතියට ගැලවීම ලබා දුන් අතර අද දිව්‍ය පූජා යාගය තුළින් ගැලවීමේ ඵල බෙදා දෙන සේක.

**දිව්‍ය පූජාව**

දේව වාක්‍ය පිළිවෙත, දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙත වශයෙන් ප්‍රධාන කොටස් දෙකක් වුවත් එකම වන්දනා මෙහෙයක් වේ.

**දේව වාක්‍ය පිළිවෙත**

දිව්‍ය පූජාවේ ආරම්භයේ සිට විශ්වාසිකයන්ගේ යැදුම දක්වා දේව වාක්‍ය පිළිවෙතයි. එහි ප්‍රධාන කොටස් කීපයකි. පුරාණ ගිවිසුමෙන් හා නව ගිවිසුමෙන් කියවෙන පළමු කියවීම හා දෙවන කියවීම මේ කොටස ට අයත් වේ. තුන්වන කියවීම සුබ අස්නෙන් තෝරාගත් එදිනට නියමිත කොටසයි.

**ආරම්භක පිළිවෙත**

එය ඇතුළුවීමේ පෙරහැරින් ආරම්භ වේ. ඊශ්‍රායෙල් ජනතාව මෝසෙස්තුමාගේ නායකත්වය යටතේ ඊජිප්තු දේශයේ වහල්කමින් මිදී පොරොන්දු දේශයට යාමත් ස්වකීය දූත සේවාව නිමාවට පත් කරමින් කිතු සමිඳාණෝ ජයග්‍රාහී රජෙකු විලසින් ජෙරුසලෙමට පැමිණීමත් මෙහිදී අප සිහි කරමු. ඇතුළුවීමේ පෙරහැර පැමිණේද්දී මුළු කිතුනු සංඝය ඇතුළුවීමේ ගීයට සහභාගි වේ. අතීතයේදී මෙයින් බලාපොරොත්තු වූයේ සංඝයේ එකමුතු කමයි. <u>ඩිඩාස්කාලියා අපෝස්ටොලෝරුම්</u> නැමැති ග්‍රන්ථයේ ඉගැන්වීම අනුව ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය වන ශුද්ධවූ සභාව දිව්‍ය සත්ප්‍රසාදිය අභිරහස සිදු කරන්නට සහභාගිත්වයක් **(Koinonia)** හා එකමුතු බවක් **(Communion)** ක්‍රිස්තුන් වහන්සේ නියෝජනය කරන පූජාප්‍රසාදි තුමා සමඟ ඇති කර ගැනීම ඉන් හඟවනු ලබයි.

**ආමන්ත්‍රණය**

- ස්වාමින් වහන්සේ ඔබ සමඟ වන සේක්වා (රූත් **24:2; 2** තෙසලෝනික **3/16**)
- අපගේ ස්වාමින් වන .................... ඔබ සියල්ලන් සමඟ පවතීවා **(2** කොරින්ති **13/13)**

- අපගේ පියාණන්... සාමය හා වරප්‍රසාදය ලැබේවා (1 කොරින්ති 13/2)
- ඔබ සමඟද පවතීවා (ගලාති 6/18)

**පශ්චාත්තාපික පිළිවෙත**
අප අතින් වූ වැරදි පිළිගෙන ඒවාට කමාව ලබාගෙන සුහද සිතින් යුතුව යාගයට සූදානම් වීම මෙහි අරමුණයි. යාගය ඔප්පු කිරීමට පෙර සමගිවීම අවශ්‍ය ය. (මතෙව් 5/23-24)
දෙවියන් වහන්සේ සමාව දෙන්නේ අන් අයට සමාව දුන්නොත් පමණයි. (මතෙව් 6/12, 14/15)

**සුරදූත ගීය**
ස්වර්ගයෙහි දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා. ඉරුදිනවලදී ද සමහර ප්‍රාණ පරිත්‍යාගී මංගල දිනවලදී ද ග්ලෝරියා ගායනා කෙරේ. එහෙත් සමහර කාලවලට විශේෂයෙන් චතාරික කායේදී හා ආගමන කාලයේදී එය භාවිතා නොකෙරේ. මෙම සුරදූත ගායනය ලූක්. 2/14 පාදක කරගත් ප්‍රශංසා ගීතයකි.

**පොදු යැදුම Collect**
පූජාප්‍රසාදීතුමා පමණක් උච්චාරණය කරයි. මෙහිදී එදිනට නියමිත මංගල්‍යය හෝ තේමාව ගැන පියතුමා සඳහන් කරයි. ජනතාව එකමුතු කරයි. ශුද්ධවූ ත්‍රිත්වයේ ක්‍රියාකාරීත්වය එම යැදුම තුළ ප්‍රකාශ කරයි. පියතුමන්ගේ යාච්ඤාවට පසු අප දෙන පිළිතුර ආමෙන් (1 පේදුරු 5/11) කියා අපගේ අවනත බව හා එක්සිත් බව ප්‍රකාශ කරමු.

**දේව වාක්‍ය කියවීම**
මෙහිදී කියවීම් දෙකක් ඇතුළත් ය. මෙහිදී දෙවියන් වහන්සේ අපට කථා කරන සේක.

**පළමු කියවීම**
පළමු කියවීම සඳහා පුරාණ ගිවිසුමේ ගීතාවලිය හැර ඕනෑම පොතකින් කොටසක් ගත හැක. පාස්කු කාලය සඳහා අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් යම් යම් කොටස් භාවිතා කෙරේ. පළමු කියවීමෙන් පසු කියවෙන පිළිතුරු ගීය කියන්නේ ගීතාවලියෙනි.

**දෙවන කියවීම**
අපෝස්තුළුවරුන්ගේ සංදේශ වලින් හා ලිපිවලින් භාවිතා කෙරේ. ඉන්පසු සාධුකාරය හෙවත් ආලේලූයියා ගායනා කෙරේ. චතාරිකයේදී හා ආගමයේදී අලේලූයියා නොකියන අතර සාධුකාර පදය පමණක් ගායනා කෙරේ.

දේව වාක්‍ය පිළිවෙතේ උච්චතම අවස්ථාව සුවිශේෂය ප්‍රකාශ කිරීමයි. සුවිශේෂය මගින් ක්‍රිස්තුන් වහන්සේ තම ජනතාව අමතා කථා කරමින් ඔවුන් සැමදෙන විශ්වාසයටත් සිත් මාරවැකටත් කැඳවන සේක.

**දේශනය**
එදා ක්‍රිස්තුන් වහන්සේ ජනතාවට දේශනා කළාක් මෙන්ම (මාක් 1/21; මතෙව් 13/53-58) දිනට නියමිත සුවිශේෂ පාඨය විශ්වාසකයින්ට පැහැදිලිකර දීම මෙහිදී සිදුවෙයි. මේ මගින් සියළුම විශ්වාසකයින්ට ආත්මික පෝෂණයක් ලබා දෙයි. කිතුනු දිවියට මග පෙන්වයි. මිසම් පවුලට දෙන දහම් පාඩමකි. මෙහි පරමාර්ථය වනුයේ රුස්ව සිටින දේව ජනතාවට දෙවියන් වහන්සේ තමන් වහන්සේගේ වචනය හා ක්‍රියා මගින් ඔවුන් තුළ දිගට ම ක්‍රියාකාරීවන අන්දම පෙන්වා දීම ය.

**විශ්වාස ලක්ෂණය**
දිව්‍ය යාගයේදී භාවිතා කරනුයේ ක්‍රි.ව. 325 දී නිසියානු මන්ත්‍රණ සභාවේ ප්‍රතිඵලයක් ලෙස බිහිවූ නිසියානු විශ්වාස ලක්ෂණයයි. මෙය මුල් කිතුනු සභාවේ බෞතිස්මයට විශ්වාසය ප්‍රකාශ කරනු සඳහා භාවිතා කළ අපොස්තුළුවරුන්ගේ විශ්වාසය ලක්ෂණයට වඩා දිග ය. මෙම නිසියානු විශ්වාස ලක්ෂණය දිව්‍ය පූජාවට එක් කරගනු ලැබුයේ ක්‍රි.ව. 515 දීය.

**විශ්වාසකයින්ගේ යැදුම**

ශුද්ධවූ පාවුළුතුමා බොහෝ අවස්ථාවලදී තම සංඝයේ විශ්වාසිකයන් හට යාච්ඤා කරන ලෙස දිරි ගන්වයි. (1 තිමෝති 2/1-3) මෙහිදී දේව ජනතාව තම අවශ්‍යතා දෙවියන් වහන්සේ ඉදිරියේ තබයි. ජනවන්දනාව තුළ, මේ සඳහා යම් ක්‍රමයක් සකස් කර ඇත. එනම්

- සභාවේ විවිධ අවශ්‍යතා වෙනුවෙන්
- ලෝකයේ ගැලවීම සහ ජන නායකයන් උදෙසා
- විවිධාකාර අවශ්‍යතාවයන් ගෙන් පෙළෙන පීඩිත අය උදෙසා
- මිසමේ සැදැහැවතුන් උදෙසා
- මේ හැර අභිවෘද්ධි ආලේපය. ආශිර්වාදකාර බන්ධනය අවමංගල්‍ය පිළිවෙත් ආදි විශේෂ අවස්ථාවන්හි ඒවාට ගැලපෙන අයුරින් යැදුම් සකස් කර ගත හැකිවෙයි.

**දිව්‍ය පූජාවේ ප්‍රධාන උච්චතම අවස්ථාව නම් සත්ප්‍රසාදීය පිළිවෙතයි**
මෙහිදී ක්‍රිස්තුන් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනයේදී සිදු කළ මෙහෙය නැවතත් පණ ගන්වයි. මෙම කොටස පඬුරු පිදීමෙන් පටන්ගෙන දිව්‍ය පූජාවේ අවසානය දක්වා විහිදී ඇත. ප්‍රධාන කොටස් 4 කි.

- පඬුරු සූදානම් කිරීමේ පිළිවෙත
- ස්තෝත්‍ර යාගික යැදුම
- පූප කැඩීම.
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීම.

**පඬුරු පිදීම**
ස්වාමින් වහන්සේගේ කාලයේදී පවා දේව මාලිගාවට හා ජනවන්දනාවට ආධාර පිණිස සම්මාදම් එකතු කළේය. එක් අවස්ථාවකදී උන්වහන්සේටත් පේදුරු තුමාටත් මෙය ගෙවන්නට කිව් බව සුබාරංචියේ සඳහන් වේ. (මතෙව් 17/24-27)

එසේම දුප්පතුන්ට ආධාර කිරීම පිණිසද(1 කොරි 16/1-4) පියතුමාගේ නඩත්තුව පිණිසද අපගේ පඩුර වෙන්කළ යුතු ය.

අප ජීවිතයේ එදිනෙදා වැඩපළ ශ්‍රමය හා උපයන දේ දුක හා සතුට පඩුරක් කොට අප වෙනුවෙන් යාගවන කිතු සමිඳුන් සමඟ දෙව් පියාණන්ට පුදනු සඳහා, අපගේ ජීවිත යාගයද එම පඩුරට මුසු කරනු ලැබේ. මේ සඳහා හඳුන්කූරු, වියළි ආහාර ඇඳුම් පැළඳුම්, පාසල් පොත්, භාවිතා කළ හැකිය. පඩුරු පෙරහැර සඳහා ගායනය කිරීම සුදුසුය. එහෙත් පෙරහැරෙන් පසුව ගායනය නවත්වා යච්ඤාවට සහභාගි විය යුතු ය.

- දිව රහස් කිරීම හා ස්තෝත්‍ර ගීය
- ස්තෝත්‍ර ගීය
- විශ්වාසය ප්‍රකාශ කිරීම
- ප්‍රශංසා ගීය
- ශුද්ධාත්මයාණන්ට අයැදීම

දිව්‍ය පූජා පිළිවෙතින් ඉතා වැදගත් උතුම්ම යාච්ඤාවයි. දෙවියන් වහන්සේගේ ගැලවීම්දායක ක්‍රියාවලියට තුති ප්‍රශංසා ගායනා කිරීම මෙහිදී සිදුවේ. පූපය හා මිදිරස ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරයට හා රුධිරයට හැරවීමේ හා ගැලවීමේ කාර්යය සිදුවන්නේ මේ අවස්ථාවේදීය.

1. පූජාප්‍රසාදීතුමා රැස්ව සිටින දේව ජනතාව වෙනුවෙන් දෙවියන් වහන්සේට කථා කරයි. දේව ජනතාව තම විශ්වාසය පදනම් වන අභිරහස ප්‍රකාශ කරමින් යාච්ඤාවට සහභාගිවෙයි.
2. කිතුනු සභාව උන්වහන්සේගේ මැවීම, ගැලවීම හා ශුද්ධවන්ත කිරීමේ ක්‍රියාවලිය සඳහා ක්‍රිස්තුන් වහන්සේ මගින් ශුද්ධාත්මයාණන් තුළ පියාණන් වහන්සේට ප්‍රශංසා ගීතය ගායනා කරයි.
3. පූජා ප්‍රසාදීතුමා සියළු විශ්වාසකයින් එක්සත් කරන ලෙස ශුද්ධාත්මයාණන් අයදියි. මෙම යාගය මුළු ක්‍රිස්තියානි සභාව සමඟත් සාන්තුවරයන්ගේ සමෝස ධර්මලාභය සමගත් සිදු කරන බව මෙයින් පෙන්නුම් කෙරේ.
   - ශුද්ධවන්තයන්ට යාච්ඤා කෙරේ.
   - මුළු කිතුනු සභාව වෙනුවෙනුත්, එහි නායකත්වය හා සාමාජිකයන් වෙනුවෙන් යාච්ඤා කෙරේ.
   - කන්‍යා මරියතුමිය ද අපෝසතුළුවරුන් ප්‍රාණ පරිත්‍යාගිවරුන් සහ සියළු සාන්තුවරයන් ද සිහිපත් කරයි.
   - මළාවූ අයවළුන් ද, ජීවත්වන අප සැමදා මේ යාගික මොහොතේ දේව සම්මුතියට ගෙන එනු ලැබේ.
   - දෙවියන් වහන්සේගේ මුළු මැවිල්ල වෙනුවෙන් යැදීමක් කෙරේ.
     ස්තෝත්‍ර ගීය - ත්‍රිත්වයික යැදුමෙන් අවසන් වේ. එය පියාණන් වහන්සේටද, පුත්‍රයාණන් වහන්සේටද, ශුද්ධාත්මයාණන් වහන්සේටද, මහිමයත් ප්‍රශංසාවත් ස්තුතියත් පුද කරමින් අවසන් වෙයි.
     “උන් වහන්සේ මගින්ද උන්වහන්සේ සමඟ ද උන්වහන්සේ කෙරෙහිද ... සදහටම අත්වේවා.”
     මෙහිදී වන්දනා කරන ජනතාව <u>ආමෙන්</u> කියා හඬින් පිළිතුරු දෙති.

**සත්ප්‍රසාදික ස්තෝත්‍ර ගීය**

දේව ජනතාව සමඟ පිදෙන ක්‍රිස්තුන් වහන්සේගේ ම යාච්ඤාවකි. මෙය මුළුමනින් ම පූජාප්‍රසාදීතුමා විසින් ප්‍රකාශ කළත් ජනතාවගේ තුන් ප්‍රකාර සාදුකාරයන් තුළින් එනම්,

1. සුවිශුද්ධ ගායනා කිරීම
2. විශ්වාසයේ අභිරහස ප්‍රකාශ කිරීම
3. ගාම්භිර එහෙයියාව (මහා ආමෙන්) **Great Amen**

ඔවුන්වද සහභාගි කරවා ගන්නේ ය. මෙම සාධුකාරයන් ශබ්ද නගා ප්‍රකාශ කිරීම ක්‍රියාකාරී සහභාගිත්වයක ලක්ෂණය වන්නේ ය.

**අනුභවය**

මෙය ආරම්භ වන්නේ පරමණ්ඩල යාච්ඤාවෙනි. දෙවියන් වහන්සේගේ රාජ්‍යය මෙලොව ස්ථිර ලෙස ස්ථාපිත වීමටත් අප අනුන්ගේ වැරදි කමා කරන ලෙසට අපගේ වැරදි කමා කරන ලෙසට අයදින්නේ මේ යැදුම තුළිනි. මතෙව් 6/7-13

සමාව දීමෙන් හා ලබා ගැනීමෙන් අප සාමය පතමු. අත්දකිමු එම අත් දෑකිම එකිනෙකා සමඟ බෙදා ගනිමු. (රෝම 16/16) (1 කොරින්ති 16/20)

දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමට පෙර ශතාධිපතියා මෙන් උන්වහන්සේ අප තුළට පැමිණීමෙන් අප ලබන ජීවනය ප්‍රකාශ කර සිටිමු. (මතෙව් 8/8)

දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීමෙන් අනතුරුව අපි "<u>ආමෙන්</u>" කියා උච්චාරණය කරමු. මෙසේ ක්‍රිස්තුන් වහන්සේව හඳුනාගැනීමෙන් අපගේ සහෝදර සහෝදරියන් තුළ ක්‍රිස්තුන් වහන්සේව හඳුනා ගැනීමේ වැදගත්කමට හා වගකීමට අපි එකඟවෙමු.

**අවසාන පිළිවෙත**

දිව්‍ය සත්ප්‍රසාද බෙදා දීමෙන් පසු විශේෂයෙන් සිදුවන්නේ පියාණන්ගේද පුත්‍රයාණන්ගේද ශුද්ධාත්මයාණන්ගේ නාමයෙන් ආශිර්වාදයත් සාමයත් රැගෙන යන ලෙස ඇරයුම් කිරීමයි.

**දිව්‍ය පූජාවට ක්‍රියාකාරී සහභාගිවීමට නම්**

- පූජාව ආරම්භයේ සිට අවසානය දක්වා රැඳී සිටීම
- නියමිත යැදුම් උච්චාරණය කිරීම
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම
- සාමය පතන විට සැමට සාමය පැතීම.

- ගීතිකාවලට සහභාගිවීම
- තම වරදවලට ආරම්භයේදීම සමාව ලබා ගැනීම
- පඬුරු පිදීම සඳහා දායකවීම

## පස්වන පාඩම

### 5. ශුද්ධ සභාවේ නිල ජන වන්දනාව

**හැඳින්වීම**
ජනවන්දනාව යන වචනය ග්‍රීක ලෙයිටුර්ජියා (LEITOURGIA) යන්නෙන් බිඳී ආ වචනයකි. ලෙයිටුර්ජියා යන ග්‍රීක වචනය ලාඕස් එර්ගොන් යන වචනවලින් සැදුනකි. ලාඕස් යනු ජනතාවයි. එර්ගොන් යනු ප්‍රසිද්ධ වැඩකි. ඒ අනුව ලෙයිටුර්ජියා යන වචනයේ මුල් අර්ථය ජනතාව වෙනුවෙන් ජනතාව උදෙසා වැටුපක් නො ලබා කරන උසස්ම සේවයකි. ඒ අනුව එකල පැවති ප්‍රසිද්ධ මංගල්‍යයන් හා අනිවාර්ය රාජ්‍ය සේවාව වැනි පොදු සේවාවන් ලෙයිටුර්ජියා ලෙස සැලකිණ. මෙය ආගමික දෘෂ්ඨි කෝණයකින් බැලූ කල, එය දෙවියන්ට කරන වැඳීමකි. XII වන පියුස් සුදතුම් පියාගේ "මීඩියාතෝර් දේයි" (MEDIATOR DEI) යන ලියවිල්ලේ අර්ථය දක්වන්නේ මෙලෙසින් ය.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ, උන්වහන්සේගේ අති ඉන්ද්‍රිය දේහයේ කොටස් වන ශු. සභාව සමගින් ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ පිය දෙවිඳුන්ට කරන උසස්ම යැදුම ජනවන්දනාවයි. 1961-1965 දක්වා පැවති දෙවන වතිකාන මන්ත්‍රණ සභාව එය මෙසේ විස්තර කරයි.

ජනවන්දනාව නම් ක්‍රිස්තුන් වහන්සේ හිස වන්නාවූ ද, සියළුම විශ්වාසකයින් අවයවයන් වන්නාවූ ද අති ඉන්ද්‍රිය දේහය විසින්, දෙව් පියාණන් හට අති උතුම් වන්දනාවත්, ප්‍රශංසාවත්, ස්තුතියත් පුද කරන, එමගින් මනුෂ්‍යයින් ශුද්ධවන්ත කරන, දේව ජනතාව ශුද්ධ වූ සභාවේ ක්‍රියාකාරිත්වයට යොමු කරන අග්‍රස්ථානයද ශුද්ධ වූ සභාවට මුළු ශක්තිය ගලා එන්නට සලසන උල්පත ද වන්නේ ය.

ජනවන්දනාවේ හෙලනිස්ත අර්ථය වන්නේ ජනතාව එකමුතුව දෙවියන් වහන්සේට කරන වන්දනාවයි. ක්‍රිස්තු අභිරහස උත්සවාකාරයෙන් පැවැත්වීමයි. අනුස්මරණය කිරීමයි. ක්‍රියාකාරීව දෙවියන් වහන්සේට වන්දනා කිරීමෙන් ජනතාව තුළ වෙනසක් ඇතිවේ. සහෝදරත්වය වර්ධනය වේ. දෙවියන් වහන්සේ සමඟ සමීප සම්බන්ධතාවයක් ඇතිවේ.

**<u>ජනවන්දනාවේ ස්වභාවය හා වැදගත්කම</u>**
සකල ජනතාවට ගැලවීම ලබා දීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ තම මරණයෙන් ද, උත්ථානයෙන් ද, ස්වර්ගාරෝහණයෙන් ද, අප දෙවිඳුන් හා මිත්‍රකර දෙවියන් වහන්සේට දිය හැකි උසස්ම උතුම් ම වන්දනාව අප වෙනුවෙන් ඔප්පු කළහ. එම වන්දනා මෙහෙවරට අපව ද සහභාගි කරවා ගැනීම සඳහා ශුද්ධ වූ සභාව ස්ථාපනය කළ සේක. මෙම ගැලවීමේ අභිරහස උන්වහන්සේ විසින් ම ස්ථාපිත ප්‍රසාද නිධාන මගින් යථාර්ථයට පත් කළහ. ගැලවීම හා වන්දනාව පිළිබඳ උන්වහන්සේගේ එම උතුම් කාර්යයට අපව ද අද සහභාගි කරවා ගන්නේ ජනවන්දනාව මගින් ය. සෑම ජනවන්දනා මෙහෙයක් ම ක්‍රිස්තුන් වහන්සේගෙත් ශුද්ධ සභාවෙත් පූර්ණක්‍රියාවකි. එහෙයින් සෑම දිව්‍ය පූජාවක් තුළින්ම, දේව ස්තෝත්‍ර ගායනයක් තුළින් ම හා දේව ප්‍රසාද නිධානයක් තුළින් ම ජනතාව ජනවන්දනාවට සහභාගි වන්නට ප්‍රථම විශ්වාසය හා සිත් හැරීම කරා කැඳවනු ලබයි. සභාව ඔවුන් ඒකරාශි කර උතුම් ජනවන්දනාව වන දිව්‍ය පූජාවට සහභාගි කරවයි. ස්වාමින් වහන්සේගේ භෝජනය අනුභව කිරීමට මඟ සලස්වයි. සෑම ධර්මදූත ප්‍රයත්නයක් ම පරමාර්ථය සියළුම මනුෂ්‍යයන් ජනවන්දනාවට කැඳවීමයි. ජනවන්දනාව ප්‍රධාන හා අර්ධ ජනවන්දනාව වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැක.

* **ප්‍රධාන ජනවන්දනාව**
  - දිව්‍ය පූජාව
  - දේව ප්‍රසාද නිධාන
  - සභාවේ නිල යාච්ඤා හෙවත් දේව ස්තෝත්‍ර ගායනා

* **අර්ධ ජනවන්දනාව**
  - ශුද්ධ වූ පැය
  - ජපමාල උච්චාරණය කිරීම
  - දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය
  - සන්ධ්‍යා මෙහෙයන් ය
  - සුව මෙහෙයයන්
  - බයිබල් මෙහෙයයන් හා විවිධ භක්ති අභ්‍යාස

**<u>ජනවන්දනා වසර</u>**
කිතු සමිඳුන්ගේ පාස්කු අභිරහස හා ගැලවීමේ කාර්යය සදාතනිකව සිහිපත් කිරීම සඳහාත් ANAMNESIS සැබැවින් ම ඒ තුළ ජනතාව ජීවත් කරවීම සඳහාත් නිල වශයෙන් වසරේ කාල සීමාවන් සකස් කර ඇත. එය ජනවන්දනා වසරයි. මෙය වසරක කාලසීමාවක් තුළ සකස් කර ඇත. මේ වසරක කාලසීමාවක් තුළ දී පිය දෙවිඳුන්ට නමස්කාර කරන්නට ද එතුමන්ගේ යහගුණ පැසසීමට ද අපව ශුද්ධවන්ත කර දේව ප්‍රසාද නිධාන දානය කරන්නට ද, සභාව කටයුතු කරයි. මේ වසර තුළ භාවිතා වන කියවීම් සමදර්ශක සුවිශේෂ අනුව කාල තුනකට බෙදා ඇත. දේව වාක්‍ය සංග්‍රහයේ මෙම වසරවල් අපට හමුවේ. පළමු වසර මතෙව් සුවිශේෂය ද, දෙවන වසර මාර්ක් සුවිශේෂය ද, තුන්වන වසර ලූක් සුවිශේෂය ද භාවිතයට ගනු ලැබේ. ජුවාම් සුබාරංචිය මාක් සුබාරංචියේ අඩු කොටස පිරවීමට පාස්කු කාලයේ දී ද භාවිතා කෙරේ.

**<u>ජනවන්දනා වසරේ විවිධ සමයයන්</u>**

* ආගමන සමය
* නත්තල් සමය
* සාමාන්‍ය සමය
* චතාරික සමය
* පාස්කු සමය
* සාමාන්‍ය සමය

* **ආගමන සමය**

ඉරුදිනවල් සතරකි. සමිඳුන්ගේ මාංශගතවීමත්, එතුමන්ගේ දෙවන ආගමනයත්, අප හදවත් තුළට එතුමන්ගේ ආගමනය සිදුවන ආකාරයත් පිළිබඳව විමසා බැලීමකට ආගමන සමය තුළ අපව යොමු කරයි. මේ සමය බලාපොරොත්තුවේ සමයයි.සමිඳුනගේ ආගමනය සඳහා සැබෑ ජීවිත පෙරළියක් Metanoia අත් දකින්නට අපට ආයාචනා කෙරේ. උන්වහන්සේගේ ආගමනය ත්‍රිවිධාකාරයි.

1. ඓතිහාසික ආගමනය - Historical coming
2. දෙවන ආගමනය - Messianic Second coming
3. අප තුළට එන නිරන්තර ආගමනය - Continuous coming

**ආගමන සමයේ ප්‍රධාන කොටස් දෙකකි.**

1. පළමු ඉරුදින සිට දෙසැම්බර් 16 දක්වා කාලය දෙවන පැමිණීම හෙවත් පරුසියාව (PAROUSIA) සිහි ගැන්වේ.
2. දෙසැම්බර් 17 සිට 24 දක්වා කාලය පළමු පැමිණීම හෙවත් ඓතිහාසික පැමිණීම සිහි ගැන්වේ. ආගමන සමයේ ශ්‍රී වචනය තුළින් අපට චරිත පහක් මුණ ගැසේ.

**එනම්**

- ආබ්‍රහම් - දාවිත් - යෙසායා - ස්නාවක ජුවාම් - මරියතුමිය

* **නත්තල් සමය**

ආගමන කාලයේ සති හතරට පසු එන දෙසැම්බර් 25 වන දින නත්තල් මංගල්‍යය සිදු කෙරේ. මෙදින දිව්‍ය පූජා තුනකි.
- මධ්‍යම රාත්‍රි දිව්‍ය පූජාව
- උදේ පූජාව
- දහවල් පූජාව

රජුන්ට ප්‍රත්‍යක්ෂ මංගල්‍යයෙන් පසු නත්තල් සමය නිමාවේ. එනම් ජනවාරි 2ත් 8ත් අතර එන ඉරුදිනයි. නිරපරාද බොළඳුන් සිහිකිරීම, ශුද්ධ වූ පවුලේ මංගල්‍යය, සුපරිශුද්ධ දේවමාතා මංගල්‍යය (ජනවාරි 01) මේ කාලය තුළ සැමරේ.

* **සාමාන්‍ය සමය**

මෙය කොටස් දෙකකි. නත්තල් සමයේ අවසාන දින සිට ගුරු අඟහරුවාදා දක්වා එක කොටසක් ද පෙන්තකොස්ත දිනට පසු එන සඳුදා සිට ආගමනයේ පළමු වන ඉරු දිනයට පෙර සෙනසුරාදා දක්වා කාලය අනික් කොටසට ද අයත් වේ. සාමාන්‍ය සමයට ඉරුදිනයන් 34 ක් වේ. සාමාන්‍ය සමය තුළ කිතුනු ජනතාව ජේසු සමිඳාණන් තුළ තමන්ට අත්වුණ ගැලවීම මෙනෙහි කරයි. ශුද්ධ වූ ත්‍රිත්වයේ මංගල්‍යය ද සත්ප්‍රසාද මංගල්‍යය ද, ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යය ද මේ සමය තුළ පවත්වයි.

* **චතාරික සමය**

චතාරික සමය දින හතළිහකි. එය අප පාපයට මැරී, නව ජීවනයක් ලබන කාලයයි. ආත්මාර්ථයට මැරී දෙවිඳුන් තුළ නිදහස් දරුවෙක් මෙන් ජීවත්වන කාලයයි. අළු බදාදායින් චතාරික සමය ඇරඹේ. මෙදින අළු ආශිර්වාද කිරීම, විශ්වාසකයින්ගේ නලලේ අළු තැවරීම සිදු කෙරේ. මෙයින් දෙවියන් ඉදිරියේ මිනිසාගේ දුබල බවත්, නොවටිනා බවත් මතක් කරයි. චතාරිකයේ දින හතළිහෙන් පසු ශුද්ධ වූ සතිය එළඹේ. පාස්කු අභිරහස ගැඹුරින් සමරණ මෙම සතිය ජනවන්දනා වසරේ උතුම් හා භාග්‍ය සම්පන්න කාලයයි. මෙම කාලය තුළ, මුල් කිතුනු සභාව තුළ, නවකයන් ප්‍රසාද ස්නාපනය සඳහා සූදානම් කිරීමත් ප්‍රසිද්ධ ලෙස මනස්ථාපනය සඳහා පව්කරුවන් කැඳවීමත් අරමුණු කෙරිණි. විශේෂයෙන් දේව වචනය විශ්වාස ලක්ෂණය ස්වාමිවාක් ආරාධනය පිළිබඳ දැනුමක් එම ආධුනිකයන් වෙත ලබා දෙන ලදී.

* **උත්ථාන සමය හෙවත් පාස්කු සමය**

පාස්කු ඉරුදිනෙන් එන හතළිහකට පසු ස්වර්ගාරෝහණයේ මංගල්‍යය ද ඉන් දින දහයකට පසු ශුද්ධාත්ම මංගල්‍යය ද සැමරේ. මෙයින් උත්ථාන සමය නිමවේ. ජනවන්දනා සමයේ ප්‍රධානත ම මංගල්‍යය පාස්කුවයි. පාස්කු ඉරුදිනයෙන් සති හතක කාලයක් උත්ථාන සමයට අයත් ය.

**චතාරික සමයේ ප්‍රධාන ජනවන්දනා දිනයයන්**

o **අළු බදාදා**

අළු බදාදායින් චතාරික සමය ඇරඹේ. මෙදින අළු ආශිර්වාද කිරීම හා විශ්වාසකයින්ගේ නලල මත අළු තැවරීම සිදු කරන අතර දෙවියන් වහන්සේ ඉදිරියේ මිනිසාගේ දුබල බවත්, නොවටිනා බවත් මතක් කරයි.

o **ගොබ් ඉරිදා**

මෙදින ජනවන්දනාවේ දී ගොබ් අතු ආසිරි ගන්වයි. ඉන්පසු ගොක් රැගෙන පූජකතුමා පෙරටු කොට පෙරහැරෙන් දෙව් මැදුරට ඇතුළුවේ. එදා ජේසු සමිඳුන් ජයෝත්සවයෙන් ජෙරුසලමේ නුවරට ඇතුළුවීම මේ සිද්ධියෙන් සිහි ගන්වයි. ජේසුස් වහන්සේ දුක් විඳින සේවකයා බවත් දුක්විඳින මෙසියස් වහන්සේ බවත් සිහි ගන්වයි.

o **තෛලාශිර්වාද පූජා මෙහෙය (CHRISM MASS)**

මෙදින ජනවන්දනාව තුළින් ශුද්ධ වූ තෛලය ආසිරි ගන්වයි. පදවියේ රදගුරුතුමා සියළුම පූජකයන් එක තැනකට රැස්කර විශේෂ පූජා මෙහෙයක් තුළ සිදු කරයි. එදින පූජක පොරොන්දු අළුත් වැඩියා කිරීම ද සිදු කෙරේ. තම පදවියේ පූජක සංඝය සමඟ රදගුරුතුමාගේ සුහදතාවය හා ඒකත්වය මෙදින සංකේතවත් කරයි. සාමාන්‍යයෙන් ශුද්ධ වූ සතියේ දිනයකය, මෙය සිදු කරන්නේ. ශුද්ධ වූ තෛලය වර්ග තුනකට ආසිරි ගන්වයි.

o **මහ බ්‍රහස්පතින්දා**

මෙදින ජනවන්දනාවේ දී සමරන්නේ සමිඳුන්ගේ බොදුන් මංගල්‍ය යි. දිව්‍ය සත්ප්‍රසාදය හා පූජකවරය යන සක්‍රමේන්තු ස්ථාපිත කිරීම ද සැමරේ. ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමයේ පණත වන “මා නුඹලාට ප්‍රේම කළාක් මෙන් නුඹලා ද එකිනෙකාට ප්‍රේම කරන්න” යන්න සිහි ගන්වමින් දිව්‍ය පූජාවේ දේශනයෙන් පසු තෝරාගත් දොළොස්දෙනාගේ පාද

සේදීම සිදු කරයි.

මෙදින සීනු නාදය සමඟ සුරදූතික ගීතය ගායනා කරන අතර නැවත සීනු නාද කරන්නේ පාස්කු රාත්‍රී මෙහෙයෙහිදී ය. මෙදින ජනවන්දනාව සඳහා තෝරා ගන්නේ පස්වරුවයි. දිව්‍ය පූජාවෙන් පසු දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පෙරහැරෙන් විශේෂ මණ්ඩපයක වැඩමවා විවෘතව තැබීම ද මැදියම් රැය වනතුරු දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව ද සිදු කරයි.


- **මහ සිකුරාදා**
  මෙදින කිතු සමිඳුන්ගේ කුරුසියේ මෙහෙයකි. සවස 3.00 ට පමණ මෙහෙය ඇරඹේ. සමහර ස්ථානවල තුන් පැය ධ්‍යානය හා පාස්කු නාට්‍ය පැවැත්වේ. මෙහෙය කොටස් තුනකි.
  - දේව වාක්‍ය මෙහෙය
  - ශ්‍රී කුරුසේ වන්දනාව
  - දිව්‍ය සත්ප්‍රසාද මෙහෙය වශයෙනි.

  වත්මන් මහ සිකුරාදා ජයග්‍රාහී දිනයක් ලෙස නම් කර ඇත. මෙදින කුරුසේ අභිරහස ගැන ගැඹුරින් මෙනෙහි කරන ශාන්ත සහාව ගොඩමස් වැළැකීමට එක්වරු ශීල රැකීමට නියම කර ඇත.

- **ශුද්ධ වූ සෙනසුරාදා**
  සමිඳුන්ගේ උත්ථානයේ ප්‍රීතිය භුක්ති විඳින දිනයයි. සාමාන්‍යයෙන් දේවස්ථානය වසා තබයි. පාස්කු පූර්ව රාත්‍රී මෙහෙය සිදු කරන්නේ මෙදින රාත්‍රියේ ය. එය කොටස් හතරකි..
  - ආලෝකයේ මෙහෙය
  - දේව වාක්‍ය මෙහෙය
  - ප්‍රසාද ස්නාපන මෙහෙය
  - දිව්‍ය පූජා මෙහෙය

  ජලය ආසිරි ගැන්වීම - පාස්කු ඉටි පහන දැල්වීම මෙදින විශේෂ පිළිවෙත් ය. මෙදින වැඩිහිටියන්ට ප්‍රසාද ස්නාපනය දානය කිරීම පුරාණයේ සිට පැවත එන සම්ප්‍රදායකි.

- **පාස්කු ඉරු දින**
  ජේසු සමිඳුන් විජයග්‍රාහී උත්ථානය සිහිගන්වයි. පාස්කු මංගල්‍යය ජනවන්දනා වර්ෂයේ ප්‍රධානත ම මංගල්‍ය යි. කිතුනු ජීවිතයේ කේන්ද්‍රයයි. මෙදින ප්‍රසාද ස්නාපන පොරොන්දු අලුත් කරන අතර දේව වචනය තුළින් අපව ගෙන යන්නේ සමිඳුන්ගේ උත්ථානයේ පුවත තුළින් නව පාස්කුවක්, නික්මයාම සිද්ධිය තුළින් පුරාණ පාස්කුවක් අන්දකින්නට ය.



## හයවන පාඩම

**යාච්ඤාව**

**යාච්ඤාව යනු කුමක්ද?**

කතෝලික සභාවේ ධර්මෝපදේශය ක්‍රිස්තියානි යාච්ඤාව කොටස් දෙකකට බෙදා දක්වයි.

1. ක්‍රිස්තියානි ජීවිතය හා යාච්ඤාව.
2. ස්වාමීන් වහන්සේ අපට දෙවා වදාළ යාච්ඤාව.

පළමු කොටස ජීවිතය ගැනත් දෙවන කොටස ස්වාමීන් වහන්සේ ඉගැන්වූ යාච්ඤාවත් ගැඹුරින් විස්තර කරයි.

**පුරාණ ගිවිසුමේ යාච්ඤාව**

පුරාණ ගිවිසුමේ යාච්ඤාව ගැන සඳහන් කිරීමේදී පළමුව අපට හමුවන පුද්ගලයා ආබ්‍රහම් තුමා ය. දේව අභිමතය ට එකඟවීම යාච්ඤාවේ ප්‍රධාන අංගයකි. තම දේශය අතහැර තමා පෙන්වන දේශයට යන ලෙස කළ දේව ආරාධනාවට ආබ්‍රහම්තුමා දුන්නේ යාච්ඤාමය පිළිතුරකි. කීකරුකමකි. නිහඬතාවයකි. වරක් දෙවියන් වහන්සේ හා ආබ්‍රහම්තුමා අතර සාකච්ඡාවකි. එහිදී සොදොම් ගොමොරා විනාශ නොකරන ලෙස ආබ්‍රහම් උන්වහන්සේගෙන් අයැදී ය.

මග පෙන්වන්නා වන මෝසෙස් යාච්ඤා ජීවිතයක් ගත කළ පුද්ගලයෙකු ලෙස මෝසෙස් තුමාව ද ගත හැක. ගිනිගෙන නොදැවෙන පඳුර අසලදී දෙවියන් වහන්සේ හට අවනත වීමට ඔහුට සිදුවිය. ඔහු දේව හඬට ඇහුම්කන් දුන්හ. ඉන්පසු මෝසෙස් හා දෙවියන් වහන්සේ අතර ගැඹුරු මිත්‍රත්වයක් විය. මුහුණට මුහුණ ලා කථා කිරීමට තරම් සුහද විය. එය ගැඹුරු යාච්ඤාවකි. සංවාදයකි.

ඊශ්‍රායෙල් ජනතාවගේ ජීවිතය තුළ යාච්ඤාව කෙතෙක් දුරට බලපා ඇද්දැයි පුරාණ ගිවිසුම තුළින් පෙනේ. ඔවුන්ගේ ශ්‍රේෂ්ඨ කෘතිය වූ ගීතාවලිය පෞද්ගලික යාච්ඤාවටත් සාංගික යාච්ඤාවටත් එය යොදා ගෙන ඇත. ප්‍රශංසාව, තුති දීම, ප්‍රමෝදය, භය, දුක, තරහ, සතුට. කලකිරීම එහි ඇති මිනිස් හැඟීම් විය. කිතුනු සභාව තම නිල යාච්ඤා සඳහා ගීතාවලිය භාවිතා කරයි.

**නව ගිවිසුමේ යාච්ඤාව**

1. සුවිශේෂක ලූක්තුමා ක්‍රිස්තුන් වහන්සේ යාච්ඤා කළේ කෙසේදැයි අපට වාර්තා කරයි. යාච්ඤාවේ වැදගත්කම මුළුමනින්ම අනාවරණය වූයේ ක්‍රිස්තුන් වහන්සේගේ මෙලොව මාංශගතවීමත් සමඟයි. එතුමාණෝ ජීවිත කාලය තුළ යාච්ඤා කළ යුතු ආකාරය සැබෑ ලෙස වචනයෙන් ඉගැන්වූවා පමණක් නොව ක්‍රියාවෙන් ද ප්‍රකාශ කළ සේක.
2. ක්‍රිස්තුන් වහන්සේ තම සේවාව පූර්ණ ලෙස පටන් ගැනීමට ප්‍රථම ඒ සඳහා සූදානම් වූ බව ලූක්තුමා සඳහන් කරයි. (ලූක් 4:1) උන්වහන්සේ නිතරම හුදකලා ස්ථානයකට ගොස් යාච්ඤා කළ සේක. සමහර අවස්ථාවල මුළු රාත්‍රියම යාච්ඤාවෙන් ගත කළ සේක. බොහෝ අවස්ථාවල පියාණන් වහන්සේ සමඟ දැඩි භාවනාවක යෙදුන සේක. තමන් වහන්සේගේ දූත කාර්යයේ වැදගත් අවස්ථාවල දීර්ඝවූ හා ගැඹුරුවූ යාච්ඤාවක යෙදුන සේක. ශ්‍රාවකයන් තෝරා ගැනීමේදී, අන්‍ය රූප විලාශවීමේදී, දුක් ප්‍රාප්තිය ආරම්භයේදී විශේෂ අන්දමින් යාච්ඤා කළ සේක. ලූක් 11වන පරිච්ඡේදය ක්‍රිස්තුන් වහන්සේ යාච්ඤා කළ ආකාරය සිත් කාවදින ලෙස අපට කියා පායි.

**විශ්වාසයෙන් යුතුව යාච්ඤා කිරීම**

- තවද ඔබට ඇදහිල්ල ඇත්නම් කවර දෙයක් ඉල්ලා යාච්ඤා කළත් එය ඔබට ලැබෙනු ඇත.
- (මතෙව් 21/22)
- මහ ලේ රෝගී ස්ත්‍රිය සුව කිරීමේ සිද්ධිය (ලූක් 8/43-48)
- මාරුතය දමනය කිරීමේ සිද්ධිය (ලූක් 8/22-25)
- බැහැපත්ව යාච්ඤා කළ යුතු බව පරිසියා හා අයකැමියා පිළිබඳ උපමාවෙන් උගන්වයි. (මාක් 8/19, 14)

**සභාව යාච්ඤා කරයි.**

**හැඳින්වීම**

දෙවිඳුන් යැදීම හෙවත් යාච්ඤාව කිතුනු ඇදහිල්ලේ ලක්ෂණයකි. යාච්ඤාව තුළ පෙනෙන නොපෙනෙන සියළු දේ මවා වදාළ දෙවිඳුන් සමඟ ගැඹුරු සැබෑදියාවක් ඇති කර ගනියි. එය සුහද සංවාදයකි. උන්වහන්සේව ස්වාමීත්වයෙන් පිළිගැනීමකි.

**සභාව තුළ යාච්ඤාව**

පෙන්තකොස්ත දිනයේදී, සභාව තුළ ක්‍රියාත්මක වූ ශුද්ධාත්මයාණන් බලාපොරොත්තුවෙන් සිටි ගෝලයෝ හා ප්‍රේරිතයෝ සියල්ල එකමුතුව, එක මනසකින් යුතුව යාච්ඤා කරමින්, දේව නියමය ඉටුවන මොහොත වනතුරු බලා සිටියෝය (ක්‍රියා 1:14). ශුද්ධාත්මයාණන් පැමිණීමත් සමඟම ක්‍රිස්තුන් වහන්සේගේ දහම උගන්වමින් එය ස්ථිර කළා පමණක් නොව සියල්ල නැවත මතකයට නඟා ගෙන එම දහම ජීවත් කරවන්නට උත්සාහ කළෝය (ක්‍රියා 2:42). පළමු ශත වර්ෂය තුළදී ළදරු සභාව යාච්ඤාවටත්, පූජ කැඩීමටත්, ඉගෙනීමටත් තැන දෙමින් තම ඉගැන්වීම තුළ සභාව ව්‍යාප්ත කළ බව පෙනේ (ක්‍රියා 4/29-30). යාච්ඤාවෙන් දෙවි පියාගේ ආධාරය පතන ලදී. පසුව එම යැදුම කොටස් පහකට බෙදා වෙන් කරන ලදී.

1. දේව ආශිර්වාදය හා දේව වන්දනාව උදෙසා-
   ආශිර්වාද කිරීම ක්‍රිස්තියානි යාච්ඤාවේ විශේෂ වූ අංගයකි.
2. ඉල්ලීම සඳහා කරනු ලබන යාච්ඤා-
   අපගේ පවුකාර බව පිළිගැනීම. එසේ පැමිණෙන්ට තිබෙන දේව රාජ්‍යයට හිමිකම් කියනු සඳහා අවශ්‍ය යාච්ඤාව.
3. තම සහෝදරයන් උදෙසා-
   ක්‍රිස්තියානි දිවියක් ගතකර අප අසල්වැසියා වෙනුවෙන් වැයවීම, කැපවීම පමණක් නොව ඔහුගේ අවශ්‍යතා වෙනුවෙන් යැදීම.

4. ස්තුති කිරීම-
   දිව්‍ය පූජාව ස්තුති කිරීමකි.
5. ප්‍රශංසාව කිරීමේ යාච්ඤාව-
   අප ප්‍රශංසා කළ යුත්තේ එතුමන් අපගේ බලවත් දෙවිඳුන් වන නිසාය.

**යාච්ඤාවේ අරමුණු**

- ස්වාමින් වහන්සේගේ මහිමය වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන් ද ප්‍රකාශ කිරීම.
- අපගේ සහෝදරයන්ගේ ආත්මික හා ශාරීරික අවශ්‍යතා සඳහා දෙවිඳුන් යැදීම.
- දෙවියන් වහන්සේගේ මහිමය සඳහා ක්‍රිස්තුන් වහන්සේ තුළ ලෝකය ඒකරාශි කිරීම.
- අපගේම ආත්මික හා ශාරීරික අවශ්‍යතා දෙවිඳුන් වෙත ඉදිරිපත් කිරීම.
- දෙවියන් වහන්සේ වෙත අපගේ ගැඹුරු භක්ත්‍යාදරය ප්‍රකාශ කිරීම.
- සමිඳු ප්‍රේමයට ප්‍රති ප්‍රේමය දැක්වීම.

**යාච්ඤාවේ ගුණාංග හෙවත් ලක්ෂණ**

- යාච්ඤාවේ ප්‍රධාන ගුණාංගය ඇදහිල්ල හෙවත් විශ්වාසයයි. ක්‍රිස්තුන් වහන්සේ තම ජීවිත කාලයේදීම එය අපට ඉගැන්වූ සේක. (මතෙව් 21/22 ලූක් 8/43-48 ලූක් 8/22-25 අධ්‍යයනය කරන්න.)
- යාච්ඤා කිරීමේදී අවශ්‍ය ගුණාංගයකි බැහැපත්කම. පරිසිවරයා හා අයකැමියාගේ උපමාව මගින් මේ බව ජේසුස් වහන්සේ පැහැදිලි කළ සේක. ලූක් 18/9-11
- අප ප්‍රේමයෙන් යුක්තව යාච්ඤා කළ යුතු ය. එනම් හදවත තුළ ඇති වෛරය, ක්‍රෝධය, පලිගැනීම ඉවත ලා සැම දෙන කෙරෙහි ගැඹුරු ප්‍රේමයක් ගොඩ නැඟිය යුතු ය. එවිට දෙවියන් වහන්සේ ද අපට ප්‍රේම කරයි. (මතෙව් 5/23-34 කියවන්න) උන්වහන්සේගේ පූර්ණ ආරක්ෂාව අපට ලැබේ. අධෛර්ය නොවී නොකඩවා යාච්ඤා කළ යුතු බව උපමා මගින් දක්වයි. වැන්දඹුව හා විනිශ්චයකාරයාගේ උපමාවෙන් ද (ලූක් 18/1-8) මහ රෑ පූප ඉල්ලා ගිය මිත්‍රයගේ උපමාවෙන් ද අපට උගන්වයි.
- ගැඹුරු ප්‍රේමයෙන් එකමුතුව යාච්ඤා කළ යුතු බව මතෙව් 5/23-24 අපට කියාදෙයි.
- බොහෝ දෙනා යාච්ඤා කර තමා ඉල්ලන දෙය නොලද හොත් අතරමග නවතා දමයි. එය විශ්වාසය හීන බවේ ලකුණකි. තමා ඉල්ලන දෙය ලැබීම හෝ නොලැබීම දේව අභිමතයයි. අප එයට හිස නැවිය යුතු ය. ඔබ ඉල්ලන්ට පෙර ඔබට අවශ්‍ය දේ පියාණන් වහන්සේ දන්නා සේකැයි කිතු සමිඳුන් තම ශ්‍රාවකයින්ට පවසා ඔවුන්ව යාච්ඤාවට උනන්දු කළ සේක.
- විශ්වාසයෙන් යුක්තව යාච්ඤා කළ යුතුය. මහ ලේ රෝගී ස්ත්‍රිය සුව කිරීමේ සිද්ධිය ලූක් 8/43-48, මරුත දමනය කිරීමේ සිද්ධිය 8/22-25, ජයිරස්ගේ දියණිය ලූක් 8/49-56. තව ද ඔබට ඇදහිල්ල ඇත්නම් කවර දෙයක් ඉල්ලා යාච්ඤා කළත් එය ඔබට ලැබෙනු ඇත. මතෙව් 21/22.
- යාච්ඤා කිරීමේදී භක්තිය හෙවත් පූර්ණ අවධානය යොදාගැනීම අවශ්‍ය ය. ජේසුස් වහන්සේ ගෙත්සෙමෙනෙහිදී, නුඹලා පරීක්ෂාවට නොපැමිණෙන පිණිස අවදිව සිට යාච්ඤා කරපල්ලා යයි තම ශ්‍රාවකයන් දැනුවත් කරමින් යාච්ඤාවේදී දුර්පරීක්ෂාව පැමිණෙන බවත් ඒ සඳහා ගැඹුරු භක්තියෙන් හා සාවධානව යාච්ඤා කළ යුතු බවත් ඉගැන්වූහ. (ලූක් 22/40, 46).

ස්වාමින් වහන්සේ අපට යාච්ඤා කිරීමට උපදෙස් දෙයි. උගන්වයි.

ගතානුගත පිළිවෙත්වලින් මිදී යාච්ඤා කළ යුතු ආකාරය ක්‍රිස්තුන් වහන්සේ තම ගෝලයන්ට ඉගැන්වූ සේක. උන්වහන්සේගේ ගෝලයෝ යාච්ඤා කළ යුතු විලාශය ගැන කියා දෙන මෙන් ඉල්ලූහ. භය මුල් කරගත් භක්තියකින් නොව ආදරය පදනම් කරගත් හැඟීමකින් තම දෙව් පියාණන් අමතන සැටි පෙන්වා දුන් උන්වහන්සේ ස්වාමිවාක් ආරාධනාව ඔවුන්ට ඉගැන්වූ සේක. එම යාච්ඤාව ඉතා සරලය. එහෙත් යාච්ඤාවේ තිබිය යුතු සියළු ගුණාංග එහි අඩංගු වී ඇත. එනම්

- දේව ප්‍රශංසාව හා නමස්කාරය
- ඉල්ලීම
- සමාව දීම
- දේව ආරක්ෂාවට බාරවීම ය.

ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේගේ ආදර්ශමත් ජීවිතය මගින් යාච්ඤාවේ අගය පෙන්වා දුන් සේක. ක්‍රිස්තු භක්තිකයාගේ යාච්ඤා ක්‍රමයේ පරම ආදර්ශය ක්‍රිස්තුන් වහන්සේ ය. උන්වහන්සේ දොලොස් වයසේ සිට පියාණන් වහන්සේගේ කටයුතු වල යෙදෙමින් යාච්ඤා ජීවිතය අභ්‍යාස කළ සේක.

**උන්වහන්සේගේ ආදර්ශ**

- නිරාහාරව යාච්ඤා කිරීම (මතෙව් 4/2).
- හිරු උදාවට කලින් යාච්ඤා කිරීම (මාක් 1/35).
- හුදකලා ස්ථානයකට ගොස් යාච්ඤා කිරීම (මාක් 1/35).
- පියාණන් වහන්සේගේ කැමැත්තට එකඟව යාච්ඤා කිරීම (මාක් 26/39).
- නොකඩවා යාච්ඤා කිරීම.
- ශුද්ධාත්ම වරම් ඉල්ලා යාච්ඤා කිරීම (පාළුකරය).

(ඉහත ඇති බයිබල් පාඨ අධ්‍යයනය කරන්න).

ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේගේ ආදර්ශමත් ජීවිතය මගින් යාච්ඤාවේ අගය පෙන්වා දුන් සේක. ක්‍රිස්තු භක්තිකයාගේ යාච්ඤා ක්‍රමයේ පරම ආදර්ශය ක්‍රිස්තුන් වහන්සේ ය.
උන්වහන්සේ දොළොස් වයසේ සිට පියාණන් වහන්සේගේ කටයුතු වල යෙදෙමින් යාච්ඤා ජීවිතය අභ්‍යාස කළ සේක.

**උන්වහන්සේගේ ආදර්ශ**

- තිරාහාරව යාච්ඤා කිරීම. (මතෙව් 4/2)
- හිරු උදාවට කලින් යාච්ඤා කිරීම. (මාක් 1/35)
- හුදකලා ස්ථානයකට ගොස් යාච්ඤා කිරීම. (මාක් 1/35)
- පියාණන් වහන්සේගේ කැමැත්තට එකඟව යාච්ඤා කිරීම. (මාක් 26/39)
- නොකඩවා යාච්ඤා කිරීම.
- ශුද්ධාත්ම වරම් ඉල්ලා යාච්ඤා කිරීම. (පාළුකරය)

*(ඉහත ඇති බයිබල් පාඨ අධ්‍යයනය කරන්න)*

**<u>මුල් ක්‍රිස්තියානි සභාව යාච්ඤා කරයි.</u>**

යාච්ඤාව ශුද්ධාත්ම දීමනාවකි. පියාණන් වහන්සේට අබ්බා පියාණෙනි කියා යදින්නට අප හදවත් විවෘත කරන්නේ ශුද්ධාත්මයාණෝය. ගැඹුරු යාච්ඤාව සඳහා ශුද්ධාත්ම වරම් අවශ්‍ය ය. එදා ක්‍රිස්තුන් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසු මුළු කිතුනු පවුල නියෝජනය කරමින් උඩු මහලේ සිටි පිරිස පළමුව එක්සිත්ව නොකඩවා යාච්ඤා කළහ. ශුද්ධාත්මයාණන් පැමිණීමෙන් පසු දිරිමත් වූ ඔවුන් යාච්ඤා කිරීමට කුඩා කිතුනු කණ්ඩායම් මෙහෙයවූහ. ඔවුහු ප්‍රේරිතයන්ගේ ඉගැන්වීමෙහි ද, සහභාගිකමෙහි ද, රොටි කැඩීමෙහි ද, යාච්ඤාවෙහි ද නිරතව කල්ගත කළහ. (ක්‍රියා 2/42-47) ට කියවා අධ්‍යයනය කරන්න. මුල් කිතුනු සභාවේ විශේෂ ලක්ෂණ සොයා ගන්න.

**<u>ශුද්ධ වූ සභාවේ සාමූහික හා පුද්ගලික යාච්ඤාව</u>**

නිරන්තරයෙන් සභාව යාච්ඤාව සඳහා සැදැහැවතුන් උනන්දු කරවයි. පොදු වන්දනාව හෙවත් සාමූහික යාච්ඤාව සභාව තුළ නිල වශයෙන් කෙරෙන විට එය ජනවන්දනාව යනුවෙන් හඳුන්වයි. මේ සාමූහික ප්‍රධාන නිල යාච්ඤාව ක්‍රියාත්මක වන්නේ දිව්‍ය පූජාවේදී ය. එය පූජකවරයකුගේ වැදගත් බව තුළ දේව ජනතාව කරන යැදුමකි. සාමූහිකව දෙවිඳුන් යැදීමේ දී බලගතුව උන්වහන්සේ අප මැද වැඩ සිටියි. (මතෙව් 18/20).

- ඒ හැර ශුද්ධ වූ පැය, බයිබල් මෙහෙයන් සුව මෙහෙයන් සන්ධ්‍යා මෙහෙයන් හා පොදු පාද නමස්කාර ද සාමූහික යාච්ඤාවකි. සාමූහික යාච්ඤාව දේව ප්‍රශංසාවක් වීමට නම් සියල්ලෝ සහභාගී වී යාච්ඤා කළ යුතු ය. ගීත ගායනා කළ යුතු ය.
- පවුලේ එකමුතු යාච්ඤාව ද පොදු යාච්ඤාවක් ය. මේ සඳහා ජපමාලය උච්චාරණය කිරීම හා නිතර භාවිතා කරන යාච්ඤා කිපයක් ඇත. නමුත් එය එකමුතු ප්‍රශංසාවක් වීමට නම් පියා හෝ මව මූලිකත්වය ගෙන ගීතාවලිය, ශුද්ධවූ බයිබලය හා ගීතිකා මුල් කරගෙන, සාමූහික දේව ප්‍රශංසාවක් කළ හැක. ගතානුගතික පිළිවෙත් වලින් මිදී යාච්ඤා කිරීමට අප පුරුදු විය යුතු ය.
- අපට පෞද්ගලිකව ද යාච්ඤා කරන ලෙස සභා මාතාව ආරාධනා කරයි. සුදුසු පරිසරයක් තෝරාගෙන වාචිකව හෝ නිහඬව හෝ යාච්ඤා කළ හැක.
- අළුයම අවදිවූ විට, රාත්‍රියට නින්දට යාමට පෙර අනිවාර්යයෙන් අප යාච්ඤා කළ යුතු ය. එමෙන්ම හදිසි අවස්ථාවකදී අපගේ ප්‍රධාන වැඩ කටයුතු පටන් ගැනීමට පෙර හා පසු කෑමට පෙර හා පසු යාච්ඤාවට අපට පුරුදු විය යුතුය. සභා මාතාව අපට උගන්වන අනුමත කර ඇති පොදු යාච්ඤා කටපාඩමින් භක්තියෙන් උච්චාරණය කළ හැක. සංඝයක් වශයෙන් ද ඒවා උච්චාරණය කිරීම යහපත් ය.

**<u>සභා මාතාව අනුමත කර ඇති යාච්ඤා</u>**

* කුරුසේ ලකුණු
* ස්වාමිවාක් ආරාධනාව
* විශ්වාස ලක්ෂණය
* දයාධික මනස්ථාපය
* දේව මෑණියන්ට යාච්ඤාව
* පාස්කු කාලයේ තුන්කාල ආරාධනාව
* මංගල්‍ය ආරාධනාව
* පාප උච්ජාරණ ආරාධනාව
* ස්ප්‍රිතු සාන්තු යාච්ඤාව
* ත්‍රිත්ව ස්තෝත්‍රය
* නමෝමරිය යාච්ඤාව
* තුන්කාලේ උආරාධනාව
* රාත්‍රි ආරාධනාව
* රැකවල් දූතයාට යාච්ඤාව
* භෝජන ස්තෝත්‍රය
* මිඛායෙල් අග්‍රදූතයාට යාච්ඤාව
* උදය ආරාධනාව
* භෝජන ආශිර්වාදය ජපමාලේ අභිරහස්

**මෙම යාච්ඤා කට පාඩම් කරගන්න:**

* **කුරුසේ ලකුණ**
  කුරුසිය අපගේ ගැලවීමේ සංකේතයයි. මෙහිදී අපි ශුද්ධ වූ ත්‍රිත්වයට කැපවෙමු. එය අංග චලනයෙන් ප්‍රකාශ කරමු. ශුද්ධ වූ ත්‍රිත්වයට කැපවෙමු.

* **ත්‍රිත්ව ස්තෝත්‍රය**
  ත්‍රිත්වයේ අභිරහස ප්‍රකාශ කරයි. ත්‍රිත්වික දෙවිඳුන්ට ප්‍රශංසා කරයි. ආදියේ මෙන් අනන්තය දක්වා වැජඹෙන බව ප්‍රකාශ කරයි.

* **ස්වාමිවාක් ආරාධනාව**
  අප සමිඳාණන් ගෝලයන්ට ඉගැන්වූ යාච්ඤාවයි. යාච්ඤාවක තිබිය යුතු සෑම ලක්ෂණයක්ම ගුණාංගයක්ම අඩංගුව ඇත. මෙය කොටස් 4 කි.
  - ප්‍රශංසාව - ස්තෝත්‍රය - ජීවිතයට අවශ්‍ය දෑ ඉල්ලීම - සමාව යැදීම.

* **නමෝමරිය (දේව දූත මංගලම්)**
  දේව මාතාවන්ගේ පිහිට හා මධ්‍යස්ථකම ඉල්ලා සිටින්නේ මේ යාච්ඤාව මගින් ය. කිතුනු අපේ ප්‍රධාන යාච්ඤාවකි. මෙම යාච්ඤාව කොටස් තුනකි.
- ගාබ්‍රියෙල් දූතයා මංගලම් කී වචන
- එලිසබෙත්තුමිය මරියතුමියට ආචාර කළ වචන
- සභාව එක් කළ කොටස

* **විශ්වාස ලක්ෂණය**
  කතෝලික ධර්මයේ ප්‍රධාන සත්‍යතා අඩංගු වී ඇත්තේ විශ්වාස ලක්ෂණයේ ය. අප විශ්වාස කළ යුතු සත්‍යතා දොළහක් මෙහි ඇත.

* **තුන්කාල ආරාධනාව**
  ලූක් සුබාරංචිය ඇසුරු කරගෙන මාංශගතවීමේ අභිරහස සිහි කිරීමට නිර්මාණය කළ යැදුමකි. දිනකට තෙවරක් මෙම යාච්ඤාව උච්චාරණය කිරීමට සභා මාතාව අපට ආරාධනා කරයි.

* **දයාධික මනස්තාපය**
  පව් සමාවත්, පසුතැවිල්ලත් තුළින් යහපත් ජීවිතයක් ගත කිරීමට දෙවිඳුන්ට වන පොරොන්දුවකි.
* **ජපමාලේ අභිරහස**
  ජේසුස් වහන්සේ හා දේව මාතාවන්ගේ ජීවිතයේ ප්‍රධාන සිදුවීම් ගැලවීමේ අභිරහසට සම්බන්ධ වන අයුරින් ජපමාලය උච්චාරණය කිරීම අර්ථවත් ගැඹුරු යාච්ඤාවකි. ගැඹුරු මෙනෙහි කිරීමකි.
  ජපමාල පන්ති කියන විට අභිරහස් කොටස් හතරක් වශයෙන් කියවේ.

1. **ආනන්ද අභිරහස්** (සඳුදා, සෙනසුරාදා සහ ආගමන සමයේ ඉරුදින වල)
   - ගාබ්‍රියෙල් දේව දූතයා දේව මෑණියන්ට මංගලම් කීම. (ලූක් 1:30-31)
   - මරියතුමි එලිසබෙත් තුමිය බැහැදකින්නට යාම. (ලූක් 1:42-43)
   - ක්‍රිස්තුන් වහන්සේගේ උත්පත්තිය. (ලූක් 2:7)
   - ක්‍රිස්තුන් වහන්සේ දේව මාලිගාවේ ඔප්පු කිරීම (ලූක් 2:25-35)
   - 12 වයසේ දී ක්‍රිස්තුන් වහන්සේ'ද්ව මාලිගාවේ නැතිවී සම්භවීම. (ලූක් 2:41-51)

2. **වික්ෂෝප අභිරහස්** (අඟහරුවාදා, සිකුරාදා චතාරික සමයේ ඉරුදින වල)
   - ක්‍රිස්තුන් වහන්සේ මල් උයනේ දී යාච්ඤා කිරීම. (මාක් 14:36)
   - ක්‍රිස්තුන් වහන්සේව ගල් කනුවේ බැඳ කස පහර දීම. (මාක් 15:15)
   - ක්‍රිස්තුන් වහන්සේට කටු ඔටුන්න පැළඳවීම. (මාක් 15:17-18)
   - ක්‍රිස්තුන් වහන්සේ, බරවූ කුරුසිය කර තබා ගෙන යාම. (ජුවාම් 19:17)
   - ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ උකුත්වීම. (ලූක් 23:46)

3. **මෝක්ෂ අභිරහස්** (බදාදා සහ ඉරිදා දිනවල)
   - ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වීම. (මතෙව් 28:5-6)
   - ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ගාරෝහණ වීම. (ක්‍රියා 1:9-11)
   - දෙව් මවුන් හා ගෝලයන් වෙත ශුද්ධාත්මයාණෝ වැඩම කිරීම. (ක්‍රියා 2:2-4)
   - දෙව් මවුන් ආත්ම ශරීර පිටින් ස්වර්ගයට ඔසවනු ලැබීම. (තෙසලෝනික 4:14-17)
   - දෙව් මවුන් ස්වර්ග රාජ්‍යයේ රාජේශ්වරිය ලෙස ඔටුනු පැළඳවීම. (එළිදරව්ව 12:1)

4. **ආලෝකයේ අභිරහස** (බ්‍රහස්පතින්දා දිනවල)
   - ජේසුස් වහන්සේගේ බෞතිස්ම ස්නාපනය. (මාක් 1:9-11)
   - කානා නුවර විවාහ මංගලෝත්සවය. (ජුවාම් 2:3-5)
   - කඳු මුදුනේ දේව රාජ්‍යය ප්‍රකාශ කිරීම. (මතෙව් 5:1-12)
   - ජේසුස් වහන්සේගේ අන්‍යරූප විලාශවීම. (මාක් 9:2-7)
   - ජේසුස් වහන්සේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීම. (මතෙව් 26:26-28)

# හත්වන පාඩම

## 7. දෙවෙනි වතිකාන මන්ත්‍රණ සභාව

සභා ඉතිහාසයේ **21** වන මන්ත්‍රණ සභාවයි. දෙවන වතිකාන ජගත් මන්ත්‍රණ සභාව කැඳවන බව **23** වන ජුවාම් පාප් වහන්සේ අනාවරණය කළේ **1959** දිය. ක්‍රි.ව. **1962-1965** දක්වා කාලසීමා තුළ පවත්වන ලදි. මෙහි පුරෝගාමියා වූයේ **23** වන ජුවාම් පාප්තුමාය. එතුමා හදිස්සියේ ස්වර්ගස්ථ විය. එමනිසා ඉන්පසු ශුද්ධාසනයට තේරුණ **6** වන පාවුළු පාප්තුමා විසින් මෙම සම්මේලනය ඉදිරියට ගෙන යන ලදි. මෙහි ප්‍රධාන සැසිවාර **4**කි. අවුරුදු **4**ක සූදානම් වීමේ කාලයක් විය.

**1962** ඔක්තෝම්බර් **11** වන දින සිට දෙසැම්බර් **8** වන දින දක්වා - පළමු සැසිවාරය
**1963** සැප්තැම්බර් **29** වන දින සිට දෙසැම්බර් **4** වන දින දක්වා - දෙවන සැසිවාරය
**1964** සැප්තැම්බර් **14** වන දින සිට නොවැම්බර් **21** දක්වා - තුන්වන සැසිවාරය
**1965** සැප්තැම්බර් **14** වන දින සිට දෙසැම්බර් **8** දක්වා - හතරවන සැසිවාරය

### පසුබිම

පළමුවන වතිකාන ජගත් සම්මේලනය ආරම්භවූයේ **1869** දෙසැම්බර් **8** වන දිනය. මෙම සම්මේලනයේ අනුමැතිය සඳහා කෙටුම්පත් **51** ක් විය. එයින් අනුමත කරගත හැකිවූයේ කෙටුම්පත් දෙකක් පමණ ය. **1870** වන විට ප්‍රංශ ප්‍රසියන් යුද්ධය ආරම්භ විය. එබැවින් ජර්මන් බිෂොප්වරු බොහෝ දෙනෙක් තම රට බලා පිටත්වී තිබුණි. මේ අතර සතුරු හමුදාව විසින් රෝමය අල්ලාගන්නා ලදි. එබැවින්, මෙම ජගත් සම්මේලනය අතර මග නවතා දැමීමට සිදුවිය. එහිදී

- විශ්වාසයට හා ශීලධර්මයට විරුද්ධව පැන නැගී ඇති දුර්මත බිඳ දැමීම.
- පරිවර්තන යුගයකට ගැළපෙන ලෙස විනය කරුණු සකස් කිරීම.
- සභාවේ තත්ත්වය සවිස්තරව විග්‍රහ කිරීම.
- රාජ්‍යයක් සමග අත්වැල් බැඳ ගැනීම, යන පරමාර්ථ ඉටු කර ගැනීමට නොහැකිවිය එබැවින්, මේවා ඉදිරියට ගෙන යාමේ අවශ්‍යතාවය ශුද්ධාසනයට පෙනිණි.


### දෙවන වතිකාන කතිකාවට පෙර ලෝකය

මධ්‍යතන යුගයේ පටන් චින්තන කටයුතු කෙරුණේ විෂය මූලිකවය. අවධානය යොමුවූයේ සත්‍යතාවයන්ට පමණකි. මධ්‍යගත යුගයේ විෂය මූලික බලපෑම් ඇතිව ලියවුණු විශ්වාසයේ සත්‍යතාවයන් කාලයට නොගැලපෙන සුලුවිය. මේ වනවිට සභාව තුළත් සභාවෙන් පිටත් දාර්ශනික චින්තනයේ පැහැදිලි වෙනසක් දක්නට විය. විශ්වාසයේ සත්‍යතාවයන් සැබෑ ජීවිතයෙන් දුරස්තර විය. විද්‍යාපුනරුදය, කාර්මික විප්ලවය, ප්‍රංශ විප්ලවය යනාදිය නිසා විශ්වාසයෙන් බැහැර ලොවකට නැඹුරු සංස්කෘතියක් බටහිර යුරෝපයේ උදාවිය. මැවුම්කාර දෙවියන්ට වඩා මිනිසාට කේන්ද්‍රිය පුද්ගලයෙකු වශයෙන් වැදගත් තැනක් හිමිවිය.

### දෙවන වතිකාන කතාකාවට පෙර සභාව

මේ වනවිට සභාව තුළ ආයතනික ස්වරූපයක් ගොඩනගා තිබුණි. සභාව තුළ පැවිදිවරුන්ට පුළුල් බලතල හා වගකීම් තිබුණි. ගිහියාට සභාව තුළ ලැබුණේ පහත් තත්ත්වයකි. රූප සටහනකින් මෙසේ දැක්විය හැක.

ගිහියා **Pay–Pray–Obey** එනම් මුදල් ගෙවන්නට, සභාව වෙනුවෙන් යාච්ඤා කරන්නට, සභාවේ අණට කීකරු වන අණ පිළිපදින්නෙක් විය. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් පසු මේ තත්ත්වය වෙනස් විය.




ලෞකික ප්‍රගතියටත්, නවතාවයටත් සරිලන, ඊට ගැලපෙන ප්‍රතිසංස්කරණයක් හා නවෝදයක් සභාව තුළ ඇතිවිය යුතු බව **23** වන ජුවාම් පාප්තුමාට අවබෝධ විය. එබැවින් කාලාන්තරයක් තුළ වසා තිබුණු සභාවේ දොරකවුළු විවෘත කළ යුතුයයි එතුමා අදහස් කළහ. ජුවාම් පාප්තුමාගේ නායකත්වය යටතේ සභාව සුබවාදීව ගමන් ඇරඹූහ. සුබසාධක වැඩපිළිවෙලවල් ඇරඹූහ. එතුමා ලියූ <u>අයුක්තියට පිළිතුර, ලෝක සාමය</u> යන විශ්ව ලේඛන වලින් ඒ බව පෙනී යයි. විවිධ ක්‍රිස්තියානි සභා තුළ එකමුතුවක් ඇති කිරීම එතුමාගේ අදහස විය. සභාවේ ඇති ජයග්‍රාහී ලීලාවට වඩා බැහැපත් ගතිය අගය කළ **23** වන ජුවාම් පාප්තුමා ඇතැම් කාල පරිච්ඡේදවලදී සභාවෙන් සිදුවූ වැරදි ගැන ප්‍රසිද්ධියේ සමාව අයැදීමට තරම් බැහැපත් විය. ඉහත කරුණු රාශිය අවධානයට ගනිමින් ඒ අනුහස දස දෙස පැතිරවීම සඳහා ජගත් සම්මේලනයක අවශ්‍යතාවය එතුමාට පෙනී ගියේ ය.

### දෙවන වතිකාන කතිකාව පැවැත්වීමේ මූලික පරමාර්ථය

1. පළමු වන වතිකාන කතිකාව ප්‍රංශ ප්‍රසියන් යුද්ධය නිසා දිගටම කර ගෙන යාමට නොහැකි විය. එබැවින් ඉතිරි වූ කෙටුම් පත් වල අඩංගු කරුණු මගින් සභාව නැවත ප්‍රාණවත් කිරීම **23** වන ජුවාම් පාප්තුමාගේ අදහස විය.
2. පළමු ජගත් මන්ත්‍රණ සභාව විශේෂයෙන්ම ධර්ම සත්‍යයන් ආරක්ෂා කිරීම හා ධර්ම විරෝධීන් හා මිථ්‍යා ලබ්ධිකයන්ට විරුද්ධ විය. එහෙත් **2** වන වතිකාන කතිකාවෙන්, ධර්ම සත්‍යයන් ආරක්ෂා කිරීමට වඩා එඬේරික සේවයක් කිරීමේ අරමුණ ඉදිරිපත් විය. එනම් කතිකාවේ මූලික අරමුණ වූයේ මිනිසාගේ වැදගත් බව හා උතුම්කම පෙන්වී ය.

3. පවුල හා සමාජ ජීවිතය ඇතුළු මානව ක්‍රියාකාරිත්වයේ සෑම මට්ටමකටම දහම ගෙන යාමේදී ශුද්ධ ලියවිල්ලට හා පළමු පියවරුන්ගෙන් උරුම වූ දහම් සත්‍යතා වෙත දැඩි අවධානය යොමු කිරීම.
4. විශ්වාසයේ සත්‍යතාවයක් වෙනස් වන ලෝකයට එනම් නූතන මිනිසාගේ මනෝභාවයට ගැලපෙන පරිදි දෙව් දහම තුලින් ඉදිරිපත් කිරීම.
5. ලෝකය එක් දිසාවකට ගමන් කරද්දී, ඊට ඉදුරාම වෙනස්වූ මාර්ගයක සභාව ගමන් කළ බැවින් කාලාන්තරයක් වසා තිබූ සභාවේ දොරකවුළු විවෘත කර සභාව ලෝකය තුළ මාංශ ගත විය යුතු බව **23** වන ජුවාම් පාප්තුමාට වැටහීයාම.
6. විවිධ ක්‍රිස්තියානි සභා අතර මේ තාක් එකිනෙකා කෙරෙහි තිබූ සැකය හා අවිශ්වාසය දුරු කර සභා එකමුතුවකට මග පාදා ගැනීම.

දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ සාකච්ඡා වල සෑම දෙයක්ම ප්‍රධාන තේමා හතරකට වෙන් කළ හැක.

- දෙවියන් වහන්සේ - ආදරවන්ත පියෙක් බව (ජොහාන් **15/13**, ලූක් **5/20**, මතෙව් **6/9**)
- මනුෂ්‍යයා - මිනිසා දේව ස්වරූපයට හා සමානකමට මවා ඇති බව (උත් **2/19-20**)
- ශුද්ධවූ සභාව - උත්ථානවූ ක්‍රිස්තුන් වහන්සේ ඉතිහාසය තුළ ලෝක අන්තිමය දක්වා වැඩ සිටීම (මතෙව් **28/16-20**)
- ලෝකය - මුළු මිනිස් සංහතියම එකම පවුලක් ලෙස ජීවත්වීම

(මිනිස් වටිනාකම් හා ක්‍රිස්තියානි වටිනාකම් අතර වෙනසක් නැත) අද නවීන ලෝකය තුළ යුක්තිය, සත්‍යය සාධාරණත්වය, සංවර්ධනය යනු ක්‍රිස්තුන් වහන්සේට තවත් නමිය. (උත්පත්ති **1/31**)

**දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පිළිබඳ ජනතා ප්‍රතිචාරය.**
ජනතා ප්‍රතිචාරය ඒකාකාර නොවේ. විවිධ කොටස් තම මතිමතාන්තර අනුව විවිධාකාරයෙන් ඊට ප්‍රතිචාර දැක්වූහ.

- මුල සිටම පුද්ගල මූලික චින්තන ක්‍රමය කෙරෙහි පැහැදී සිටි පිරිස් දෙවන වතිකාන කතිකාව ඉමහත් ආශාවකින් පිළිගත්හ.
- ඇතැමෙක් මෙම ඉගැන්වීම් තමනට නුහුරු නුපුරුදු දෙයක් වුවත් සභාවේ ගුරු බලය වෙත ඇති ගෞරවය නිසා පිළිගත්හ.
- සමහරෙක් වතිකාන කතිකාව මානුෂික අංශය හා ලෝකය වෙත නැඹුරු වෙමින් ධර්මානුකූල අංශය නොසලකා හැරියේ යයි චෝදනා කළහ.

කතිකාවතේ ඉගැන්වීම් වල ගැඹුරු හා නවතාවය ගැන බලන කල මෙවැනි ප්‍රතිචාරයක් ඇතිවීම පුදුමයට කරුණක් නොවේ යයි පවසන **6** වන පාවුළු පාප්තුමා කතිකාව අවසන් කරමින් එහි අරමුණ ඉටුවී ඇති බව සඳහන් කළේය. තුන්වන ප්‍රතිචාරය පදනම් විරහිත බව ප්‍රකාශ කළේය. දෙවන වතිකාන කතිකාවේ ශුද්ධවූ සභාව අනුගමනය කරන්නේ යහපත් සමරිතානුවරයාගේ උපමාවෙන් ඉදිරිපත්වුණු සහෝදර දයාව පදනම් කරගත් අධ්‍යාත්මිකත්වයෙන් බව එතුමෝ ප්‍රකාශ කළහ.

**දෙවන වතිකාන කතිකාවෙන් ගත් තිරණ ප්‍රකාශන 16 කින් තිකුත් කරන ලදී.**

ඒවා වර්ග තුනකට බෙදිය හැක. එනම්

- ව්‍යවස්ථා
- නියෝග (ආඥා)
- ප්‍රකාශ

**ව්‍යවස්ථා හතරකි**
1. ජනවන්දනාව පිළිබඳ ව්‍යවස්ථාව
2. ශුද්ධ සභාව පිළිපද ධර්ම ව්‍යවස්ථාව
3. දේව ප්‍රකාශන පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව
4. නූතන ලෝකයේ ශු. සභාව පිළිබඳ උපදේශාත්මක ව්‍යවස්ථාව

**නියෝග හා ව්‍යවස්ථා නවයකි.**
1. ජනසන්නිවේදන මාධ්‍ය පිළිබඳ නියෝග
2. පෙරදිග සභා පිළිබඳ නියෝග
3. සභා එකමුතුව තහාලීම පිළිබඳ නියෝග
4. රදගුරුතුමන්ලාගේ වගකීම් පිළිබඳ නියෝග
5. පැවිදි දිවිය කාලානුරූප කිරීම පිළිබඳ නියෝග
6. පූජක පුහුණුව පිළිබඳ නියෝග
7. ගිහි ධර්ම දූත සේවාවන් පිළිබඳ නියෝග
8. සභාවේ ධර්ම දූත සේවාවන් පිළිබඳ නියෝග
9. පූජක ජීවිතය හා සේවාව පිළිබඳ නියෝග

**ප්‍රකාශන තුනකි**
1. ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ප්‍රකාශනය
2. සභාව හා අන්‍යාගම්කාරයන් පිළිබඳ ප්‍රකාශනය
3. ආගමික නිදහස පිළිබඳ ප්‍රකාශනය

## අටවන පාඩම

### 8. ධර්මෝපදේශය හා එහි අරමුණු

**හැඳින්වීම**
ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේගේ ජීවිතයෙන් හා වචනයෙන් ප්‍රකාශ කළ සහ ඉගැන්වූ ධර්මය මුළු ජනතාවටම දේශනා කිරීමට හා ඉගැන්වීමට තම ශ්‍රාවකයන්ට බලය දුන් සේක. ස්වාමීන් වහන්සේ උත්ථානයෙන් පසු තම ශ්‍රාවකයන්ට දුන් අවසාන ආඥාව එයයි. එනම් සකල ජාතීන් ගෝලයන් කිරීමයි. (මතෙව් 28/18-20) මෙම දූත කාර්ය ඉටු කිරීමේ ලා ඔවුන්ට ශුද්ධාත්ම වරම් දානය කළ සේක.

දෙවන වතිකාන කතිකාවේ ඉගැන්වීම අනුව දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේ පවසන්නේ ධර්මෝපදේශය සෑම කතෝලිකයකුගේ ම විශ්වාසය සජීවී කාර්යක්ෂම (ක්‍රියාකාරී) සහා සර්වඥණය (හැඟීම් ඇති) දෙයක් කළ යුතු බවයි. එමෙන්ම ධර්මොපදේශය යනු සැදැහැවතුන්ගේ විශ්වාසය වඩාත් තහවරු කිරීමේ ලා සුබාරංචිය දේශනා කිරීමයි. මෙය ක්‍රිස්තු කේන්ද්‍රියයි. ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් පතුරුවාලීමේ, අනුන්ට දීමේ චේතනාවයි. පූර්ණ ක්‍රිස්තියානි ජීවිතයක් වෙත අප ගෙන යාම සඳහා ධර්මෝපදේශය විධිමත් ලෙස ඉදිරිපත් කිරීම වැදගත්වේ. මේ අනුව බලන විට

1. ධර්මෝපදේශය දේව ප්‍රකාශයෙන් පැන නගියි.
2. ධර්මය යනු ක්‍රිස්තුන් වහන්සේය.
3. ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ දැනුම ධර්මෝපදේශයෙන් දිය යුත්තේ විධිමත්වය. ඇතැම් විට අවිධිමත්වය.
4. ධර්මෝපදේශය දීමේදී මානව අත්දැකීම් ශුද්ධාත්ම ආලෝකය යටතේ පරීක්ෂා කර බලා දේව පණිවුඩය පැහැදිලි කර දිය යුතු ය.
5. පූර්ණ ක්‍රිස්තියානි ජීවිතයේ පදනම වූ කලී ක්‍රිස්තු අභිරහසකි.
6. ආගම පාඩම ක්‍රමික විය යුතු ය.
7. එය පැහැදිලි අරමුණු සහිත විය යුතු ය.
8. ධර්මය ශුද්ධවූ බයිබලයට අනුව විය යුතු ය.
9. ධර්මෝපදේශය ඇඳහිල්ලේ ජීවිතය වෙත එල්ල වෙයි.

**ධර්මෝපදේශයේ අරමුණු**
ධර්මෝපදේශයේ ස්ථිර අරමුණ වන්නේ ක්‍රිස්තුන් වහන්සේ විසින් මෙලොව ආරම්භ කරන ලද සේවාව දිගටම පවත්වාගෙන යාම තුළින් මිහිපිට දේව රාජ්‍යය පතල කිරීම වේ. එමෙන්ම උන්වහන්සේ හා සමග ගැඹුරු සැබඳියාවක් ජනිත කිරීම ය. කෙටියෙන් හඳුන්වන්නේ නම් දරුවන් තුළ ක්‍රිස්තු පෞරුෂය පූර්ණත්වයට පැමිණවීම ය.

**මෙම අරමුණ කෙටියෙන් මෙසේ පැහැදිලි කළ හැක.**
1. පූර්ණ මානව ස්වියත්වයක් ගොඩනැගීම දෙවියන් වහන්සේ වෙත මිනිසාගේ සිත හැරවීම
2. දේව වචනය දීමෙන් සැබෑ මනස්ථාපයක් ජනිත කරවීම
3. පූර්ණව ක්‍රිස්තු අභිරහස වෙත ඔහුව ගෙනයාම.
4. පාස්කු අභිරහසට ප්‍රායෝගිකව සාක්ෂි දැරීමේ හැකියාව නැංවීම
5. මුළු දේව ජනතාවගේ විමුක්තිය සඳහා ක්‍රියා කළ හැකි පුද්ගලයන් බිහි කිරීම.
6. ලෞකික පටිපාටිය තුළට සුවිශේෂ අගයයන් ඇතුළත් කර එය ශුද්ධවත් කිරීම.

පූර්ණ පෞරුෂයකට මගපෙන්වන ධර්මෝපදේශය, යහපත් මනුෂ්‍යයෙකු ලෙසත්, අධ්‍යාත්මික ජීවිතය සංවර්ධනය කර යහපත් ආදර්ශමත් කිතුනුවකු ලෙසත් විශ්වාසයේ ප්‍රේමයේ ජීවිතයකට අප ගෙන යයි. නැඟී සිටිය හැකි කිතුනු ආකල්ප සිත්තුළ ජනිත කරවීම තුළින් දේව රාජ්‍ය මෙලොව පැතිරවීමට උද්යෝගිමත්ව ක්‍රියා කරවීම ධර්මෝපදේශයේ අරමුණයි.

**ධර්මෝපදේශ ශාස්ත්‍රය යනු කුමක් ද ?**
ආගම ඉගැන්වීමේ විද්‍යාවයි. එහි මූලික සාධක මොනවාදැයි මෙහිදි අප අධ්‍යයනය කළ යුතු ය. මේ සාධක වල විවිධ අංග හා මූල ධර්ම ගැන ද දහම් ගුරුවරයා දැන ගත යුතු ය. ධර්මෝපදේශ ශාස්ත්‍රයේ ප්‍රධාන සාධක වන්නේ -

උගන්වන්නේ කවුද ? - ගුරුවරයා
උගන්වන්නේ කාටද ? - ශිෂ්‍යයා
උගන්වන්නේ කුමක්ද ? - විෂය කරුණු (ධර්ම)
උගන්වන්නේ කොහොමද ? - ක්‍රමය

**ගුරුවරයා**
ගුරුවරයාව හඳුන්වා දෙනු ලබන්නේ ධර්මෝපදේශකයා යනුවෙනි. පළමු සාධකය ඔහුය. ධර්මෝපදේශය ඉගැන්වීමේදී ගුරු කේන්ද්‍රිය නොවේ ය. ශිෂ්‍ය කේන්ද්‍රිය ධර්මෝපදේශය නූතනයේ වැදගත් ය. එහෙත් ආගමික අධ්‍යාපනය තුළ ගුරුවරයා අඳත් වැදගත් පුද්ගලයෙකි.

**ඔහුගේ කාර්යය -**
ඔහුගේ කාර්යය දිවැසිවර කාර්යයකි. ජේසුස් වහන්සේගේ ජීවිතය හා ඉගැන්වීම් අන් අයට එළිදරව් කිරීමත් සිසු දරුවන් හා දෙවිඳුන් අතර අන්‍යෝන්‍ය සබඳතාවයක් ඇති කිරීමත් ඔහුගේ කාර්යයයි. දහම් ගුරුවරයා ක්‍රිස්තුන් වහන්සේගේ හස්තයේ උපකරණයක් වේ. ඔහු ප්‍රකාශ කළ යුත්තේ දේව වචනයයි. සුබාරංචියයි. තම කාර්යය තමාගේ ගෞරවය හා නම්බුව නිසා නොව දේව මහිමය හා ප්‍රශංසාව ලබා දීමට යොමු කළ යුතු ය.

**ඔහුගේ ආදර්ශය**

දහම් ගුරුවරයාගේ ජීවිතය හා සේවය හුදෙක් ක්‍රිස්තුන් වහන්සේ හා පියාණන් වහන්සේ සමඟ විය යුතුය. යාච්ඤා ජීවිතයත් ආත්ම ත්‍යාජයත් දහම් ගුරුවරයා තුළින් දිස් වෙන අධ්‍යාත්මික ගුණාංග මගින් තමා උගන්වන දෙයට සාක්ෂි දැරිය යුතු ය. එමෙන් ම විශ්වාසයේ ආලෝකයෙන් පණ ගැන්වෙන තමාගේ ක්‍රියාවන් තුළත් ලෞකික අරමුණු හිසින් ඉවත් කළ අයෙක් විය යුතුය. තම ජීවිතය තුළින් සුවිශේෂක වටිනාකම් පිළිබිඹු කරන සමාජය විසින් පිළිගන්නාවූ ආදර්ශමත් එකක් පිළිබිඹු කළ යුතු ය.

**ඔහුගේ කැපවීම**

ධර්මෝපදේශ සේවය සාර්ථක වනුයේ එහි යෙදන පුද්ගලයාගේ (උගන්වන) කැපවීම අනුව ය. එමනිසා ඔහු තම සිසුන් අතර මාංශගත විය යුතු ය. මෙම කාර්යය ඉටු කිරීමේදී විවිධ බාධකවලට අභියෝග වලට මුහුණ දීමට සිදු වේ. ඔහුගේ කැපවුණ ජීවිතය තුළ මේ සියළුම බාධා ඉවත් කර ගැනීමට හැකි වේ. ඕනෑම බාධාවක් ඉදිරියේ දේව රාජ්‍ය හෙවත් ක්‍රිස්තු ශරීරය ගොඩ නැඟීමට ඔහුට හැකියාව තිබිය යුතු ය. ජේසුස් වහන්සේ දේව අභිමතය ඉටු කරන්නට තමන්ට පැවරුණු කාර්යය සපුරන්නට කැපවූ ලෙස හා මෙන්ම මරියාවන් දේව කැඳවීම අවබෝධ කරගෙන පුත්‍රයාණන්ගේ දූත සේවාවට කැපවූ ලෙස තමකම නසා සියල්ලෙන් හිස්වී එසේම තම කැඳවීමට පූර්ණව කැපවිය යුතුය.

**ගුරු පෞරුෂය**

තමන්ගෙන් ඉගෙන ගන්නා සිසුන්ගේ මනස තුළ ගුරුවරයා පිළිබඳ ගොඩනැගෙන මනෝ රූපය නැතහොත් ආකල්පය ගුරු පෞරුෂය ලෙස හැඳින්විය හැක. බොහෝවිට ඔහුගේ සාමාන්‍ය පෙනුම කථා විලාශය ඉරියව් දක්ෂකම් ආදර්ශය, ඉගැන්වීමේ හැකියාව පන්ති පාලනය විනය දැනුම අඳුම් පැළඳුම් ක්‍රියාවන් හා හැසිරීම යන සියල්ල යටතේ ගුරු පෞරුෂය ගොඩනැගෙයි. වෙනත් අයුරකින් කිවහොත් ධර්මෝපදේශකයා තුළින් දිස්වන පෞරුෂත්වය වන්නේ නාසරෙත් හි ජේසුස් වහන්සේවය. උන්වහන්සේගේ ස්වියත්වයමය.

**හොඳ ගුරු පෞරුෂයක් ඇති ධර්මෝපදේශකයාගේ ගුණාංග**

- දහම් ගුරුවරයා දරුවන්ගේ ගුරුන් මෙන්ම දෙගුරුන් ලෙස ද ක්‍රියා කරන බවට ජීවිත සාක්ෂිය තුළින් පිළිබිඹු කිරීම.
- ධර්මෝපදේශය ඉගැන්වීම දේව කැඳවීමක් බැවින් තමා උගන්වන දේ ගැන හොඳ අවබෝධයක් තිබීම.
- ධර්මෝපදේශය ශුද්ධාත්මයාණන්ගේ කාර්යයකි. එබැවින් දහම් ගුරුවරයා තුළ දැඩි උද්යෝගයක් හා ක්‍රියාශීලි ඉගැන්වීමක් තිබීම.
- නිතියට, දඬුවමට, ණය යුක්තියකට වඩා හදවත තුළ උත්තේජනය වන ප්‍රේමයකින් දයාවකින් දරුවන් දෙවිඳුන් වෙතට යොමු කිරීම.
- සිසුන් තුළ තමා ගැන යහපත් ආකල්ප ඇති කිරීම.
- දියුණු වන ලෝකය මුහුණ දිය හැකිවන පරිදි නව තාක්ෂණික ක්‍රම උපයෝගි කර ගනිමින් දහම ඉගැන්වීමේ හැකියාව.

**ශිෂ්‍යයා**

ආගම ඉගැන්වීම තුළ ශිෂ්‍යා අද වැදගත් ම සාධකය වී ඇත. එයට හේතුව අද අධ්‍යාපනය මෙහෙය වන්නේ ශිෂ්‍ය කේන්ද්‍රීයව ය. දහම උගන්වන ගුරුවරයාට ආගම පමණක් නොව අධ්‍යාපන මනෝවිද්‍යාව හා අධ්‍යාපන මූලධර්ම පිළිබඳ අවබෝධයක් තිබිය යුතු ය. "ජෝන්ට අකුරු ඉගැන්වීමට පෙර ජෝන් ගැන දැනගත යුතු ය" යන කියමනෙන් ඒ බව අවබෝධ වේ. ඉගැන්වීම සාර්ථක ලෙස කිරීමට ශිෂ්‍ය ගැන හොඳ අවබෝධයක් තිබීම අවශ්‍යයයි. එය කළ හැක්කේ සිසුන් අතර මාංශගත වීමෙනි. සිසුන් තේරුම් ගැනීමෙන්, මිත්‍රුවීමෙන්, ඔවුන්ගේ සිතුම් පැතුම් සොයා ගැනීමට හැකි වේ. විශේෂයෙන් මෙහිදී අවශ්‍ය වන්නේ ගුරු ගෝල සම්බන්ධයයි. එය කළ හැක්කේ සංවාදය තුළිනි එවිට ඔහුගේ කායික මානසික අවශ්‍යතා, ජීවත්වන පරිසරය ඔහුගේ පෙර දැනුම, හැසිරීම් රටාව පහසුවෙන් තේරුම් ගැනීමට දහම් ගුරුවරයාට හැකි වේ.

**සිසුන් අවබෝධ කර ගැනීමට ගත යුතු පියවරවල් කීපයක් දැක්විය හැක.**

- සිසුවාගේ දෙමව්පියන් සමඟ සම්බන්ධතාව ගොඩනගා ගැනීම.
- ඇඳහිල්ල තුළ සිසුවා දරණ ආකල්ප පිළිබිඹු වන අවස්ථා ගැන කල්පනාකාරී වීම.
- සිසු ලොවට සම්පවීමේ දී සංවාදය ඉතා වැදගත් වේ.
- පවුල් පරිසරය තුළ දරුවාට ලැබිය යුතු මූලික මානසික අවශ්‍යතාව හා ආදරය කරුණාව අගය කිරීම හා නිදහස ලැබේදැයි සොයා බැලීම.
- කායික අවශ්‍යතාවයන් ලැබේදැයි විමසිලිමත්වීම හා දෙමව්පියන් දැනුවත් කිරීම.
- ඉරිදා දිව්‍ය පූජාවට හා ආගමික වත්පිළිවෙත් වලට සහභාගිවේ දැයි සොයා බැලීම.
- ශිෂ්‍යා නිදහසේ හැසිරෙන අවස්ථාවලදී ඔහු නිරීක්ෂණය කිරීම.
- විවිධ පරීක්ෂණ, ඇගයීම් හා ක්‍රියාකාරම් තුළින් ශිෂ්‍යයාගේ බුද්ධිය හා මනස තේරුම් ගැනීම.

**විෂයය**

ධර්මෝපදේශ ශාස්ත්‍රයේදී උගන්වන්නේ කුමක්ද යන්නට පිළිතුර නම් විෂය කරුණු යන්නයි. වයස් මට්ටම් අනුව විෂය කරුණු වෙනස් වේ. ඉගැන්වීමේ ක්‍රම ද වෙනස් වේ. මේ සඳහා එක් එක් ශ්‍රේණි සඳහා නියමිත පොත් ඉදිරිපත් කර ඇත. ඒවා වාර්ෂිකව, මාසිකව හා දෛනිකව පාඨමාලා ලෙස සකස් කර තිබේ. නමුත් තමාට නියමිත පාඩම් ඉගැන්වීමේ දී ගුරුවරයා පෙළ පොතට ම සීමා නොවිය යුතු ය. ඒ හා බැඳි විවිධ පොතපතෙන් කරුණු සොයා ගැනීම ඔහුගේ වගකීමයි.

ධර්මෝපදේශය ඉගැන්වීම පිළිබඳව දෙවන ජුවාම් පාවුළු පාප්තුමා දෙන උපදෙස් කීපයක් ගැන මෙහිදී අවධානය යොමු කිරීම වැදගත් ය. (කතකේසිත්‍රාදෙන් - **21**)

1. ධර්මෝපදේශය ක්‍රමික විය යුතුය. පැහැදිලි අරමුණු සහිත විය යුතු ය.

2. ධර්ම සාරය මිස අනවශ්‍ය ප්‍රශ්න එහි අඩංගු වීම යෝග්‍ය නොවේ.
3. ධර්මෝපදේශය එල්ල වන්නේ දේව ධර්ම ශාස්ත්‍රීය නිරීක්ෂණය වෙත නොව ඇදහිල්ලේ ජීවිතය වෙතය.
4. සෑම ආගම් පාඩමකට ම පූර්ණ භාවයක් තිබිය යුතු ය.

ක්‍රිස්තු ධර්මය තුළ ඇති විෂය කරුණු දේව ප්‍රකාශන අඩංගු ශුද්ධ බයිබලයේ ඇත. එහි ඇති පණිවුඩයත්, එයට දැක්විය යුතු ප්‍රතිචාරයත් ඒ අනුව ජීවත් වීමත් ධර්මය ඉගැන්වීම තුළින් අපේක්ෂා කෙරේ. ජේසුතුමන් මෙලොව ගෙනා ගැලවීමේ සුබාරංචිය දහම් පාඩමක් තුළ වැදගත් ය. ගුරුවරයාගේ යුතුකම වන්නේ නියමිත විෂය කරුණු තෝරා බේරාගෙන නිරවුල්ව ඉදිරිපත් කිරීමයි. එහි පණිවුඩය තේරුම් කර දීමයි. ඒ අනුව දරුවන් හැඩගැස්වීමයි. ජීවත් කරවීමයි. මෙහි විවිධ ආගමික පොත්පත් සහරා උපකාර කර ගත හැක. එනම් ඒ ඒ ශ්‍රේණිවලට ගැළපෙන පරිදි

- පෙළපොත
- ශු. බයිබලය
- ශුද්ධවර චරිත
- ආගමික පුවත් හා සඟරා
- වතිකානු ලේඛන
- විශ්ව ධර්මෝපදේශය
- ඉරුදින දේශනා

එමෙන් ම වරින් වර විවිධ ආගමික සම්මේලන වලට සහභාගි වීමෙන්ද, ආගමික පාඨමාලා හැදෑරීමෙන්ද, දහම් විභාගවලට පෙනී සිටීමෙන් ද ධර්මෝපදේශකයා තමාගේ දැනුම දියුණු කර ගත යුතු ය.

## නවවන පාඩම

### 9. ක්‍රිස්තියානි නායකත්වය හා සාරධර්ම

නායකත්වය ක්‍රියාශීලි ක්‍රම වේදයකි. නායකයෙක් නායකත්වය ලබා ගන්නා මාර්ග තුනකි.
- උපතින් ලබන නායකත්වය
- ස්ව උත්සාහයෙන් ලබන නායකත්වය
- බලහත්කාරයෙන් නායකත්වයට තල්ලු වන අය

නායකත්වය තමාට පමණක් සීමා වූවාක් නොවේ. එය තනිවම, ක්‍රියාවට නැංවිය නොහැක. ඒ සඳහා නායකයාට සම්බන්ධ කණ්ඩායමක් සිටිය යුතු ය.

උදා:-
- ක්‍රීඩා කණ්ඩායමක නායකයෙක්
- ශිෂ්‍ය නායකයෙක්
- දේශපාලන පක්ෂයක නායකයෙක්
- සංචාරක කණ්ඩායම් නායකයෙක්
- ආගමික ආයතනයක නායකයෙක්
- ආගමික නිකායක නායකයෙක්
- පාසලක විදුහල්පති
- ආයතන (රැකියා ආදි) නායකයෙක්

සියළුම ආගමික, දේශපාලනික, සාමාජීය, කණ්ඩායමකටම නායකයෙක් ඇත. එසේනම් නායකත්වය යනු කුමක් ද? ආදර්ශමත් ජීවිත රටාව තුළින් අන් අය හා සමඟ ගැඹුරු සම්බන්ධතාවයක් ගොඩනගා ගතහැකි තම පෞරුෂය තුළින් අන් අයව තමන් වෙත ඇද ගැනීමේ බලයයි.

**නායකත්වය ගැන කථා කිරීමේදී අප මතක තබා ගත යුතු කරුණු**
- නායකයාගේ ගති පැවතුම් ගුණාංග හැකියාවන් අවශ්‍යතාවයන්.
- කණ්ඩායමේ අනිත් අයගේ අවශ්‍යතා හා බලාපොරොත්තු
- නායකයා හා කණ්ඩායම් අතර ඇති සම්බන්ධතා (සන්නිවේදන)
- ප්‍රශ්න වලට පිළියම් යෙදීමේ දක්ෂතාවය.

**කිතුනු නායකත්වය යනු කුමක්ද ?**

ශුද්ධවූ සභාව තුළ පවත්නා නායකත්වය විවිධාකාර ය. එය සභා සංවිධානය අනුව බෙදී පවතී. කිතුනු නායකත්වය රඳා පවතින්නේ අපෝස්තළිකත්වය මතය. ශුද්ධෝත්තම පාප් වහන්සේගේන් පටන් ගෙන ගිහියා දක්වා පැතිර පවතී. සෑම කිතුනු නායකත්වයකම අරමුණ ලෝකයේ ශුද්ධවත් කර දේව රාජ්‍ය ගොඩනැවීමය. දෙවි පියාණෝ යුගයෙන් යුගයට ලොකාරම්භයේ සිට විවිධ නායකයින් තෝරා ගත් බව ශුද්ධවූ බයිබලය හා ශුද්ධවූ සභා ඉතිහාසය සාක්ෂි දරයි. දැනීම, හැකියාව, බුද්ධිය, පරම්පරාව, උගත්කම කිතුනු නායකත්වයට අවශ්‍ය නැති බව එම තෝරා ගැනීම තුළින් පැහැදිලිවේ.

ගැලවීමේ ඉතිහාසය තුළ දෙවියන් වහන්සේ විවිධ අවස්ථාවලදී නායකයන් තෝරා පත් කළ සේක.

- **ආබ්‍රහම්ගේ කැඳවීම**
  මම නුඹ මගින් විශාල ජාතියක් ඇති කරන්නෙමි. නුඹට ආශිර්වාද කරන්නෙමි. නුඹේ නාමය ආසිරි පැතීමේ නාමයක වන සේ කීර්තියට පමුණුවන්නෙමි. (උත්. **12/1**)
- **ඊසාක් ලැබූ කැඳවීම**
  නුඹ පිය ආබ්‍රහම්ගේ දෙවිදාණෝ මමය. බිය නොවන්න. නුඹ සමඟ ද මම සිටිමි. මම නුඹ ආසිරි ගන්වන්නෙමි. (උත්. **35/11**)
- **ජාකොබ් තුමා ලැබූ කැඳවීම**
  මම සියළු බලැති දෙවියන් වහන්සේ වෙමි. නුඹ සමෘද්ධිව් වර්ධනය වන්න. නුඹෙන් ජාතියක් හා ජාතීන් සමුදායක් බිහි වන්නෝ ය. (උත්. **35/11**).
- **ජෝශප් ලැබූ කැඳවීම**
  දෙවි පියාණන් ජෝශප්ව නායකත්වයට කැඳවූයේ ස්වප්නයක් මගින් ය. ඔහු තම සහෝදරයන්ට පවසන්නේ තමා දුටු සිහිනයයි. බලන්න ඉර හඳ තාරකා එකොළොහක් මට නැමී ආචාර කළේ ය. යයි කීහ (උත්. 39/9). මේ ගැලවීමේ ඉත%හාසය පුරා පෙළපතින් පෙළපතට දෙවි පියාණන් විසින් ආදි පිතුරුවරුන් නායකත්වයට කැඳවූ ආකාරයයි.

### කිතුනු නායකත්වයේ ගුණාංග

| නායකත්වය ලැබූ අය කළ ක්‍රියාවන් | ක්‍රියාව තුළ නායකත්වයේ ලක්ෂණ |
|---|---|
| තමන් ලැබූ දේව කැඳවීම පිළිගැනීම | දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබීම.<br>දේව කැමැත්තට නිහතමානීම අවනත වීම. |
| එඬේරුන් ලෙස තම ජීවනෝපාය දරුවන්ට ඉගැන් වීම | තම සංස්කෘතික දායාද අනාගත පරම්පරාවට උරුම කරදීම. ආර්ථික ප්‍රශ්ණ විසදීම. |
| සතුරු උවදුරු හා ස්වාභාවික විපත් වලින් බේරා ගැනීම | ආරක්ෂාව සැලසීම.<br>විපතේදී සහය වීම. |
| ජනතාව අතර ඇතිවෙන ආරවුල් විසදීම. | යුක්තිය සාධාරණත්වය සැමටම එක ලෙස ඉටු කිරීම. සමාව දී සුහදව පිළිගැනීම. |
| එකම දෙවියන් වහන්සේ ගැන ඉගැන්වීම. | ඒක දේව වන්දනාවට මුල පිරීම.<br>ඒක දේවවාදී පිළිවෙත්වලට ජනතාව හුරු කරවීම. |

ජේසුස් වහන්සේ, බුදුන් වහන්සේ, මහත්මා ගාන්ධිතුමා වැනි ශ්‍රේෂ්ඨ පුද්ගලයෝ කිසිම බලයක් පාවිච්චි නොකර කිසිම බලපෑමක් නොමැතිව තම නායකත්වය මෙහෙයවූවා පමණක් නොව තම ගෝලයන් සමඟ ගැඹුරු සම්බන්ධතාවයක් ගොඩනගා ගනිමින් ඒ අයව ද නායකත්වයට හුරු කළ හ.

**එබැවින් හොඳ නායකත්වයට**
පෞරුෂය - තමාගේ අරමුණු හෙවත් ඉලක්කය කරා යාම.
ජනප්‍රියත්වය - සියල්ලේදී සියල්ලන්ට පිළිගත හැකි බව.
ස්වීයත්වය හෙවත් නිර්මාණ ශක්තිය අවශ්‍යයයි

- ක්‍රිස්තුන් වහන්සේ තමා විසින් පිහිටුවනු ලැබූ ශුද්ධවූ සභා නායකත්වයට තෝරා ගත්තේ පේදුරු තුමාවය. ඔහු මසුන් මරන්නෙකි. නුගතෙකි. නමුත් එම නායකත්වය අද දක්වා සභාව තුළ ඉදිරියට ම ගමන් කරයි.

    ***"පේදුරු නුඹ පර්වතයක් ය, මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි. නිරා දොරටු ඒට විරුද්ධව ජය ගන්නේ නැත."*** **(මතෙව් 16/18)**
    ***"මාගේ බැටළුවන් පොෂ්‍ය කරන්න. මාගේ බැටළුවන්ගේ එඬේරාවන්න."*** **(ජොහන් 21/15-17)**

- ක්‍රිස්තුන් වහන්සේ පාවුළුතුමාට නායකත්වය පැවරුවේ වෙනත් ආකාරයකටයි. පාවුළු සාවුල් මෙන් පෙනී සිටිමින් ක්‍රිස්තියානින්ව මරා දමූ අයෙකි. එවැනි පීඩාකාරී ගමනක යෙදෙන විට ක්‍රිස්තුන් වහන්සේ ඔහුට කථා කොට නායකත්වයට තෝරාගත් සේක.

    ***"සාවුල් සාවුල් ඔබ මට පීඩා කරන්නේ මන්ද?"*** **(ක්‍රියා 9/3-9)**

- ක්‍රිස්තුන් වහන්සේ නායකත්වයේ ගුණාංග සමාජය තුළ ජනිත කරවන්නට අප සැමවත් කැඳවා ඇත. බෞතිස්ම ස්නාපනය මගින් සභාවේ සමාජිකයන් වන අපට අද ලැබී තිබෙන කැඳවීම අප හඳුනාගැනීම ඉතාම වැදගත්ය.

    - අන් අය සුහදව පිළිගෙන සාමූහිකව කටයුතු කිරීම.
    - පරිත්‍යාගිශීලී වීම.
    - නීති ගරුක වීම.
    - අන් අය සමඟ දුක සතුට බෙදා ගැනීම.
    - දෙවි පියාණන්ට විශ්වාසවන්තව ජීවත් වීම.

### ශුද්ධ බයිබලයට අනුව ආදර්ශමත් නායකයෝ

- මෝසස් - (නික්මයාම **3/2** සිට කියවන්න)
- ගිඩියොන් - (විරාවලිය **6/1** සිට කියවන්න)
- ජෙරමියා - (ජෙරමියා **1/4** සිට කියවන්න)
- සාමුවෙල් - (**1** සාමුවෙල් **3/19** සිට ඉදිරියට)
- පාවුළුතුමා - (**1** තිමෝති **3** පරිච්ඡේදය)
- ජේසුස් වහන්සේ

මේවා කියවා නායකත්වය පෙන්වා ඇති නියම අවස්ථා සොයා ගන්න.

**දහම් ගුරුවරයා හා සාරධර්ම**
දහම් ගුරුවරයා, ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය කරන්නෙකි.දෙවි පියාණන් වහන්සේ ගේ කැමැත්ත පරිදි දේව රාජ්‍යය ගොඩනැගීම ඇරඹූ ක්‍රිස්තුන් වහන්සේගේ කාර්යය පූර්ණත්වයට පත් කිරීමේ වගකීම දහම් ගුරුවරයා වෙත පවරා ඇත. එහෙයින් දහම් ගුරු වගකීම උතුම් වූ කැඳවීමකි.එහෙයින් දහම් ගුරුවරයා / ගුරුවරිය ක්‍රිස්තුන් වහන්සේගේ ස්වරූපය අන් අය තුළ නිර්මාණය කරන්නටද තමන් අන් අයට ක්‍රිස්තුවරයෙක් වන්නට ද , තමන් ක්‍රිස්තුන් වහන්සේව අත්දකිමින් අන් අයව එම අත්දැකීමට ඇතුළුකරවන්නට ද වගකීමක් ලබයි.

එසේ නම් නාසරතයෙන් තම සේවය ඇරඹූ ක්‍රිස්තුන් වහන්සේගේ චරිතය , කැපවුණු සේවාව, කුරුසියේ මරණය හා උත්ථානය දක්වාම ක්‍රිස්තුන් වහන්සේ තුළ තිබූ ගුණාංගය, දහම් ගුරුවරයා තුළද තිබිය යුතු ය. එසේ නම් දහම් ගුරුවරයා, ක්‍රිස්තුන් වහන්සේගේ දේව රාජ්‍යය ගොඩනැගීම සඳහා පිරිපුන්වූ දිවියක් ගත කිරීම අත්‍යවශ්‍ය ය. එසේ වීමට ඔහු හෝ ඇය තුළ දේව අනුග්‍රහය තිබිය යුතු ය. ඒ සඳහා අභිවෘද්ධි ආලේපය නමැති සක්‍රමේන්තුව තුළ ශුද්ධාත්මයාණන් මගින් ශක්තිමත් කරන

ලබන හෙයින් දරුවන් වෙත, දේව ප්‍රේමය බෙදා දෙනු වස් සැමට ම එක ලෙස සැලකිය හැකිවූ දයාව ආදරය, කැපවීම, හා පරිත්‍යාගශීලි බව, නායකත්වය ගැනීම සඳහා අධ්‍යාපනික නිපුණත්වය හා ප්‍රමාණවත් දැනුමක් අත්‍යවශ්‍ය ය. එසේ ම දෙවිපියාණන්ගේ දේව රාජ්‍යය ගොඩ නැගීම සඳහා දහම් ගුරුවරයා විශාල වගකීමක් දැරිය යුත්තේ දරුවකු කුඩා අවදියේ සිට පරිණත පුද්ගලයකු බවට පත් වීම සඳහා අධ්‍යාත්මික හැඩගැස්මක් ආරම්භයක් දිය යුතු වන්නේ ගුරුවරයා විසින් නිසාය. එබැවින් දහම් පාසල් ගුරුවර ගුරුවරියන්ගේ වගකීම දරුවන් තේරුම් ගැනීමයි.

උදාහරණ වශයෙන් ගතහොත් :

* 1 වන ශ්‍රේණියේ ඉගෙන ගන්නා දරුවා තුළ ඒ වයස් සීමාවේ (1-5 දක්වා) දක්නට ලැබෙන්නේ නියෝජ්‍ය ඇදහිල්ලකි. එනම් දෙමාපියන් නිසා ආගම ඇදහීමයි.
* වයස 6 - 12 ළමාවිය දක්වා - රංචු ඇදහිල්ලකි.
* වයස 13 - 19 දක්වා ගැටවර විය - පෞද්ගලික ඇදහිල්ලකි.

එබැවින් මෙම තත්ත්වයන් හරියාකාරව තේරුම් ගනිමින් ඒ අයගේ විස්වාසය ගැඹුරු කරන්නට හා වර්ධනය කරන්නට වගකීම ඇති බව සිතට ගත යුතු ය.

<u>වගකීම දරන්නට දරුවන් යොමු කිරීම අත්‍යවශ්‍යය</u>

* දරුවන්ට හැකිදේ කරන්නට, ආත්මාර්ථය ඉවත් කරන්නට,
* අධ්‍යාපනය අර්ථවත් ලෙස කරන්නට,
* සේවයක් සඳහා පුහුණුවක් දෙන්නට,
* අද පැවරෙන වගකීම හා යුතුකම් හොඳින් ඉටුකරන්නට,
* ශුද්ධාත්මයාණන්ට නතු වෙමින් කැඳවීම, සේවය තේරුම් ගන්නට,
* විමුක්තිය ලබාදුන් ක්‍රිස්තුන් වහන්සේව හඳුනා ගෙන අන් අයටත් විමුක්තිය ලබාදීම සඳහා ක්‍රියාකාරී වන්නට,
* තමා ජීවත්වන පරිසරය තුළ මාංශගත වන්නට.

**දහම් ගුරුවරයා ආදර්ශමත් පුද්ගලයකු වීම.**

දහම් ගුරුවරයාගේ මුළු ජීවිතයම දේව සබැඳියාව ඉතා ගැඹුරින් ඇති පුද්ගලයකු විය යුතුය. තමා ජීවත්වන පවුල් ජීවිතය ආදර්ශමත් විය යුතුය. යාච්ඤාශීලි, භාවනාශීලි පුද්ගලයකු වියයුතුය. දිය දහරක් ඇද හැලෙද්දී මුළු පරිසරයම සිසිල් කරන්නා සේ ඔහු තුළින් ඇය තුළින් පිට වන වචන , ක්‍රියා හා ආදර්ශය තුළ දරුවන්ට සැනසුමක් විය යුතු ය.

කුඩා දරුවන් මා වෙත එන්න ඉඩ දෙන්නැයි පැවසූ කිතුසමිඳුන් ගේ වදන් අනුව දරුවන්ට බියෙන් සැකෙන් තොරව දහම් ගුරුවර ගුරුවරියන් වෙත යන්නට , මෘදු වුත් ,නිහතමානී වුත් ගතියක් තිබිය යුතු ය. එවැන්නන් දෙවියන් වහන්සේගේ සත්‍යයෙහි හසුරවනු ලබයි, යටහත් පහත් අයට තම මාර්ගය උගන්වන සේක, යනුවෙන් (ගීතාවලියෙහි 25/9) සඳහන් කරන්නේ උන්වහන්සේ ගේ මග පෙන්වීම ඔවුන්ට නිරන්තරවම ලැබෙන නිසා ය.

ලෞකික වටිනාකම් තුළ මංමුලාවී පිරිහෙමින් පවතින අප සමාජය ආධ්‍යාත්මයට නව ජීවයක් දීම අවශ්‍ය වෙයි. දෙමවුපියන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් ඉටු නොවන අවස්ථාවල දහම් පාසලේ දී ගුරුවරයා/ගුරුවරිය ආදේශක මවක / පියෙකු සේ ක්‍රියා කිරීම ද අවශ්‍ය වෙයි.ඒ මන්ද යත් ,උගන්වන දහම ශිෂ්‍ය කේන්ද්‍රිය ය. එබැවින් ක්‍රිස්තුන් වහන්සේගේ තැන ගත යුත්තේ දහම් ගුරු මව හෝ පියා විසින් ය.

ලෞකිකත්වයෙන් තොරවූ සිතකින් යුතුව දේව රාජ්‍යය ගොඩනැගීමේ මහඟු ආකල්පය ඇතිව දරුවන් හැඩ ගැස්වී උදාර සේවාවට කැප විය යුතු ය. තම ජීවිතය සුබාරංචිය ප්‍රකාශ වන කැඩපතක් විය යුතු ය. බැහැපත් ගතියෙන් යුතුව සැම ජීවිත අභියෝගයක්ම භාර ගත යුතු ය. කරදර බාධක තුළ අධෛර්යයට පත් නොවී මිනිසුන්ගේ ප්‍රසාදය ලැබීමට වඩා දෙවියන් මහිමයට පත් කිරීම පිණිස තම සේවාවන් කැප කළ යුතු ය.

එසේම ක්‍රිස්තුන් වහන්සේ වදාළ ලෙස ***"යමෙක් මා අනුව එන්ට කැමැත්තේ ද , ඔහු තමකම නසමින් කුරුසිය දරමින් මා අනුව ඒවා"***. එබැවින් දහම් ගුරුවරයා/ගුරුවරිය තුළ ක්‍රිස්තුන් වහන්සේ දේශනා කළ වදන් , කළ ක්‍රියාවන් හා උන්වහන්සේගේ වැඩ සිටීම , කෙතෙහි වපුරන බීජයකට සමාන වෙයි (මාක් 4 / 14). එතුමන් වදන් පිළිගෙන එහි වැඩිඵල නෙලිය හැකි වන්නේ ද , ඒ තුළ දේව රාජ්‍යය ප්‍රකාශ වන්නේ ද , සේවය කිරීමටත් බොහෝ දෙනාගේ මිදීම පිණිස සිය දිවි පිදීමට පවා කැප වූ වැඩම කළ ක්‍රිස්තුන් වහන්සේ තුළ පමණකි.

අවසන් වශයෙන් දහම් ගුරුවරයාගේ / ගුරුවරියගේ අවධානය යොමුවිය යුත්තේ අලුත් අහසක් අලුත් පොළොවක් නිර්මාණය කරන්නට ශුද්ධාත්මයාණන් ගේ මග පෙන්වීම ලබන හා ඒ සඳහා හැකියාවන් ඇති පුද්ගලයන් බිහිකිරීම ය.

**සාරධර්ම**

කිසියම් සමාජයක සාරධර්ම ගොඩනැගී ඇත්තේ ඒ ඒ සමාජ සංස්කෘතිය , ශිෂ්ඨාචාරය සහ ඉතිහාසයේ බලපෑම් මත බව අප පිළිගත යුතු ය. මිනිසා සමාජමය පුද්ගලයෙකු නිසා සැම ක්‍රියාවලියක් ම සැමට ම පොදු ලෙස විය යුතු ය. ඒ ඒ සමාජයන් විසින් පිළිගත යුතු ය. අගය කළ යුතු ය. එසේ ගොඩ නැගුණු සාරධර්මයන් තුළ තම හැඟීම් හා චින්තනයන් පළ කිරීම ද භාවිතා කිරීම ද සිදු වෙයි .විවිධවූ සමාජයන්හි ඇති ආචාර සමාචාර විධි , සිරිත් විරිත් (කළ යුතු හා නොකළ යුතු ක්‍රියාවන් )සදාචාර සම්මතයන් , මානව අයිතිවාසිකම් හා යුතුකම් ආරක්ෂා කරවන නීති රීති ක්‍රම තුළ තම සමාජ ජීවිතය ශක්තිමත් වෙයි. ඉහත කීදේ නිර්මාණාත්මක ක්‍රියාවලියක එකතුවක් ලෙස ද සැලකිය හැකි ය.

සමාජයන් තුළ පවතින සාරධර්මයන් නිසා මිනිසා තුළ ඇති විය හැකි තිරිසන් ආවේග වලින් මිදෙන්නට , ධර්මානුකූලව දිවි ගෙවන්නට , සත්‍යය සොයන්නට විනීත වන්නට , යහපත් හැඟීම් ඇති කර ගනිමින් ශිෂ්ට වුත්, කලාත්මක වුත් පිවිතුරු සිතුවිලි ඇති කර ගනිමින් ජීවත් වන්නට හැකිවේ. එවන් උරුමයන් ජාතියක් ලෙස සමාජයක් ලෙස ලබන්නේ නම් දෙවි පියාණන්ගේ මැවිලි අතර මුදුන් මල වූ (උතුම්ම මැවිල්ලවූ) මිනිසා උන්වහන්සේගේ මහිමයයි. මිනිසා දෙවි පියාණන් වහන්සේගේ ම ජනතාවය. උන්වහන්සේ අපේ දෙවි පියාණෝ ය. ජාතියක සමාජයක අනන්‍යතාවයයි.

**එබැවින් සාරධර්ම යනු :** යම්කිසි පුද්ගලයකු, ජීවිතය, සමාජය සාරවත් කළ හැකි යහපත් වූ ගුණාංගයන්ගෙන් හෙබි සත් ගුණ හෙවත් ගුණධර්මයන් ය. සියලුම යහපතේ උල්පත දෙවි පියාණන් වහන්සේ ය. එතුමන්ගේ සමානකමට මවන ලද මිනිසා තුළ එතුමන්ගේ සියලුම යහපත්කම් රෝපණයවී ඇත. නමුත් නපුරාගේ බලවේග තුළ ඒ යහපත්කම් සෝදාපාලුවකට ලක් වූව ද ක්‍රිස්තුන් වහන්සේ සිය විමුක්තිදායක දිවි පිදීම ද උත්ථානය ද මගින් යහපත නැවත අප තුළ ඇති කළ සේක.

බයිබලීය අධ්‍යනයක යෙදෙමින් මිනිසකු සතු විය යුතු සාරධර්ම මොනවාදැයි හොඳින් පැහැදිලි කර ගනිමු. සාරධර්මයන් තුළ ජීවත් වන්නා තුළ දේව සබඳතාවය ඉතා ගැඹුරු බව පහත සඳහන් පාඨයන් ගෙන් පැහැදිලි වෙයි. නෝවා "සත් ගුණවත් මිනිසෙකි. ඔහුගේ පරම්පරාවේ නිදොස් මිනිසා ඔහු විය. ඔහු දෙවියන් වහන්සේ සමග සුහදතාවයෙන් හැසිරුණේ ය"(උත්පත්ති 6 /9). යහපත ඒ සමාජයේ ඇති කරනු වස් "නුඹ දිවි ඇති තාක් මට කීකරු වී නිදොස්ව සිටින්න" (උත් : 17 / 1 බී)

- දෙවි ස්වාමීන් වහන්සේට සම්පූර්ණයෙන් විශ්වාසවන්තව සිටිය යුතු ය.(ද්විතීය නීති සංග්‍රහය 18 / 13 )
- එසේම දැහැමියන්ගේ ජීවිතය හා සමාජ ජීවිතය සාර්ථක බව
- නායකත්වයට සුදුසු බව "දැහැමිවන්ගේ බස් බහු ජන හිත සුව පිණිස වේ."
- දැහැමි කමින් යුතු නිදොස් මිනිසාගේ ජීවිත ගමන පහසු වේ. (හිතෝ 11 / 5 )
- දැහැමියා සිය තැනින් කිසිදා නොසෙල්වෙයි.
- යහපත වපුරන්නාට අස්වැන්නක් නියත ය. (හිතෝපදේශය 11/18)
- ව්‍යාපාරික කටයුතු වල දී දැහැමියාගේ කටයුතු සාධාරණ හා අවංක විය යුතු බව හරි කිරුම් පඩි ද, හරි මනින මිම් ද ඔබ ළඟ තබා ගත යුතු ය. (ද්විතීය නීති සංග්‍රහය 18/13)

දැහැමියා යනු දහම අදහන්නා ය. අදහන දහම ක්‍රියාවට නගන්නා ය. හිතෝපදේශය පුරාම දැහැමියා ගැන ගුණ වැනුමක් දක්නට ලැබෙයි . එවැන්නකු අවංක , ගුණ සම්පන්න , වාමි ගුණ ඇති , විනීත කාරුණික , ත්‍යාගශීලී, සත්‍ය වාදී ගති පැවැතුම් ඇති , අයෙකු වශයෙන් අපට දැකිය හැකි ය. එසේ ම ධර්මිෂ්ඨයා ජීවන වෘක්ෂයක් මෙන් ඵල දරණ බව ද , සත්පුරුෂයා සමිඳුන්ගේ ප්‍රසාදය ලබන බව ද , (හිතෝ 12/2) දක්වයි. එබැවින් ප්‍රසාද ස්නාපනය තුළ කිතුනු කැඳවීමක් ලබා ඇති අප ද අපේ ස්වර්ගීය පියාණන් වහන්සේ සර්ව සම්පූර්ණව සිටින්නාක් මෙන් සර්ව සම්පූර්ණයෙන් සිටිය යුතු ය (මතෙව් 5/48). එවිට අප වෙත "එතුමාණන්ගේ මාර්ග සාධාරණය" (ද්විතීය නීති සංගහය 32/4)

පැරණි ගිවිසුම තුළ එම ජනතාවට මාර්ගෝපදේශය වූවේ දස පනතයි . ක්‍රිස්තුන් වහන්සේ එම පනත් වලට නව පණක් දෙමින් ජීවිත යහපත් කරන්නට භාග්‍ය අට දේශනා කළ සේක. එසේ කළේ අප සැම සැබෑ දේවපුත්‍රයන් කරනු සඳහා ය. ඒ තුළ ක්‍රිස්තුන් වහන්සේ අප සැමට ක්‍රියාකාරී , දැහැමි ජීවිත රටාවකට පිවිසෙන්නට , ගුණයහපත්කම් වලින් යුත් පිරිපුන් මිනිසුන් වන්නට ආරාධනා කරන සේක. එම ආරාධනයේ සමාප්තිය දේව රාජ්‍යයේ උරුමය ය. එබැවින් කිතුනු සාරධර්ම අනුව ජීවිතය පිරිපුන් කර ගන්නටත් අන් අය ඒ සඳහා යොමු කරමින් සැමටම දේව පුත්‍ර භාවය ලබා දෙන්නටත් උත්සාහ කිරීම කිතුනු අප සැමගේ යුතුකමකි.

# දහවන පාඩම

## 10. ශුද්ධවූ සභා ඉතිහාසය

**පළමු සියවස් හතර**

ක්‍රිස්තුන් වහන්සේ මෙලොවට වැඩියේ දේව රාජ්‍යය ස්ථාපනය කරනු සඳහා ය. උන්වහන්සේගේ ධර්මය, දේව රාජ්‍යයේ ධර්මය වේ. දේව රාජ්‍යයේ පැමිණීම ප්‍රකාශ කිරීම සඳහා උන්වහන්සේ ස්වකීය සභාව ස්ථාපනය කළ සේක. එම සභාවේ ආරම්භය අවස්ථා 3 කට පෙන්වා දිය හැක.

- තම ප්‍රසිද්ධ ජීවිතයේ දී ශ්‍රාවකයන් දොළොස් දෙනෙක් තෝරා ගෙන ඔවුන්ට උගන්වා, පුහුණු කර සභාවේ අත්තිවාරම දැමීම.
- තම ජීවිත පූජාව මගින් සභාවට ජීවය ලබාදීම. (දුක් විඳීම, මරණය, උත්ථානය)
- ශුද්ධාත්මයාණන් මගින් සභාව ලෝකයට ප්‍රකාශ කිරීම.

පළමු සියවස් හතර ලෙස ඉතිහාසඥයන් පෙන්වා දෙන්නේ ක්‍රි.ව. 33 සිට 450 දක්වා කාලයි. ඒ හැර ශුද්ධාත්මාගමනයේ සිට ක්‍රි.ව. 450 දක්වා පළමු සියවස් හතර බවට ද මතයක් ඇත.

ක්‍රිස්තු සභාව කිසිම ජාතියකට, භාෂාවකට, සංස්කෘතියකට, යුගයකට සීමා නොවන බව අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත හැදෑරීමේදී පෙනී යයි. සෑම පරිසරයක් තුළම එයට අනුකූලව හැඩ ගැසෙමින්, වෙනස් වෙමින් පැවතෙන ආකාරය සහා ඉතිහාසය හැදෑරීමේදී දැකිය හැක. එම වෙනස්වීම් අනුව, කිතුනු සභා ඉතිහාසය හැදෑරීමේ පහසුව සඳහා එය යුග තුනකට වෙන් කර තිබේ.

ක්‍රි.ව. 33 - 450 දක්වා මුල් යුගය
ක්‍රි.ව. 450 - 1500 දක්වා මැදි යුගය
ක්‍රි.ව. 1500 - ඉදිරියට නූතන යුගය වශයෙනි.

එබැවින් මුල් සියවස් හතර ඇතුළත් වන්නේ සභා ඉතිහාසයේ මුල් යුගයටයි. එනම් පස්වන සියවස දක්වාය. මේ සියවස තුළ සභාව ඒ ඒ පරිසරයන් හා සංස්කෘතීන් තුළ හැඩ ගැසුණු ආකාරයත්, වසර 300 ක් පුරා සභාවට එල්ලවූ පීඩන හා ඉන්පසු ක්‍රි.ව. 313 දී මිලාන් ආඥාවෙන් පසු නිදහස ලත් සභාව ගැනත් ඉගෙන ගත යුතු ය.

යුදා පෙන්තකෝස්ත දිනදී අපෝස්තුළුවරුන් මත බැස වදාළ ශුද්ධාත්මයාණෝ නව පෙන්ත කොස්තයක් මගින් සභාවේ උපත ලබා දුන් ආකාරය අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේ සඳහන් වේ. එතැන් සිට සභාව වැඩි දියුණුවූ ආකාරය හෙළි කරන ලිඛිත සාක්ෂි කිපයකි. ඒවායින් ප්‍රධාන වන්නේ,

1. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත
2. හසුන් පත්
3. රදගුරු කලෙමන්ට් තුමාගේ හා අන්තියෝකයේ ඉග්නාසියුස් තුමාගේ සමහර ලිපි
4. අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීම් ඇතුළත් ඩිඩාකේ ග්‍රන්ථය

- පළමු සියවස ඉක්මවීමත් සමඟම, මුළු රෝම අධිරාජ්‍යය පුරාම සභාව ව්‍යාප්තවන්නට විය. අත්ලාන්තික් සාගරයේ සිට මැද පෙරදිග ගල්ප් ප්‍රදේශය දක්වාත්, ප්‍රංශයේ බැතියුබ් සීමාවේ සිට උතුරු අප්‍රිකාව දක්වාත් විශ්මය ජනක ලෙස සභාව පැතිරිණි. මෙයට හේතු වූයේ අපෝස්තුළුවරු, සංචාරක ධර්ම දූතයන් ලෙස තැනින් තැන ගොස් කිතුනු ජනපද පිහිටුවීමයි. අපෝස්තුළුවරු දොළොස් දෙනා අතර නායකත්වය ගත්තේ පේදුරුතුමා ය. ඒ බවට අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත සාක්ෂි දරයි.
- පෙන්තකෝස්ත දිනදී පළමු දේශනාව කලේ පේදුරුතුමා ය. එදින 3000 ක් දෙන කිතු දහම වැළඳ ගෙන ඇත.
- ජුදාස්ගෙන් හිස්වූ ස්ථානයට මතියස් තෝරා ගැනීමේ දී නායකත්වය ගත්තේ ද පේදුරුතුමා ය.
- උපස්ථායකයින් තෝරා ගැනීමේ දී ඒ සඳහා පළමුව යොමු කලේ පේදුරු තුමාට ය.
- ජෙරුසලෙම් මන්ත්‍රණ සභාවේදී චර්මඡේදන ප්‍රශ්නය නිරාකරණය කලේ පේදුරුතුමාගේ නායකත්වය යටතේය.
- සුඳර්ශන දොරටුව අසලදී කොර මිනිසා සුව කලේ පේදුරුතුමා ය.
- මේ නායකත්වය පසුකාලයකදී රෝමයේ රාජගුරු පදවිය දක්වා වර්ධනය විය.

කිතුනු ජනපද ව්‍යාප්ත වනවිට විශ්වාසකයන්ගේ සංඛ්‍යාව ද වැඩිවිය. එම නිසා මෙම ජනපද නිසි ලෙස පවත්වා ගෙන යාමට නම පාලක පිරිසක් ද අවශ්‍ය විය. එම නිසා අපෝස්තුළුවරු තමන් පිහිටෙවූ කිතුනු ජනපද වලට වැඩිහිටියන් නමින් පිරිසක් පත් කළහ. (ප්‍රෙස්බිටරෝයි) ඒ හැර ප්‍රධානීන් යනුවෙන් තව කොටසක් විය.(එපිස්කොපෙයි) ඔවුන් ක්‍රියා කලේ අපොස්තුළුවරුන්ගේ නාමයෙනි.

මෙසේ අපෝස්තුළුවරුන්ගේ දූත සේවාව සියළු ජාතීන් වෙත ගෙන යද්දී මේ ධර්මය පිළිගත් සෙනඟ එක් වී නව ජීවිත ක්‍රමයක් ආරම්භ කළහ. (ක්‍රියා 2 පරිච්ඡේදය බලන්න) මේ කාලය වනවිට කිතු දහම වැළඳ ගත් ජුදෙව් ජනතාව දෙකොටසක් විය.

හෙබ්‍රසිය යුදෙව්වෝ - ඇරමයික් භාෂාව කථා කරන ජුදා සම්ප්‍රදායන් අකුරටම පිළිපදින අය.
හෙලනිස්ත යුදෙව්වෝ - ග්‍රීක් භාෂාවෙන් කථා කරන ග්‍රීක් සංස්කෘතියට අනුව හැදුනු වැඩුන පිරිස.
මේ අතර ක්‍රිස්තියානිය වැළඳ ගත් අන්‍ය ජාතික පිරිස ද බොහෝ විය.

**මේ අවධිය වන විට පස්තිනයේ දේශපාලන පසුබිම**

බටහිර අත්ලාන්තික් සාගරයේ සිට නැගෙනහිරෙන් යුප්‍රටීස් දක්වාත් උතුරෙන් බ්‍රිතාන්‍ය ඇතුළු රයින් ඩැනියුබ් ගංගා දක්වාත් දකුණෙන් උතුරු අප්‍රිකානු රාජ්‍යයක් දක්වාත් විශාල භූමි ප්‍රදේශයක් රෝම අධිරාජයාට අයත් විය. මේ මහා භූමි ප්‍රදේශයේ විවිධ ජාතීන් විවිධ භාෂා, විවිධ සංස්කෘතීන්ට අයත් ජනතාව පාලනය වූයේ රෝම අධිරාජ්‍යයා යටතේ ය. ඔහු අග්‍රවිනිශ්චය කාරයා ය. අග්‍රසේනාධිපතියා ය. දිව්‍යමය පූජකයා ය. මේ අධිරාජ්‍යය විවිධ කොටස් වලට බෙදා ප්‍රදේශාධිපති හා යුව රජුන් යටතේ පාලනය විය. අධිරාජ්‍යයා දේවත්වයෙන් පුද සත්කාර ලැබුවෙකි.
**මුල් යුගයේ දී අපොස්තුළුවරුන්ට තම දූත සේවාව ව්‍යාප්ත කිරීමට අධිරාජ්‍යය පුරා පහසුකම් තිබුණි.**

**රෝම අධිරාජ්‍යයේ පාලන ක්‍රමය** -
අධිරාජ්‍යය පුරා පැතිර පැවතියේ එකම පාලන තන්ත්‍රයකි. රටකින් රටකට යාමට අවසර අවශ්‍ය නොවීය. දියුණු වූ ගොඩබිම් හා මුහුදු මාර්ග විය. මේ සාමකාමී වාතාවරණය නිසා සභාව ද නිදහසේ පැතිරිණි.

**ග්‍රීක් සංස්කෘතියේ බලපෑම්**
මුළු ප්‍රදේශය පුරා ග්‍රීක් භාෂාව ව්‍යාප්තව තිබූ නිසා දහම් පණිවුඩය දේශනා කිරීමට දහම් දූතයිනට පහසුවිය.

**අධ්‍යාපන පීඨ නිසා**
රෝමයේ ඇතැන්ස්, අන්තියෝක්, ඇලෙක්සැන්ඩ්‍රියා යන අධ්‍යාපන පීඨ රෝම අධිරාජ්‍යයේ විය. බුද්ධිමත් තරුණ පිරිස් මේවායේ අධ්‍යාපනය ලැබූහ. ප්ලේටෝ, ඇරිස්ටෝටල්, සොක්‍රටීස්, මේ ආදීන්ගේ ගැඹුරු දර්ශන හැදෑරූහ. එම නිසා හෘදයේ සාක්ෂිය අනුව යහපත හා අයහපත තෝරා ගැනීමේ චින්තන බලවේගයක් ඇතිවිය.

**සමකාලීන දූෂිත ඇදහිලි**
රෝම අධිරාජ්‍යය පුරා විවිධ ඇදහිලි ක්‍රම විය. ඒවා දූෂිත වත්පිළිවෙත් වලින් ගහණ විය. දේවාල දුෂ්චරිතයේ ආකර විය. බුද්ධිමත් ජනතාව ආගම මුවාවෙන් කරන මෙවැනි දෑ ප්‍රතික්ෂේප කළ අතර නව දහමක අවශ්‍යතාවය පෙනුණි. ඒ අඩුවම කිතු දහමින් පිරිමැසී ගියේය.

**රෝම අධිරාජ්‍ය පුරා විසිරී සිටි ජුදා ජනතාව**
අධිරාජ්‍යය පුරා විවිධ ව්‍යාපාරික කටයුතු කලේ ජුදා ජාතිකයෝය. ඔවුහු ස්වකීය දහම එනම් දිව්‍යාවලිය ඒ රටවලදී ක්‍රියාත්මක කළහ. එම නිසා මෙසියානු චින්තනය කල්වේලා ඇතිව රෝම අධිරාජ්‍යය පුරා ව්‍යාප්ත විය.

පළමු සියවස අවසන් වන විට (අපෝස්තලික යුගය) විවිධ පීඩන සභාවට විරුද්ධව පැන නැග තිබුණි. සභාවේ ව්‍යාප්තිය හේතු කොට ගෙන විවිධ ගැටළු මතුවිය ඒවානම්,

**ජුදා ක්‍රිස්තියානිවරුන් අතර ගැටුම්**
ඇරමයික් භාෂාව කථා කළ ජුදා ක්‍රිස්තියානින් හා ග්‍රීක් භාෂාව කථා කළ හෙලනිස්ත ජුදා ක්‍රිස්තියානින් අතර භේද හා ගැටුම් ඇති විය. මෙම හේතුවෙන් හෙලනිස්ත ජුදා ක්‍රිස්තියානිවරුන්ගේ වැන්දඹුවන්ට සහනාධාර ලැබීම සම්බන්ධ ගැටළුවක් ඇතිවිය. මෙය නිරාකරණය කිරීම සඳහා උපස්ථායකන් පත් කරන ලදි. (ක්‍රියා **6/1-6)**

**සභාවේ ජුදා ක්‍රිස්තියානින් හා අන්‍ය ජාතික ක්‍රිස්තියානි අතර ද ගැටුම්**
මෙයට හේතුවූයේ අන්‍ය ජාතික ක්‍රිස්තියානින් ජුදා ක්‍රිස්තියානින් මෙන් මෝසෙස්ගේ ව්‍යවස්ථාව ඇතුළු වත්පිළිවෙත් (චර්මඡේදනය) පිළිපැදිය යුතු ද නැද්ද යන්නයි. මේවා පිළිපැදීම අනවශ්‍ය බව පාවුළුතුමා තරයේ ප්‍රකාශ කළහ. එහි ප්‍රතිඵලය වූයේ ජෙරුසලෙම් මන්ත්‍රණ සභාවයි. (ක්‍රියා **15)** මේ ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා විශේෂ නියෝග හතර අන්‍ය ජාතීන් වෙත නිකුත් කළහ.

- අන්‍ය දෙවි වරුන්ට පුදන ලද පිදේනි අනුභවයෙන් වැළකීම.
- කාමමිථ්‍යාචාරයෙන් වැළකීම.
- බොටුව මිරිකා මැරූ සතුන් අනුභවයෙන් වැළකීම.

(මේවා සදහට ම වලංගු නියෝග නොවේ)

**සභාවේ ව්‍යාප්තිය හේතුකොට ගෙන පැණ නැගුණු අතිත් ව්‍යසනය නම් ආගම් පීඩනයි**
- රෝම ආගම් පීඩනයට මැදිවූ සභාව

**අපෝස්තලික අවධිය**
අපෝස්තලික අවධිය හෙවත් පළමු සියවස අවසන් වනවිට ක්‍රිස්තු ශාසනය රෝම අධිරාජ්‍යය තුළ ස්ථාවර ලෙස සංවිධානය වූ බලවේගයක් බවට පත්විය. රදගුරුතුමෙකුගේ මූලිකත්වය යටතේ පූජකවරු හා තේවාචාරීන් විසින් මෙහෙයවනු ලබන කිතුනු ජනපද රෝම අධිරාජ්‍යය පුරා විය.

මූලස්ථානය රෝමයේ පිහිටා ඇති බව පිළිගැනුණි. එම නිසා මෙම දහමට රෝමානු කතෝලික යන නම භාවිතා විය. මෙවැනි සතුටුදායක පසුබිමක් තිබුණත් මුල් කිතුනු ශ්‍රාවකයන්ගේ ප්‍රයත්නය සාර්ථක කර ගැනීමට අභියෝග වලට මුහුණ දීමට ද සිදුවිය. ඒවා පැති කිහිපයකින් එල්ල විය.

### යුදා ආගමික නායකයන්ගේ විරෝධය

උත්තම පූජකවරු හා සදිසිවරු පේදුරු හා ජුවාම් සිරභාරයට ගෙන මරණීය තර්ජන එල්ල කළහ. ස්තේපන්ව ගල්ගසා මරා දැමූහ. සාවුල් නමැත්තා ක්‍රිස්තියානින් සිරභාරයට ගත්හ.

### ජෙරුසලෙමේ රෝම ආණ්ඩුකාරයාගේ විරෝධය

- මොහු ජාකොබ් තුමා හිස ගසා මරා දැමී ය. පේදුරුතුමන්ව සිරභාරයට ගත්තේ ය.
- රෝම අධිරාජ්‍යයෙන් ද විරෝධ එල්ල විය.

### රෝම අධිරාජ්‍යයා ක්‍රිස්තියානින්ට පීඩා කිරීමට හේතු

- ක්‍රිස්තියානිහු රජයේ සේවය හා හමුදාවේ සේවය ප්‍රතික්ෂේප කිරීම
- රෝම අධිරාජ්‍යයාව දේවත්වයෙන් පිදීමටත්, ඔහුගේ නමින් දිවුරීමත් ප්‍රතික්ෂේප කිරීම
- රෝම දෙවි දේවතාවන්ට මල් පහන් පුද නොකිරීම
- ක්‍රිස්තියානින් අප්‍රසිද්ධියේ පවත්වන වත්පිළිවෙත්, සදාචාර විරෝධී බවත්, ඔවුන් කුමන්ත්‍රණකාරී පිරිසක් බවත් යුදා නායකයන් අධිරාජ්‍යයාට එත්තු ගැන්වීම
- දේව රාජ්‍ය ගැන කථා කරන නිසා අධිරාජ්‍ය විරෝධීන් බව සිතීම
  මේ හේතූන් නිසා අධිරාජයා විසින් ක්‍රිස්තියානින්ට විරුද්ධව තහනම් නියෝග කිපයක් පණවන ලදී.
- ක්‍රිස්තු ධර්මය රෝම අධිරාජ්‍ය තුළ තහනම් ඇදහිල්ලකි.
- ක්‍රිස්තු ධර්මය අතහරින බවට දිවුරුම් පෙත්සමකට අත්සන් තැබිය යුතුය.
- ක්‍රිස්තු ධර්මය අත් නොහරින අයව හිරභාරයට ගැනිම, දේපල අත්සතු කිරීම, වහල්කමට විකිණීම රටින් පිටුවහල් කිරීම හෝ මරණය.
- මෙවැනි පදනමක් යටතේ ක්‍රිස්තියානිහු ශත වර්ෂ 3 ක් රෝම අධිරාජ්‍ය තුළ බලවත් පීඩාවකට පත් වූහ. අගරජවරුන් 10 දෙනෙකු යටතේ පැවති මේ දරුණු පීඩන අතර පසුකාලීනව සාමකාමීව ජීවත්වීමට දුන් රජවරු කිප දෙනෙක්ද විය.

## ඇතිවූ පීඩා

### පළමු පීඩනය

නිරෝ අගරජු යටතේ ක්‍රි.ව. 64-68 දක්වා විය. ඔහු රෝමය ගිනි තබා එය ක්‍රිස්තියානින් පිට පවරමින් චෝදනා කිරීම නිසා, ජනතාව ද ක්‍රිස්තු විරෝධීන් විය. ක්‍රිස්තු භක්තිකයන් විශාල ගණනක් ක්‍රීඩා භූමියක් තුළ සතුන්ට ගොදුරු කළහ. සමහරු ටයිබර් නදියේ ගිල්වා මැරූහ. තව සමහරුන්ට තාර ආලේප කර ගිනි තබා පහන් කණුමෙන් නෘත්‍ය ශාලා ආලෝකමත් කිරීමට යොදවා ගත්තේ ය. මේ පීඩනයේදී පේදුරුතුමාව කුරුසේ ඇණ ගසා මරා දැමූහ. පාවුළුතුමාව හිස ගසා මරා දමන ලදී. මෙම පීඩනය රෝමයට පමණක් සීමා විය. එසේ ම එය ක්‍රි.ව. 68 දී නිරෝගේ සියදිවි නසා ගැනීමත් සමඟම අවසන් විණ. ක්‍රි.ව. 69-70 දක්වා වෙස්පේෂන් අධිරජ සමය හිරිහැර නොමැති යුගයක් විය. මොහුගේ කාලයේ දී ඔහුගේ පුත්‍ර ටයිටස් ජෙරුසලෙම ගිනි තබා දේව මාලිගාව කොල්ලකා විනාශ කළේ ය.

### දෙවන පීඩනය

ක්‍රි.ව. 81-96 දක්වා දොමිසියානු අගරජයේ කාලයේදිද පීඩන ඇතිවිය. ශුද්ධවූ ජුවාම් තුමා උතුරණ තෙල් කටාරමකට බහාලන ලදී. එහෙත් ඔහුට අනතුරක් නොවිය. ඉන්පසු සිරකරුවෙකු වශයෙන් පැට්මොස් දිවයිනට පිටුවහල් කරන ලදී. අගරජුගේ සොහොයුරියවූ ජ්ලේවියාගේ ස්වාමියාවූ ජ්ලේවියස් ක්ලෙමන්ස් හිස ගසා මරා ජ්ලේවියාවද පිටුවහල් කලේ මෙම ක්‍රිස්තියානි පීඩනය යටතේ ය.

### තුන්වන පීඩනය

**98-117 ට්‍රාජන් අගරජ** - මෙම කාලය විධිමත්ව පීඩන ඇතිවූ කාලයක් නොවුවත්, සමහර ප්‍රාන්ත ආණ්ඩුකාරයන් ක්‍රිස්තු විරෝධීන් වූ හෙයින් ට්‍රාජන්ගේ අනුදැනුම අනුව බොහෝ ක්‍රිස්තියානින් මරණු ලැබූහ. මේ පීඩනයත් අන්තියෝකයේ ඉග්නේෂස්තුමා ජෙරුසලෙම් රාජගුරු ප්‍රසාදි සිමියෝන්තුමා, රෝමයේ ක්ලෙමන්ට් පාප්තුමා හා ටෙලස්පෝරස් ද ඩොමිටිල්ලා තුමිය ද ප්‍රාණ පරිත්‍යාගිවිය. ඉන්පසු පැමිණි හේඩ්‍රියන් අගරජ ක්‍රිස්තියානින්ට ආරක්ෂාව සලසා දුන්හ.

### හතරවන පීඩනය

මෙය ඇතිවූයේ මාර්කුස් අවුරේලියස්ගේ කාලයේදී ය. ක්‍රි.ව. 161-180 අතර ය. මේ කාලයේ අධිරාජ්‍යයේ සිදුවූ ජලගැල්ම වසංගත ආක්‍රමණ සියල්ල ක්‍රිස්තියානින් නිසා සිදුවූ බව කියමින් උග්‍රවූ පීඩනයක් ඇති කළහ. පොලිකාප් තුමාව ද ක්‍රි.ව. 163 දී ක්‍රිස්තියානි දාර්ශනිකයෙක්වූ ජස්ටින් තුමාව ද රෝමයේදී ප්‍රාණ පරිත්‍යාගිවරුන් ලෙස මරණයට පත් කරන ලද්දේ ය.

### පස්වන පීඩනය

200-211 දක්වාය. සෙප්ටිමස් සෙවරස් ශුද්ධවූ ඉරනේවුස්තුමා ද කාර්තේජ්හි විසූ පෙර්පේතුවා පෙලිසිතාස් හා සිසිලියා කන්‍යාව ද ප්‍රාණ පරිත්‍යාගී වූහ. එසේම ඔරිගන්ගේ පියාවූ ඇලෙක්සැන්ඩ්‍රියාවේ විසූ ලියෝද මෙම පීඩනයට හසුවිය.

**හයවන පීඩනය**
මැක්සිමියානු අගරජුගේ කාලයේදිය. ක්‍රි.ව. **235-238** අතර ය. මෙහිදී මරණයට පත්වුණේ ඥාන ගෝපලයන් ය. පාප්තුමන්ලාව වහලුන් මෙන් පතල් වලට යවන ලදි. මෙම කාලයේ දී පොන්ටේනියස් පාප්තුමන්ද, අන්ත පාප් කෙනෙකු ලෙස පත්වූ හිපොලිටස්ද මරුමුවට පත් කරන ලදි.

**හත්වන පීඩනය**
240 - 251 මෙම පීඩනය ද වැඩියෙන් යොමු කලේ රාජගුරු ප්‍රසාදීන්ට හා පූජකවරුන්ට ය. එය ඩේසියස් අගරජුගේ රාජ්‍ය සමය විය. ෆේබියන් පාප්තුමා, අගතා මුනිවරිය, ඇලෙක්සැන්ඩර් රාජගුරුතුමා, ඔරිගන්තුමා ඇතුළු ස්මරණ අන්තියෝක් හා ජෙරුසලෙම්හි රදගුරුවරුන් ද මරුමුවට පත්වූහ. ක්‍රි.ව. 251 දී ඩේසියස්ව සටනකින් මරා දැමූ පසු වාසනාවකට මෙන් මෙම පීඩනය අවසන් විය.

**අටවන පීඩනය**
**257 - 260** වැලේරියානු අගරජ විසින් ක්‍රිස්තියානි පොත් පුළුස්සා දැමූහ. දෙව් මැඳුර විනාශ කළහ සභාව සතු දේවල් රාජසන්තක කළහ. රාජගුරු ප්‍රසාදීන් හා පූජකයින් හා තේවාචාරීන් සිරගත කළහ. එසේම ආඥාවක් පණවමින් රදගුරුවරුන් පූජකයන් හා තේවාචාරීන් මරණීය වේදනා තුළ රෝම දෙව් දේවතාවන්ට පූජා කළ යුතු බවට නියෝග කළහ. දෙවන සික්ස්ටස් පාප්තුමා ද ඔහුගේ තේවාචාරියාවූ ලෝරන්ස් ද ශුද්ධ වූ සිප්‍රියන් තුමා අප්‍රිකාවේ දී ද සිරිල් නැමැති බාලයා ද ප්‍රාණ පරිත්‍යාගී වූහ. ක්‍රි.ව. **259** දී පර්සියානුවන් විසින් වැලෙරියන් රජුව සිරභාරයට ගෙන මරුමුවට පත් කළ නිසා ඔහුගේ පුත් ගල්ලිනුස් එතැනට පත්වූයේය. එසැනින්ම පීඩනය අවසන් කර රාජ සන්තක කළ සභා දේපල නැවත දුන්නේ ය.

**නමවන පීඩනය**
**274-280** කිතුනුවන්ට විරුද්ධව දරුණු පීඩා ඇති විය. රෝමයේ රාජගුරු පිලික්ස් තුමා, පැරිස්හි රාජගුරු ඩෙනිස් තුමා දිවි පිදූ අතර බොහෝ ක්‍රිස්තියානින් වන මෘගයන්ට ගොදුරු කළහ.

**දහවන පීඩනය**
දියෝකෙල්සියානු අගරජ විසින් **303 - 305** ඇති කළ ඉතිහාසයේ දරුණු පීඩනයකි. මෙකල වධකයිනගේ ආයුධ මොටවුයේ යයි ඉතිහාසයේ සඳහන් වන්නේ මේ පීඩනයේ දීය. මොහුගේ කාලයේදී ක්‍රිස්තියානින්ට පීඩා කරන්නට ආඥාවන් තුනක් නිකුත් කෙරිණි.

**1 ආඥාව යටතේ**
- ක්‍රිස්තියානින්ට රජයේ හෝ මහජනයා පිළිබඳ කටයුතු භාර නිල තනතුරු තහනම් කෙරිණ.
- සභාව සතු දේපල හා ශුද්ධ වූ පොත් රාජ සාන්තක කෙරිණි.

**2 ආඥාව යටතේ**
- සියළුම පූජකයන් අත් අඩංගුවට ගැනීමේ නියෝගය ඉහත කී සියල්ලට එක් කෙරිණ.

**3. ආඥාව යටතේ**
- ඕනෑම කිතුනුවෙක් දේවතා පිළිම වලට පූජා ඔප්පු කිරීම ප්‍රතික්ෂේප කරන්නේද ඔවුන්ව මරණයට පත් කරන්නට නියම කෙරිණ.

ශුද්ධවූ සෙබස්තියන් තුමා, ලූසියා කන්‍යාව, ඇග්නස් කන්‍යාව, ශුද්ධවූ මොරිස් තුමා, මාර්සිලස් පාප්තුමා රාජගුරු ජනවාරිස්තුමා, එම්ලාලියා ජුස්තින් හා ප්‍රන්ක්‍රාසි යන අය දිවි පිදූහ. මොහු විසින් පණවන ලද, දරුණු වද වේදනා අතර, ඇස ඉගිල්ලීම, පාද කියත් වලින් කපා දැමීම, රත්වූ යකඩ පුටුවල බැඳ පිළිස්සීම වන මෘගයන්ට බිලිදීම හා සාගිනිව තබා මැරීම යන දේ ඇතුලත් විණි.

මෙම පීඩනවලින් සාන්ත සභාව විනාශ නොවී ය. ප්‍රාණ පරිත්‍යාගී රුධිරයෙන් කිතුනු කෙත සාරවත් විය. කිතු දහම අභිරහසම්‍ය ආකාරයයෙන් පැතිර ගියේ ය. කාන්තාරවල දැඩි තපස් ජීවිත ව්‍යාප්ත විය. එයින් පසු රෝම අධිරාජ්‍යයා වශයෙන් පත්වූයේ කොන්ස්තන්තීනු අගරජ ය. ඔහු ක්‍රි.ව. **313** දී මිලාන් ආඥාව මගින් ක්‍රිස්තු භක්තිකයන්ට නිදහස දානය කරන ලදි.

**මිලාන් ආඥාව මගින් කිතුනුවන්ට ලැබූ සහන රුසකි. (313)**
- නිරෝගේ පටන් ශත වර්ෂ **3** ක් පැවති තහනම් නියෝග ඉවත් කරන ලදි.
- කිතු දහම නිදහසේ ඇදහීමට ඉඩ සැලසීම.
- අධිරාජ්‍ය පුරා දහම පැතිරවීමට ධර්මදූතයන් යැවීමේ නිදහස
- ශ්‍රී කුරුසිය ගෞරවාභිමානයට පත්විය.
- දේවස්ථාන ඉදි කිරීමට නිදහස ලැබුණි.
- රෝම ක්‍රීඩාංගනයේ තිබූ පේදුරුතුමාගේ දෙව් මැදුර වඩා අලංකාර දෙව් මැඳුරක් ලෙස රජතුමා විසින් සාදන ලදි.
- අගරජතුමාගේ ලතරානු මාළිගය පාප් වහන්සේගේ පදිංචියට පවරන ලදි.

- අගරජතුමාගේ මැණියන් විසින් බෙත්ලෙහෙම් දෙව් මැඳුරු **3** ක් ගොඩනගන දි. මෙතැන් සිට සභාවේ නිදහස් යුගයක් උදාවිය.

සභාව සිසුයෙන් ව්‍යාප්ත වෙද්දි අභ්‍යන්තර වශයෙන් ද පීඩන වලට මුහුණ දීමට සිදුවිය. එය සභාව තුළින්ම ආ අභියෝගයක් විය. විශේෂයෙන් රදගුරුවරු, පූජකවරු, තාපසවරු මේවායේ මූලිකත්වය දැරූහ. ඒවා සභාවේ අභ්‍යන්තර අර්බුද හෙවත් වේද භේද වශයෙන් හඳුන්වයි. යුග කිපයක් තුළ විවිධාකාරව මේවා ඇතිවූණි.

ඒවා සමහරක් නම්;

- නොස්ටික් වාදය
- නෙස්ටෝරියන් වාදය
- ඒරියන් වේද භේදය
- එවුටිකියන් වේද භේදය
- මැනිකි වාදය
- මොනතලිස්ත වාදය

මේ අය අපෝස්තුළුවරුන්ගේ ඉගැන්වීමේ සිට පැවත එන සභාවේ වේද සත්‍යතාවයකට විරුද්ධව විවිධ මත ප්‍රකාශ කළහ. පොදු වශයෙන් ඒ මත මෙසේ සඳහන් කළ හැක.

- ලෝකය මැවීම.
- ක්‍රිස්තුන් වහන්සේගේ ගැලවීමේ ක්‍රියාවලිය (ක්‍රිස්තුන් වහන්සේගේ ද්විත්ව ස්වාභාවය)
- මරියතුමිගේ දේව මාතෘත්වය
- මරණින් මතු ජීවිතය
- දේව දූතයන් ගැන

නමුත් විවිධ වේද භේදිකයින් තමන්ට සීමාවූ විවිධ මත ඉදිරිපත් කර ඇත. විශේෂයෙන් ග්‍රීක් දර්ශන වාදය පදනම් කර ගෙන මේවා ගොඩනගා ඇති බව පෙනි යයි.

**මේ සඳහා සභාව ගත් ක්‍රියා මාර්ග**

- තරාතිරම් නොබලා වේද භේදකයින් සභාවෙන් පිට දැමූහ.
- විවිධ මන්ත්‍රණ සභා කැඳවා මෙම මත ප්‍රතික්ෂේප කළහ.
- තර්කවේදින් විසින් ග්‍රීක දර්ශන වාදය අනුව තර්කානුකූලව ඉදිරිපත් කළ සාහිත්‍ය කෘතින් මගින් වේදභේදික මතවලට පිළිතුරු සැපයූහ.

කෙසේ වෙතත් වෙන වේදභේද මත ශත වර්ෂ කිපයක් පුරා පිළිකාවක් මෙන් ගමන් කළ බව සභා ඉතිහාසය සාක්ෂි දරයි.

## සභා පියවරු

සභා පියරු වශයෙන් හැඳින්වෙන්නේ **5** වන සියවස දක්වා ධර්මය පහදා දීම සඳහා පොත් සකස් කළ ධර්ම දේශනා කළ ශුද්ධවන්ත ජීවිත ගත කළ අය වෙති. ඔවුන් අතරෙන් සමහර අය ග්‍රීක භාෂාවෙන්ද, අන් සමහර අය ලතින් භාෂාවෙන් ද, ඉතා ශ්‍රේෂ්ඨ ග්‍රන්ථ රැසක් සකස් කළහ. ඔවුන් අතුරින්.
ශු. ජෙස්ටින් (ග්‍රීක්) ශු. අතනාසියුස් (ග්‍රීක්) ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් (ග්‍රීක්) ශු. ජෙරොම් (ලතින්) ශු. අගුස්තිනු (ලතින්) යන අය ඉතා ප්‍රකට ය.

### ශු. ජස්ටින් තුමා

ක්‍රි.ව. **100 - 165** රෝමයේ විසූ ප්‍රධාන අපොලොජිස්ත ලේඛකයෙකි. තත්කාලීන සභාව ගැන බොහෝදේ එතුමාගේ පොත්පත් වලින් දැනගත හැකි ය. (ජනවන්දනාව සහා පීඩන) එතුමා වෘත්තියෙන්ම දාර්ශනිකයෙකි. අධිරාජ්‍යයේ නොයෙකුත් තැන්වල ඇවිද ස්ටොයික් ඇරිස්ටෝනටලීය යනාදි දර්ශනයන් ක්‍රමයක් හදාරා තර්කානුකූලව කිස්තු ධර්මය පිළිබඳ කරුණු පහදා දෙමින් අගනා පොත් **2** ක් ලිව්වේ ය. 'අපොලොජියා` යන පොත මාර්කුස් අවුරේලියුස් යන අධිරාජ්‍යයාට පිරිනැමී ය. ක්‍රි.ව. 165 දී ප්‍රාණ පරිත්‍යාගී කිරුළ දිනා ගත්තේ ය.

### ශු. අතනාසියුස් තුමා

ක්‍රි.ව. **295 - 373** ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරුතුමා වූ මෙතුමා ඒරියන්ගේ වේද භේදයට විරුද්ධව සටන් කළ පුරෝගාමියා විය. පසු කලකදී ඒරියන්වාදය හිස එසවූ අවස්ථාවේදී සාන්ත අතනාසියුස් තුමන් ඇලක්සැන්ඩ්‍රියාවෙන් පහ කරන ලදි. **373** දී ඇලෙක්සැන්ඩ්‍රියාවේදී ම ස්වර්ගස්ථ විය.

### ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමා

ඇලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරුතුමා වශයෙන් නෙස්ටෝරියන්ගේ වේද භේදයට එරෙහිව සටන් වැදිය. ඔහුගේ වරද පෙන්වා දී රෝමයේ පාප්තුමාට ද දැන්විය. නෙස්ටෝරියන් කියා සිටියේ මරියතුමිය ක්‍රිස්තුන් වහන්සේගේ මැණියන් බවත් (ක්‍රිස්ටොටොකොස්) දේව මැණියන් (තියොටොකොස්) නොවන බවත් ය. එහෙත් ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමා දේව මාතෘත්වය රැකදීම සඳහා **431** දී පවත්වන ලද එපිසයේ මන්ත්‍රණ සභාවේ මූලාසනය ගෙන කටයුතු කර සභාවේ සත්‍ය ධර්මය තහවුරු කිරීමට කටයුතු කළේය.

### ශු. ජෙරොම් තුමා

ක්‍රි.ව. **340 - 419** එතුමා ලතින් සහ ග්‍රීක් භාෂාවේ නිපුණත්වයක් දැරිය. 1 වන ඩැමිසස් පාප්තුමන් විසින් ලතින් බයිබලය නැවත පරිවර්තනය කිරීම පවරන ලදුව පලස්තිනයට පැමිණ බෙත්ලෙහෙමේ ජේසුතුමන් උපන් ස්ථානයේ ඇති දෙව් මැඳුරට වැදි විසි වසරක් එහි සිට එම කටයුත්ත නිම කළේ ය. එම සංස්කරණය වල්ගේට් බයිබලය ලෙස හැඳින්වේ. එතුමා අතින් කෙරුන වෙනත් බොහෝ පොත්පත් ලිපි දේශනා යනාදිය සහ තවුසන්ගේ ජීවිත කතා රැසක් ඇති බව සඳහන් කළ හැකි ය.

**සාන්ත අගුස්තිනු තුමා**

ක්‍රි.ව **354- 430** උතුරු අප්‍රිකාවේ තගස්තේ (වත්මන් ඇල්ජීරියාවේ) නම් ස්ථානයේ උපත ලැබූ එතුමා ව්‍යාක්ත කථිකයෙකි. ප්‍රධාන ලේඛකයෙකි. පඬිවරයෙකි. තරුණ වයස විනෝදයෙන් ගත කළ එතුමා **387** දී මිලාන් නගරයේදී සාන්ත අම්බ්‍රෝස්තුමා අතින් බෞතිස්ම ස්නාපනය ලැබී ය. **396** සිට අප්‍රිකාවේ හිප්පෝ නගරයේ රදගුරු වශයෙන් පත්විය. විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ දේශනා පොත් ලතින් බසින් පළ කර ඇත. තමන්ගේ ආත්ම චරිතය පාපොච්චාරණය යන ග්‍රන්ථය ශ්‍රේෂ්ඨ ගණයේ පොතකි. එතුමා සභාවේ ප්‍රධාන චින්තකයෙක්ද වේද පඬිවරයෙක් ද විය.

## කිතුනු ලේඛකයෝ

නිදහස් යුගයේ ඇතිවූ වාද විවාද හේතු කොටගෙන ක්‍රිස්තියානි ධර්මධරයන් රාශියකගේ කෘතින් බිහිවිය. කතෝලික සාහිත්‍යයේ ස්වර්ණමය යුගය (ක්‍රි.ව. **150 - 550**) මෙය විය. ලේඛකයන්ගෙන් බොහෝ දෙනෙක් සභා පිතෘතන් මෙන්ද හැඳින්වේ.

**ඔරිජන්**

ක්‍රි.ව. **185- 254** ඇලෙක්සැන්ඩ්‍රියාවේ දහම් පියයේ නායකයාව සිට පසුව සෙසරියාවේ දහම් පියයේද නායකයා විය. ඩේසියුස්ගේ පීඩනයේදී බොහෝ පීඩා විඳිය.

**ප්‍රධාන කෘතින්**

ශු. බයිබලයේ අනුවාද හයක් එකට සකස් කළේ ය. (හෙක්සඅප්ලා) බයිබල් අටුවාව, දේව ධර්මය පිළිබඳව අත්පොතක් වන දේප්‍රින්චිපියස් කොටස් හතරකින් යුක්තය.ක්‍රිස්තියානි ධර්මයේ ප්‍රධාන ඉගැන්වීම එහි අතුළත්විය. ක්‍රිස්තියානි භක්තිය වර්ධනය කිරීම සඳහා යාච්ඤාව ගැන පොතක් ද රචනා කළේය. අවසානය දක්වා ගිහියෙකුවූ ඔහුට දේශනා කිරීමට අවසර ලැබී තිබිණි. ඔහුගේ දේශනා පොතක් ද ප්‍රසිද්ධ කරන ලදි.

**ශුද්ධ වූ බැසිල්තුමා**

ක්‍රි.ව. **330-376** ඇලෙක්සැන්ඩ්‍රියාවේ ලේඛක පෙළපතට අයත් ඔරිජන් පඬිවරයාගේ ගෝලයන් තිදෙනෙක් වන සාන්ත බැසිල් සාන්ත ග්‍රෙගරි නිසියන්සන් ක්‍රි.ව. **33 - 390** සහ ග්‍රෙගරි නිස්සා **335 - 394** සුප්‍රසිද්ධ ලේඛකයෝ වූහ. මෙම තිදෙනා කැපඩෝසියාවේ පිතෘ වරුන් සැටියට නම් කෙරේ. තිදෙනාම ශු. ත්‍රිත්වය ගැන ධර්ම ශාස්ත්‍රය අංග සම්පූර්ණ කිරීමෙහි ලා ප්‍රධාන තැනක් ගනී. ශු. බැසිල්තුමා තාපස ජීවිතය ගැන ලියූ ප්‍රධාන ලේඛකයෙකි. ටොරාලියා නමින් ගිහි ජීවිතය ගැන ලියූ පොත ද සුප්‍රසිද්ධය. ශු. බයිබලයට අටුවාවක් මෙන් ලියන ලද දේශනා 24ක් ද, එතුමාගේ පෞද්ගලික ලිපි 365 ක් ද ඇත්තේ ය. එතුමා තපස් අටුවාවක් මෙන් ලියන ලද දේශනා **24** ක් ද එතුමාගේ පෞද්ගලික ලිපි **365** ද ඇත්තේය. එතුමා තපස් ජීවිතයට ව්‍යවස්ථාවක්ද සකස් කර පොන්තස්හි තාපසාරාමයක් පිහිටෙව්වේය.

**ශු. ජොන් ක්‍රිසොස්තම්**

කලින් සඳහන් කර ඇති සහ පිතෘවරුන් හැර මෙහිදී අන්තියෝකයේ ලේඛකයන් අතර ශු. ජෝන් ක්‍රිසොස්තම් මුනි **(354-407)** සඳහන් කළ යුතුය. ස්වර්ණ මුඛය හෙවත් ක්‍රිසොස්තම් යන පටබැඳි නාමයෙන් හඳුන්වන ලදි. චතුර දේශකයෙකි.එමෙන්ම ලේඛකයෙකි. ශු. පාවුළුතුමාගේ ලිපි ගැන අටුවාවන්ද ලියා ඇත. "පූජකවරයා" නැමැති එතුමාගේ කෘතිය අද පවා මුද්‍රණය කරනු ලැබේ. ලිපි **236** පවතී. එඩිතර ඥානගෝපාලයෙකි. ඇන්ටියොක් නුවර රදගුරු වශයෙන් එව්ඩොක්සියා අග රැජින විසින් වැසියන් පෙළීම ගැන එතුමා විවේචනය කළ බැවින් හිර අඩස්සියේ සිට දැඩි දඬුවම් විඳීමෙන් මිය ගියේය.

## ජගත් මන්ත්‍රණ සභා වේද භේද

### ජගත් මන්ත්‍රණ සභාවක් යනු කුමක්ද ?

ජගත් මන්ත්‍රණ සභාවක් යනු රෝමයේ රදගුරුතුමන් සමඟ ලෝක රදගුරුතුමන්ලා සභාවේ උන්නතියට හා සභා ජීවිතයට එල්ලවන අවදානම් සහිත ප්‍රශ්න වලදී ධර්මය හෝ විනය පිළිබඳ නිල වශයෙන් නිවේදන හෝ ප්‍රකාශන නිකුත් කිරීමට එකමුතු වන්නා වූ සභාවයි. සභා ඉතිහාසය තුළ මෙවැනි මන්ත්‍රණ සභා 21 ක් පවත්වා ඇත.

### වේදභේද යනු කුමක්ද ?

### සභාවේ සම්ප්‍රදායික ඉගැන්වීම් වලට පටහැනි ඉගැන්වීම් ක්‍රමය

**ක්‍රි.ව. 325 - නිසියානු මන්ත්‍රණ සභාව**

කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයා විසින් කැඳවන ලදි. පළමුවන ජගත් මන්ත්‍රණ සභාව ඇලෙක්සැන්ඩ්‍රියාවේ පූජකයෙකු වූ ඒරියස් ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් නොවන බවත් පියාණන් විසින් මවන ලද මැවිලි අතරින් ප්‍රධානියා වන බවත් කියා සිටියේය. ඇලෙක්සැන්ඩ්‍රියා රදගුරු තැන්පත් අතනාසියුස් තුමා මීට තරයේ විරුද්ධ වීම හේතුවෙන් මහත් අරගලයක් රාජ්‍යය පුරා පැතිරිණි.

**ක්‍රි.ව. 381 - කොන්ස්තන්තිනුපල් 2 වන ජගත් මන්ත්‍රණ සභාව**

නිසියානු මන්ත්‍රණ සභාව අතනාසියුස් තුමාගේ අදහස් අනුමත කරමින් සත්‍ය විශ්වාසයේ ප්‍රකාශය ඉදිරිපත් කළේය. මෙම රැස්වීමට හේතුව ඒරියස් මිය ගොස් සිටියත් ඔහුගේ මතය නොමැරී සමහරුන් අතර පැවතිමයි. කොන්ස්තන්තිනෝපල්හි රදගුරු ග්‍රෙගරි නසියන්සෙන් තුමා මුලසුන හෙබවූ මේ සමුළුවේදී සම්මත වූ නිසියා විශ්වාස ලක්ෂණයට පහත දක්වෙන කොටස් එකතු කරන ලදි.

**ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳව**

- ජනිත වූ නමුත් මවනු නොලැබ පියාණන් සමඟ එකම භවත්වය ඇතිව උන්වහන්සේ වැඩ සිටින සේක.

**ශුද්ධාත්මයාණන් වහන්සේ පිළිබඳව**

- පියාණන් වහන්සේගේ හා පුත්‍රයාණන් වහන්සේගෙන් නික්මෙන සමිඳාණන් ද ජීව දායකයාණන්ද වූ ශුද්ධාත්මයාණන් කෙරෙහි ද විශ්වාස කරමි.
- උන්වහන්සේ පියාණන් ද පුත්‍රයාණන්ද සමඟ එකම වන්දනාවත් මහිමයත් ලබන සේක.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දේවීකය පිළිබඳවත් ශුද්ධාත්මයාණන් වහන්සේ පිළිබඳවත් විවිධ භේද මත පතුරුවා හරිලද හෙයින් සමුළුව ඉහත කී තීරණ ගනු ලැබී ය.

**ක්‍රි. ව. 431 එපිසියේ පවත්වන ලද තුන්වැනි ජගත් මන්ත්‍රණ සභාව**
නෙස්ටොරියස්ගේ වැරදි ඉගැන්වීම් ප්‍රතික්ෂේප කර මරියතුමිය දේව මාතාවන් වන බව ප්‍රකාශ කළේය. කොන්ස්තන්තිනෝපල්හි රදගුරු තැන්පත් නෙස්ටෝරියස් කියා සිටියේ මරියතුමිය ක්‍රිස්තුස් වහන්සේගේ මෑණියන් වන නමුත් දෙවියන් වහන්සෙගේ මෑණියන් නොවන බවයි. ඔහුට විරුද්ධව එම මන්ත්‍රණ සභාවේ කරුණු ඉදිරිපත් කලේ ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමා ය. (දෙවන තෙඩෝසියස් අධිරාජ්‍යයා යටතේ 408 - 450)

**ක්‍රි.ව 451 කැල්සිඩොන් හී පවත්වන ලද හතර වන ජගත් මන්ත්‍රණ සභාව**
එව්ටිකස් නැමැති තාපසයා ක්‍රිස්තුන් වහන්සේ තුළ ඇත්තේ එක ස්වභාවයක් බව ඉගැන්විය. මාෂියන් අධිරාජ්‍යය 450 - 457 මන්ත්‍රණ සභාවක් කැඳවා ලියෝ පාප්තුමා විසින් ඉදිරිපත් කරන ලද සත්‍ය ධර්මය පිළිගන්නට සැලැස්වී ය. එනම් ක්‍රිස්තුන් වහන්සේ එක පුද්ගලයෙක් වන නමුත් ස්වභාව දෙකක් ඇත්තෝ ය. එනම් දේව සහ මනුෂ්‍ය ස්වාභාවයයි.

**නිදහස් යුගය ක්‍රි.ව. 325 - 451**
313 රෝම අධිරාජ්‍යය පුරා පැතිර තිබූ ක්‍රිස්තියානි මර්දන පීඩන කොන්ස්තන්තිනු අධිරාජ්‍යයා විසින් අවසන් කරන ලදි. රෝමයේ මිල්වියන් පාලම අසළ හටගත් තීරණාත්මක සටනින් ඔහු ලැබූ ජයග්‍රහණය ක්‍රිස්තුන් වහන්සේගේ අනුග්‍රහයෙන් ලැබුණු ජයග්‍රහණයක් බව පිළිගෙන මිලාන් ආඥාව යන ප්‍රකාශනය මගින් කිතුනුවන්ට ආගමික නිදහස දානය කරන ලදි. අධිරාජ්‍ය හවුල් රාජ්‍යක් වූ බැවින් අපරදිග යුරෝපය භාරව සිටි ලිසිනයස් සමඟ මෙය එකඟත්වයකට මෙය පිළිබඳව පැමිණ මුළු අධිරාජ්‍ය පුරාම එය ක්‍රියාත්මක විය. ක්‍රි. ව. 324 ඔහු එකම අධිරාජ්‍යයා බවට පත්විය. ක්‍රි.ව. 380 දී 1 වන තියඩෝසියස් අධිරාජ්‍යයා විසින් ක්‍රිස්තියානි රාජ්‍ය ආගම බවට පත් කර සභාවේ ව්‍යාප්තිය පිළිබඳව වගකීම තමන් වෙත පවරා ගත්තේ ය.

## තාපස ජීවිතය

**තපස් ජීවිතය නම් කුමක්ද ?**
ලෝකයෙන් ඈත්වී යාච්ඤාවෙන් හා භාවනාවෙන් ද නොයෙකුත් දැඩි මර්දන ක්‍රියාවල යෙදෙමින් ද තනිව හෝ කණ්ඩායමක් වශයෙන් ගත කරන ජීවිතයකි. මෙසේ මුල් යුගයේදී ජනතාවගේ විශේෂ ප්‍රශංසාවට ලක් වූ කණ්ඩායම් දෙකකි.

- ප්‍රාණ පරිත්‍යාගිවරු
- තාපස තාපසිකාවෝ

**ආරම්භය**
මේ කාලයේ පැවති පීඩාවලින් පලා යැම හා හුදෙකලාව ජීවත්වීමේ ආශාව - අපරදිග තපස් ජීවිතයට පෙර පෙරදිග තපස් ජීවිත ආරම්භ විය. තිබ්ස් හී පාවුළුතුමා (ක්‍රි.ව. 255 - 341) ගුහා තුළ ජීවත් විය. එතුමාගේ ගෝලයා වූ අන්තෝනි තුමා (233 - 355) තාපස දිවියේ පුරෝගාමියා වශයෙන් සැලකේ.

325 දී ඊජිප්තුවේ තාපස තාපසිකාවන් 5000 ක් පමණ සිටි බව වාර්තා වේ. එහි සිව් වැනි සියවස අවසානයේ දී තපස් ජනපද තිබුණු බවද ස්ත්‍රී පක්ෂය පිරිමින්ට පෙර සමූහයක් වශයෙන් ජීවත්වූ බව ද වාර්තාවේ. සතර වන සියවසේදී ශුද්ධ වූ දේශයට ඇදී ගිය තවුසන් සිය ගණනින් සැදුණු ජනපද ජෙරුසලෙම බෙත්ලෙහෙම ආදී තැන්වල පැවති බව පෙනේ. (සාන්ත ජෙරොම් තුමා)

**විවිධ ක්‍රම**

- හුදකලාව ජීවත් වන නමුත් දිව්‍ය පූජවට එක තැනකට රැස්වීම.
- එක තාපාසාරාමක වෙසෙමින් එහි වටා නිවාස කිපයක් තුළ ජීවත්වීම.
- තාපසාරාමයේ සිටින මතාධිපතියාගේ පාලනයට යටත්වීම.
- නයිල් ගඟ අසල විසූ තවුසන් වෙළදාම වැනි ව්‍යාපාරවල ද යෙදුනහ.
- ශු. බැසිල්තුමා (329 - 379) අද දක්වා බලපන විනය මාලාවක් සකස් කලේ ය.

අපරදිග සභාවේ ද සතර වන සියවසේදී තපස් ජීවිතය පිළිබඳව පොත් ලිවීමෙන් සහ තාපසාරාම පිහිටුවීමෙන් තපස් ජීවිතය ව්‍යාප්ත කලේ ය. බටහිර ප්‍රදේශයේ පළමුවැනි තාපසාරාමය ප්‍රංශයේ ටුවර්ස්හි මර්තිනු තුමන් විසින් ආරම්භ කරන ලදි.

සභා නවෝදය සහ මිලේච්ඡ ජනයා සත්‍යාගමට හරවා ගැනීම සඳහා තාපසයන්ගෙන් ඉමහත් සේවයක් සිදුවිය. ඔවුන් අතරින් සභා නායකයන් පත් කර ගන්නා ලදි. ඔවුන් ජනතාව අතර ප්‍රාසාදය දිනා සිටිය හ. ඔවුන් මගින් ශිෂ්ටාචාරය හා සාහිත්‍යය ආරක්ෂා විය.

350


ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය

19, බැල්කම් පෙදෙස,

කොටා පාර, කොළඹ 08.

දුරකථනය : 011-2685459

ෆැක්ස් : 011-2665021

විද්‍යුත් තැපෑල: natcatbible@gmail.com


PRINTED BY ; NUWANA PRINTERS 032 20 56 888